# ගම නැගුම වැඩසටහන

## පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණය

පූර්ව වටය සඳහා තෝරාගත් ගම් දහය පදනම් කරගත් සමීක්ෂණයෙහි කෑගල්ල දිස්ත්‍රික්කයේ වත්තේගෙදර ගම සඳහා වූ වාර්තාව

එන්. එස්. බී. ඇපාකන්ද

2006 දෙසැම්බර්

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07

711.3
(SL)
හෙක්ට

2009/06 2010/04

## ස්තුතිය.

මෙම වාර්තාව "ගම නැගුම" වැඩසටහන යටතේ සංවර්ධනය කිරීම සඳහා තෝරා ගත් කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වත්තේගෙදර ග්‍රාමය පිළිබඳව සිදු කරන ලද පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණය ඇසුරින් සකස් කරන ලද්දකි.

මෙම සමීක්ෂණය සාර්ථක කරගැනීම සඳහා අත හිත දුන් සියලු දෙනාටම ස්තුතිය පුද කිරීම සඳහා මේ අවස්ථාව උදා කර ගනිමි. මෙවැනි සමාජ ආර්ථික සමීක්ෂණයක් කිරීම සඳහා අවශ්‍ය පදනම ගොඩනැංවීම වෙනුවෙන් අවශ්‍ය සියලු පහසුකම් සලසා දෙමින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ වී. කේ. නානායක්කාර මහතා විසින් සිදු කළ ප්‍රේරණය සමීක්ෂණයේ පූර්ණත්වයට මහත් පහසුවක් විය. එතුමාට මාගේ හෘදයාංගම ස්තුතිය පුද කර සිටිමි එමෙන්ම මෙම සමීක්ෂණයේ සාර්ථකත්වයට ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) ආචාර්ය ඩබ්ලිව්. බී. ජයසේන මහතා විසින් ලබා දුන් සහයෝගය ද කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී වත්තේගෙදර ග්‍රාමය පිළිබඳ මූලික තොරතුරු හා දත්තයන් සපයා ගැනීමේදීත්, ක්ෂේත්‍ර කටයුතු සංවිධානය කර ගැනීමේදීත් අරණායක ප්‍රාදේශීය ලේකම් ඩබ්. ඒ. ආර්. විමලසිරි මහතාගෙන් ලද සහයෝගය පිළිබඳව ඒ මහතාට විශේෂ ස්තුතිය පුදකරමි.

සමීක්ෂණය සිදු කරන අවස්ථාවේ දී වත්තේගෙදර ශ්‍රී සුදර්ශනාරාම විහාරවාසී ගරු පානගමුවේ උදිතධම්ම හිමියන් විසින් ලබා දුන් වඩාත් නිරවද්‍යතාවයෙන් යුත් තොරතුරු හා මග පෙන්වීම ද මහත් රුකුලක් වූ බව මෙහිදී ගෞරව පූර්වකව සිහිපත් කරමි.

වත්තේගෙදර ගම හා සම්බන්ධ විවිධ ආයතන නිලධාරීන් ද සමීක්ෂණයට අවශ්‍ය දත්ත ලබා දෙමින්, විවිධ අයුරින් සහයෝගය ලබා දුනි. ඒ පිළිබඳව වත්තේගෙදර ග්‍රාම නිලධාරී පී.ආර්. හේරත් බණ්ඩා මහතාටත්, උස්සාපිටිය ගොවිජන සංවර්ධන නිලධාරී එච්. පී. ධර්මරත්න මහතාටත්, වත්තේගෙදර කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර එච්. සෝමරත්න මහතාටත්, වත්තේගෙදර "ගම නැගුම" වැඩසටහනේ "ජනසභාව" සමිතියේ සභාපතිත්වය දරණ කේ.ඒ.බී. කොස්වත්ත මහතාටත්, සමෘද්ධි කළමනාකරණ කාර්යාලයේ නිලධාරී මහත්ම මහත්මීන්ටත් මාගේ ස්තුතිය පුද කරමි.

සමීක්ෂණයේ දී ක්ෂේත්‍ර දත්ත රැස් කර ගැනීමේ කාර්යය ඉතා දුෂ්කර විය. ගමනාගමන අපහසුකම් විඳ දරා ගනිමින් සමීක්ෂණයේ දත්ත ලබා ගැනීම සඳහා අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරිනී ඩී. එම්. ආර්. කේ. දිසානායක, සංවර්ධන ක්ෂේත්‍ර සහකාර එම්.ආර්.ඩබ්ලිව්. දමයන්ති, වනිතා සංවර්ධන නිලධාරිනී ඩී. මනෝරි රසාංගිකා දෙහිමඩුව, ඉඩම්

21361

පරිහරණ සැලසුම් සහකාර නයනා නාමල් කුමාරි, බෞද්ධ කටයුතු සමායෝජක බී. ආර්. රෝහිණී, විමර්ශන සහකාර අශෝකා මාලනී රත්නායක, මානව සම්පත් සංවර්ධන සහකාර සාගරිකා දමයන්ති කුමාරි යන මහත්මීන් විසින් ඉටු කලේ විශාල කැප කිරීමකි. මේ පිළිබඳව මාගේ බලවත් ස්තුතිය එම මහත්මීන්ට පුද කරමි.

මෙවැනි සමීක්ෂණයක සාර්ථකත්වය රඳා පවතින්නේ ගම්වැසියන් ලබා දෙන තොරතුරුවල නිවැරදි භාවය මත ය. ඒ සඳහා මෙම අධ්‍යයනයේ දී මෙම ගම්වාසීන් දැක්වූයේ නොමසුරු සහයෝගයකි. ඒ පිළිබඳව එම ගම්වාසීන්ට ද ස්තුතිවන්ත වෙමි.

මෙම අධ්‍යයනයේ ක්ෂේත්‍ර කටයුතු සම්බන්ධීකරණය කිරීමත්, ක්ෂේත්‍ර කටයුතු අධීක්ෂණයත් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ සංඛ්‍යාන සහකාර එල්.පී. ආරියරත්න මහතා අතින් සිදු විය. ඒ මහතාගේ පූර්ණ දායකත්වයත්, දැඩි කැපවීමත් මත ක්ෂේත්‍ර කටයුතු කලට වේලාවට නිම කර ගැනීමට හැකියාව ලැබුනි. ඒ සමගම මෙම වාර්තාව සකස් කිරීම සඳහා අවශ්‍ය වගු කලට වේලාවට සපයා දීම සඳහා සංඛ්‍යාන නිලධාරිනී සන්ධ්‍යා සේනානායක මහත්මියගෙන් ඉටු වූ සේවය ද අගය කරන අතර, එම මහත්මියට ද ස්තුතිය පුද කරමි.

අවසාන වශයෙන් වාර්තාව සකස් කිරීමේ දී අවශ්‍ය දත්ත වගු කලට වේලාවට සපයා දීම පිළිබඳව ආයතනයේ ජ්‍යෙෂ්ඨ ක්‍රම විශ්ලේෂක එම්.එල්.ඩී. සෙනරත් මහතා ඇතුලු එම කාර්ය මණ්ඩලයට ද, මෙම වාර්තාව පරිගණක ගත කර දුන් මානව සම්පත් හා ආයතන සංවර්ධන අංශයේ රහස්‍ය ලේකම් ඉන්ද්‍රා දේවේන්ද්‍ර මහත්මියට ද මාගේ ස්තුතිය පුද කරමි.

එන්. එස්. බී. ඇපාකන්ද
පර්යේෂණ නිලධාරී.

## පටුන


| | පිටු අංකය |
|---|---|
| **ස්තුතිය** | 1 |
| **වගු සටහන් ලේඛනය** | V1 |
| **පළමු පරිච්ඡේදය** | |
| 1. හැඳින්වීම | 1 |
| 1.1 ගම නැගුම වැඩසටහන | 1 |
| 1.2 ගම නැගුම ආදර්ශ වැඩසටහන | 2 |
| 1.3 පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණය | 2 |
| 1.4 අධ්‍යයනයෙහි අරමුණු | 3 |
| 1.5 අධ්‍යයනයෙහ ක්‍රමවේදය | 4 |
| 1.6 අධ්‍යයන කාලය | 4 |
| 1.7 ගැටලු හා සීමා | |
| **දෙවන පරිච්ඡේදය** | |
| **අධ්‍යයන ග්‍රාමීය හා ජනගහන තොරතුරු** | |
| 2.1 අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | 5 |
| 2.2 වත්තේගෙදර ගම | 6 |
| 2.3 දේශගුණික තත්ත්වය | 7 |
| 2.4 ඓතිහාසික තත්ත්වය හා ජනාවාස වීම | 7 |
| 2.5 වසමේ ජනගහණය | 7 |
| 2.5.1 තෝරාගත් නියැදියේ ජනගහණය | 8 |
| 2.6 වසමේ අධ්‍යාපන තත්ත්වය | 8 |
| 2.6.1 නියැදි ජනගහණයේ අධ්‍යාපන තත්ත්වය | 9 |
| **තුන්වන පරිච්ඡේදය** | |
| **ආර්ථික කටයුතු,. රැකියාවන්හි ස්වභාවය හා ආදායම්** | |
| 3.1.1 සේවා නියුක්තිය | 11 |
| 3.1.2 ශ්‍රම බලකාය | 12 |
| 3.1.3 ආර්ථික කටයුතු හා ආදායම් මාර්ග | 12 |

3.1.4 ශ්‍රම බලකායෙහි රැකියාවන්හි ස්වභාවය 12
3.1.5 ශිල්පීය දක්ෂතා/විශේෂ සුදුසුකම් 13
3.2 ආදායම් 14
3.2.1 ආදායම් මට්ටම අනුව වර්ගීකරණය 15
3.2.2 ආදායම් බෙදීයාම අනුව වර්ගීකරණය 16
3.2.3 ආදායම් සංයුතිය 18
3.2.4 දරිද්‍රතාවය

3.3.1 ඉතිරිකිරීම් 18
3.3.2 ණයගැති භාවය 19

**හතර වන පරිච්ඡේදය**

**නිවාස තත්ත්වය සහ පහසුකම්** 21

4.1 නිවාස අයිතිය 21
4.2 නිවාස තත්ත්වය 23
4.3 නිවාසවල ඇති පහසුකම් 24
4.4 බලශක්ති භාවිතය 24
4.5 ජල පහසුව 25
4.6 වැසිකිලි පහසුකම් 26
4.7 ගෘහ උපකරණවල අයිතිය 27
4.8 ප්‍රවාහන මාධ්‍යය අයිතිය 27
4.9 කෘෂි උපකරණවල අයිතිය 28
4.10 සෞඛ්‍ය තත්ත්වය 29
4.11 ගමනාගමන හා යටිතල පහසුකම් 30
4.12 ගමෙහි භෞතික සම්පත්

**පස්වන පරිච්ඡේදය**

**ඉඩම් අයිතිය බුක්තිය හා සංවර්ධනය කිරීම** 31

5.1 භුක්තිවිඳින ඉඩම්වල ස්වභාවය හා ප්‍රමාණය 34
5.2 ඉඩම් අයිතිය හා භුක්තිය 35
5.3 ඉඩම්වල භෞතික ස්වභාවය

## හයවෙනි පරිච්ඡේදය

### කෘෂිකර්මය හා අනෙකුත් නිෂ්පාදන කටයුතු


36

6.1 වගා කරනු ලබන බෝග හා අක්කර ප්‍රමාණයන් 36

6.2 බෝග වගාව 37

6.3 තාක්ෂණ භාවිතය 37

6.3.1 කෘෂි දැනුම හා උපදෙස් 39

6.3.2 බීජ භාවිතය 39

6.3.3 පොහොර භාවිතය

6.4 ජල පාලනය 40

6.5 නිෂ්පාදනය 40

6.6 නිෂ්පාදන වියදම හා ලාභය 40

6.7 අලෙවිය 41

6.8 සත්ව පාලනය 42


## හත්වන පරිච්ඡේදය

### ප්‍රජා සංවිධාන සහ ජනතා සහභාගිත්වය


43

7.1 ගමෙහි ඇති ප්‍රජා සංවිධාන හා ක්‍රියාකාරී බව 44

7.2 සමෘද්ධි සංවර්ධන බැංකු සංගමය.


## අටවන පරිච්ඡේදය

### වත්තේගෙදර ගමේ හඳුනාගත් ගැටලු.


8.1 හඳුනාගත් ගැටලු. 44

8.2 සංවර්ධන අවශ්‍යතාවයන්. 46

සාරාංශය 48

ඇමුණුම 1 කෑගල්ල දිස්ත්‍රික්කයේ පිහිටීම හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ

ඇමුණුම 11 අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම්

ඇමුණුම 111 වත්තේගෙදර වසම

# වගු සටහන්


| | | පිටුව |
|---|---|---|
| 2.1 | නියැදි ජනගහණයේ ව්‍යාප්තිය | 8 |
| 2.2 | නියැදි ජනගහණයේ අධ්‍යාපන මට්ටම ස්ත්‍රී පුරුෂ භාවය අනුව බෙදී ඇති අන්දම | 9 |
| 3.1 | නියැදි ජනගහණය කාර්යය අනුව වර්ග කිරීම | 11 |
| 3.2 | ශ්‍රම බලකාය කාර්ය අනුව වර්ග කිරීම | 12 |
| 3.3 | ප්‍රාථමික හා ද්විතියික රැකියාවල නියැලීම | 13 |
| 3.4 | ආදායම් කාණ්ඩ අනුව වාර්ෂික දළ ආදායම බෙදී යාම | 15 |
| 3.5 | විවිධ ගෘහස්ථ ආදායම් සංයුතිය. | 17 |
| 3.6 | ඉතිරි කිරීම් | 18 |
| 3.7 | ණයගැති භාවය | 19 |
| 3.8 | ණය ලබාගත් මාර්ග | 19 |
| 4.1 | නිවාස ගොඩනැගීමට භාවිතා කළ ද්‍රව්‍ය අනුව නිවාස වර්ගීකරණය | 21 |
| 4.2 | කාමර ගණන අනුව නිවාස වර්ග කිරීම | 22 |
| 4.3 | ගෙබිමේ වර්ගඵලය අනුව නිවාස බෙදීයාම | 22 |
| 4.4 | පදිංචි සංඛ්‍යාව අනුව නිවාස වර්ගීකරණය | 23 |
| 4.5 | විදුලි බලය ලබා නොගැනීමට හේතු | 24 |
| 4.6 | ජල පහසුකම් | 25 |
| 4.7 | වැසිකිලි භාවිතය | 26 |
| 4.8 | ගෘහ උපකරණ හා ප්‍රවාහන මාධ්‍ය අයිති නිවාස (ප්‍රතිශතයක් වශයෙන්) | 26 |
| 4.9 | කෘෂිකර්ම උපකරණවල අයිතිය | 28 |
| 4.10 | විවිධ සේවා සපයන ස්ථාන හා ඒවා ඇති සාමාන්‍ය දුර | 29 |
| 5.1.1 | නියැදියට අයත් ඉඩම් | 32 |
| 5.1.2 | ඉඩම්වල ප්‍රමාණය අනුව කුඹුරු ඉඩම් බෙදී යාම | 32 |
| 5.1.3 | ඉඩම්වල ප්‍රමාණය අනුව ගොඩ ඉඩම් හා ගෙවතු බෙදී ඇති අන්දම | 33 |
| 5.2.1 | ඉඩම් භුක්තිය | 34 |
| 6.1 | වගා කටයුතු සඳහා උපදෙස් ලබා ගැනීම | 38 |
| 6.2 | අලෙවි මාර්ග | 41 |
| 6.3 | සත්ව පාලනයේ නොයෙදීමට හේතු | 42 |

# පළමුවැනි පරිච්ඡේදය
# හැඳින්වීම

## 1.1 ගම නැගුම වැඩසටහන

වර්තමාන රජය විසින් "මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශය මත පදනම්ව ආරම්භ කර ඇති "ගම නැගුම වැඩසටහන" ග්‍රාමීය දුප්පත්කම නැති කිරීම සඳහා සහභාගීත්ව මෙන්ම ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ප්‍රවේශයක් හඳුන්වා දීම කෙරෙහි විශේෂ අවධානයක් යොමුකර ඇති එකකි. ගම නැගුම සංකල්පයෙහි මූලික අදහස වන්නේ ගමෙහි සංවර්ධනය සඳහා සැලසුම් සැකසීම මෙන්ම ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා ගමෙහි ජනතාව පාර්ශවකරුවන් බවට පත්කර ගැනීමය. මෙම වැඩසටහනෙහි "දැක්ම" වන්නේ ගම ජාතික සවංර්ධනයෙහි කේන්ද්‍රස්ථානය බවට පත් කිරීමය. "මෙහෙවර" වන්නේ ග්‍රාමීය ජනතාව තුලින් ගොඩ නැගෙන සහභාගීත්ව ප්‍රජා සංවර්ධන ජාලයක් ඔස්සේ ගම තුළ සංවර්ධනයක් රටෙහි ඇති කිරීමය.

ගම නැගුම වැඩසටහනෙහි අරමුණු පහත දැක්වේ.

1. ග්‍රාමීය ජනතාව සංවර්ධනයේ ඉලක්කයන් පමණක් නොව, සංවර්ධනයේ කොටස්කරුවන් බවට ද පත් කිරීම.
2. ග්‍රාමීය ජනතාවගේ සහභාගීත්වය තුළින් ගමේ ගැටළු හා විභවතාවන් හඳුනා ගෙන, ගම කේන්ද්‍රකොට, ඔවුන් සංවර්ධනයේ පෙර ගමන්කරුවන් ලෙස සංවර්ධන ක්‍රියාවලිය දියත් කිරීම
3. ගම සංවර්ධනය කිරීම සඳහා අභ්‍යන්තර හා බාහිර සම්පත් මනා ලෙස කළමනාකරණය කොට, ඵලදායී ලෙස යොදා ගැනීම සඳහා සැලසුම් කසකස් කිරීම
4. දුප්පත්කම අවම කිරීම සඳහා අවශ්‍ය පිළියම් යොදමින් ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම

මුල් දෙවසර තුළ දී තෝරා ගත් ගම්වල නිවාස නොමැති පවුල්වලින් 50% කට නිවාස තනා දීම, එම ගම්වල විදුලි නොමැති සියළුම පවුල්වලට විදුලි පහසුකම් සැපයීම, මුල් දෙවසර තුළ සියළුම ගම්වලට ආරක්ෂිත පානීය ජල පහසුකම් සැපයීම, සෑම ගමකටම වාහන ධාවනය කිරීමට යෝග්‍ය මාර්ගයක් සකස් කිරීම වැනි කෙටි කාලීන ඉලක්ක ද සෑම ගමකටම විදුලිය, පොදු සන්නිවේදන සේවා ලබාදීම හා අධ්‍යාපනය දියුණු කිරීම වැනි දිගු කාලීන ඉලක්ක සපුරා ගැනීමට ද මෙම වැඩසටහන මඟින් අපේක්ෂා කෙරේ.

## 1.2 ගම නැගුම ආදර්ශ වැඩසටහන

ගම නැගුම වැඩසටහන යටතේ දියුණු කිරීම සඳහා ගම් තෝරා ගැනීම වට කිහිපයක් යටතේ සිදුවෙමින් පවතී. පළමු වටය සඳහා දිවයිනේ දිස්ත්‍රික්ක දහයක් නියෝජනය වන පරිදි ගම් දහයක් තෝරාගනු ලැබූ

අතර එම ගම් ආදර්ශන ලෙස දියුණු කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ. මේ යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් "වත්තේගෙදර වසම" තෝරා ගනු ලැබීය.

### 1.3 පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණය

ගම නැගුම ආදර්ශ වැඩසටහන යටතේ අදාල ව්‍යාපෘති ගම්වල සිදු කෙරෙන සංවර්ධන කටයුතුවල බලපෑම් හඳුනා ගනිමින් ව්‍යාපෘතිය ඇගයීමට ලක් කිරීමට හැකිවනු පිනිස එම ගම් පදනම් කරගෙන ඒවායෙහි පූර්ව-ව්‍යාපෘති සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ සමීක්ෂණයක් (පාදක සමීක්ෂණයක්) සිදු කරන ලෙස කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශය විසින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙන් ඉල්ලා සිටිනු ලැබිණ. ඒ අනුව වත්තේගෙදර ගම පදනම් කර ගනිමින් සිදුකළ අධ්‍යයනයෙහි සොයා ගැනීම් මෙම වාර්තාව මඟින් එළි දැක්වේ. මෙම අධ්‍යයනයේදී ව්‍යාපෘතියෙහි දිගු කාලීන බලපෑම් හා අපේක්ෂිත ප්‍රතිඵල සපුරා ගැනීම් ගණනය කිරීමට හැකිවනු පිණිස ගමේ ජනතාවගේ සාමාන්‍ය සමාජ ආර්ථික තත්ත්වය හා අදාල තොරතුරු ලබා ගැනීමට අමතරව ව්‍යාපෘතියෙහි කෙටි කාලීන බලපෑම් ගණනය කිරීම සඳහා ගමෙහි ඇති යටිතල පහසුකම් මෙන්ම අනෙකුත් සේවා පහසුකම්, කෘෂි තාක්ෂණ භාවිතයන් යනාදිය පිළිබඳව ද තොරතුරු ලබා ගැනීමට අපේක්ෂා කෙරිණ.

### 1.4 අධ්‍යයනයෙහි අරමුණු

මෙම පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණයෙහි ප්‍රධාන අරමුණ වන්නේ ගම නැගුම වැඩසටහනෙහි ප්‍රථම අදියර යටතේ තෝරාගත් මෙම ගමෙහි සමාජ ආර්ථික තත්ත්වය හා අදාල තොරතුරු රැස් කිරීම හා වාර්තාගත කිරීමය.

එහි සුවිශේෂී අරමුණු වන්නේ,

i. අධ්‍යයනය සඳහා තෝරාගත් ගමෙහි ජනගහන තොරතුරු එනම් ජන සංඛ්‍යාව, ස්ත්‍රී පුරුෂ භාවය, ආගම, අධ්‍යාපන හා සෞඛ්‍ය තත්ත්වය සම්බන්ධ විස්තර ලබා ගැනීම
ii. අධ්‍යයන ගමේ ජීවන මාර්ග, රැකියාවන්හි ස්වභාවය, ආදායම් තත්ත්වය, ඉතිරි කිරීම හා ණයගැති භාවය පිළිබඳව අධ්‍යයනය කිරීම
iii. ගම්වාසීන්ට ඉඩම් භාවිතය සඳහා ඇති හැකියාව, ඉඩම් අයිතිය, බුක්තියෙහි ස්වභාවය හා ඉඩම් සම්බන්ධයෙන් ඇති ගැටළු විමසා බැලීම
iv. වැසියන්ගේ නිවාස අයිතිය, ඒවායෙහි ස්වභාවය හා ඒවා සඳහා ඇති පහසුකම් පිළිබඳව සොයා බැලීම
v. වැසියන්ගේ නිවාසවල ඇති බඩු බාහිරාදිය මෙන්ම කෘෂිකාර්මික උපකරණ පිළිබඳව විමසා බැලීම

vi. ගමෙහි ගමනාගමනය, විදුලි බලය, දුරකථන පහසුකම්, බීම සඳහා මෙන්ම නෑම සඳහා ජලය, අධ්‍යාපනය, සෞඛ්‍ය, තාක්ෂණික දැනුම ලබාදීම හා අලෙවි පහසුකම් යනාදිය සම්බන්ධයෙන් ඇති යටිතල පහසුකම් පිළිබඳව අධ්‍යයනය

vii. ගම තුල ක්‍රියාත්මක වන ප්‍රජා සංවිධාන හා ඒවාතුළ වැසියන් නියෝජනය මෙන්ම ගමෙහි සංවර්ධනය හා සම්බන්ධ තීරණ ගැනීම හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඔවුන්ගේ සහභාගීත්වය පිළිබඳව විමර්ශනය කිරීම

viii. ජනතාව සතු ඉඩම් හා ජලය වැනි සම්පත් ඔවුන්ගේ නිෂ්පාදනය හා ආදායම් වර්ධනය සඳහා කෙතරම් දුරට කාර්යක්ෂම හා ඵලදායී ලෙස භාවිතයට ගන්නේද යන්න සොයා බැලීම

ix. වැසියන්ගේ ප්‍රධාන නිෂ්පාදන කටයුතු සඳහා තාක්ෂණික හා යෙදවුම් භාවිතයෙහි ස්වභාවය පිළිබඳව විමසීම

x. වැසියන්ගේ ප්‍රධාන නිෂ්පාදන කටයුතු සඳහා වන නිෂ්පාදන වියදම හා ලාභය ගණනය කිරීම

## 1.5 අධ්‍යයන ක්‍රමවේදය

ගම නැගුම ප්‍රථම වටය යටතේ තෝරාගත් ගම් දහයෙන් එකක් වන වත්තේගෙදර ගමෙහි සිදු කරනු ලැබූ ක්ෂේත්‍ර අධ්‍යයනයක් ආශ්‍රයෙන් සිදු කරනු ලැබූ මෙම අධ්‍යයනයට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා ක්‍රම කිහිපයක් අනුගමනය කරනු ලැබිණ. මින් ප්‍රධාන ක්‍රමය වූයේ ගමෙහි පදිංචි පවුල් ආශ්‍රයෙන් සිදුකළ නියැදි සමීක්ෂණයයි. පවුල්වලට අදාල පෞද්ගලික තොරතුරු මෙන්ම ගමේ සංවර්ධනයට අදාල තොරතුරු ලබා ගැනීම සඳහා එමගින් උත්සාහ දරිණි. ගමේ සංවර්ධනයට අදාල පොදු තොරතුරු ලබා ගැනීම සඳහා ග්‍රාම නිලධාරීන්, කෘ.ප.නි.ස.වරුන් ප්‍රජා සංවිධාන නායකයින්, පාසල, පන්සල හා වෙනත් පොදු සේවා සපයන ආයතනවල ප්‍රධානීන් වැනි ප්‍රධාන තොරතුරු සපයන්නන් සමග සාකච්ඡා කරනු ලැබිණ. කෘෂිකර්මය, සත්ත්ව පාලනය, ස්වයං රැකියා, යනාදී විශේෂ ක්ෂේත්‍රයන් සම්බන්ධ තොරතුරු ලබා ගැනීමේදී ඒ හා කටයුතුවල නියුතු පුද්ගලයන් සමග කණ්ඩායම් සාකච්ඡා පවත්වනු ලැබිණ. මීට අමතරව ද්විතීයික දත්ත භාවිතා කිරීම ද සිදුකළ අතර විවිධ විෂයන්ට අදාලව ග්‍රාම නිලධාරී, කෘ.ප.නි.ස. වරුන්, පවුල් සෞඛ්‍ය සේවිකාවන් යන අයත්, අදාල ගොවිජන සේවා මධ්‍යස්ථාන, සත්ව වෛද්‍ය සේවා කාර්යාලය, ප්‍රාදේශී ලේකම් කාර්යාලය හා ග්‍රාමීය බැංකු වැනි ආයතනත් මගින් දැනට රැස්කර ඇති තොරතුරු මේ යටතේ ලබා ගනු ලැබිණ. මෙසේ විවිධ මාර්ගයන්ගෙන් ලබාගත් තොරතුරු නියැදි සමීක්ෂනයෙන් ලබාගත් තොරතුරු සමග සම්බන්ධ කරනු ලැබිණ.

නියැදි සමීක්ෂණය සඳහා ගමේ පවුල් සංඛ්‍යාවෙන් භාගයක් නියෝජනය වන පරිදි පවුල් 114 ක් සසම්භාවී ක්‍රමයට (සසම්භාවී ලඝු භාවිතයෙන්) තෝරාගනු ලැබිණ. අදාල නියැදි පවුල්වලින් තොරතුරු ලබා ගැනීමේදී ප්‍රශ්නාවලියක් භාවිතා කරනු ලැබූ අතර එසේ තොරතුරු ලබා ගැනීම සඳහා අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත ක්ෂේත්‍ර නිලධාරීවරුන් සහභාගී කරගනු ලැබිණ. ග්‍රාම නිලධාරී, කෘ.ප.නි.ස., වැනි ප්‍රධාන

තොරතුරු සපයන්නන් හා සාකච්ඡාකර ගම්වලට අදාලව ඇති යටිතල පහසුකම්, සේවා ආයතන යනාදිය සම්බන්ධව තොරතුරු ගැනීම සඳහා ද පොදු ප්‍රශ්නාවලියක් භාවිත කරනු ලැබිණ. විශේෂයෙන් සඳහන් කල අවස්ථාවල හැර මෙම වාර්තාවේ ඇති සියලු වගු මෙම සමීක්ෂණයෙන් ලබා ගත් දත්ත පදනම් කරගෙන සකස් කර ඇත.

### 1.6 අධ්‍යයන කාලය

මෙම අධ්‍යයනය සඳහා තොරතුරු ලබා ගන්නා ලද්දේ 2006 ජුලි සහ අගෝස්තු අතර කාල සීමාව තුළදීය. ආදායම ගණනය කිරීමේදී 2005 අගෝස්තු සිට 2006 ජුලි දක්වා වූ වසරක කාල සීමාව පදනම් කරගනු ලැබිණ. නිෂ්පාදනය හා සම්බන්ධ තොරතුරු ගැනීමේදී 2005 යල කන්නය හා 2005- 2006 මහ කන්නය පදනම් කරගනු ලැබිණ.

### 1.7 ගැටළු හා සීමාකම්

මෙම අධ්‍යයනය සඳහා දත්ත රැස්කිරීම මාස 2 ක් වැනි කෙටි කාලයක් තුල දී අවසන් කළ යුතු විය. මෙම අධ්‍යයනය සිදු කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදනයක් නොමැතිවීම මත අධ්‍යයනය කරගෙන යාමේදී විවිධ බාධාවන්ට මුහුණපෑමට සිදු විය. එසේම අධ්‍යයනයේ දත්ත රැස්කිරීම් කටයුතු නිම කළයුතුව තිබුනේ ද මාස දෙකක් වැනි කෙටි කාලයකිනි. ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් අධ්‍යයනය සඳහා කාලය හා ශ්‍රමය අවම වශයෙන් වැය වන සේ කටයුතු කිරීමට සිදු විය. දත්ත රැස්කිරීමේ කටයුතු සඳහා පර්යේෂණ සහායක වරුන් යොදවා ගැනීම අපහසු වූ බැවින් ඒ සඳහා ප්‍රදේශයෙන්ම සුදුසු අය තෝරා ගැනීමට තීරණය වී තිබුනි. කෙසේ වෙතත් මෙම අධ්‍යයනයේ දත්ත රැස්කිරීමේ කටයුතු සඳහා අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සේවය ලබාගැනීමට හැකියාව ලැබුනි. නමුත් ඔවුන්ට මේ පිළිබඳව කෙටි පුහුණුවක් පමණක් ලබා දීමට සිදු විය. මෙම සමීක්ෂණයේ කටයුතු සඳහා ඔවුන්ගේ පූර්ණ කාලීන දායකත්වය ලබා ගැනීමට ද නොහැකි විය. දත්ත රැස් කිරීම් ඔවුන්ගේ වෙනත් එදිනෙදා රාජකාරී මධ්‍යයේ කිරීමට සිදු විය. මෙය අධ්‍යයනයට බලපාන ලද ප්‍රධාන ගැටලුවක් විය. එසේම මාර්ග දුෂ්කරතාවයන්, ප්‍රවාහන පහසුකම් නොතිබීමත් මත එය තවත් දුෂ්කර කටයුත්තක් විය. දත්ත රැස්කිරීමේ කටයුතු පූර්ණ කාලීනව, අඛණ්ඩව සිදු නොවීම හේතුවෙන් අධීක්ෂණ කටයුතු ක්‍රමවත්ව සිදු කිරීමට ද බාධා විය. මේ හේතුන් සමීක්ෂණයේ දී ලබා ගත් පිළිතුරුවල නිරවද්‍යතාවය පිළිබඳව යම් බලපෑමක් ඇතිවීමට ඉඩ තිබුණි.

එසේම මෙම නිලධාරීන් " ගම නැගුම " වැඩසටහන යටතේ විවිධ ක්ෂේත්‍ර රාජකාරීවලට අනුයුක්තව සිටීම, ගමෙන් තොරතුරු ලබා ගැනීමේ දී සමහර ප්‍රශ්නවලට විශේෂයෙන් ආදායම් වැනි ප්‍රශ්නවලදී ලබා දුන් පිළිතුරුවලට යම් බලපෑමක් ඇති වූ අතර එය ද මේ අධ්‍යයනය සඳහා ඇති වූ තවත් ගැටලුවකි.

දෙවන පරිච්ඡේදය

# අධ්‍යයන ග්‍රාමය හා ජනගහණ තොරතුරු

මෙම පරිච්ඡේදය මගින් අධ්‍යයන ග්‍රාමය වන "වත්තේගෙදර ගම" අයත් වන අරනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පිළිබඳවත්, වත්තේගෙදර ග්‍රාමයේ පිහිටීම හා දේශගුණය ආදී තොරතුරු පිළිබඳවත් ගෙන හැර දක්වනු ලබයි. එසේම ගමේ ජනගහණය හා අධ්‍යාපන තත්ත්වය පිළිබඳව ද මෙම පරිච්ඡේදය තුළින් විස්තර ඉදිරිපත් කර ඇත.

## 2.1 අරනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 කින් එකක් වන අරනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අරනායක මැතිවරණ බලප්‍රදේශයට අයත් වන්නකි. මෙම කොට්ඨාශය උතුරින් මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයටත්, දකුණින් යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයටත් බස්නාහිර හා වයඹින් කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයටත් සීමා වන සේ දිස්ත්‍රික්කයේ නැගෙනහිර දිසාවෙන් පිහිටා ඇත.

විශාලත්වයෙන් ව.කි.මී. 103.24 ක් වන මෙම කොට්ඨාශය ග්‍රාම නිලධාරී වසම් 61 කින් සමන්විත වන අතර, එයට අයත් ගම්මාන සංඛ්‍යාව 160 කි. වර්ග කි. මී. ට 723 ජනඝනත්වයකින් මෙම කොට්ඨාශය සමන්විත ය. සිංහල, මුස්ලිම් හා ද්‍රවිඩ යන බහු වාර්ගික ජනකොටස් වලින් සමන්විත ජනකායකින් යුත් මෙහි බහුතරයක් සිංහල ජන කොටසට අයත් වෙති. ප්‍රතිශතයක් ලෙස ගත් විට එය 90.2% කි. ආගම් වශයෙන් ගත් විට බහුතරයක් බෞද්ධ ජනකායකින් සමන්විත වන අතර හින්දු, ඉස්ලාම් හා කතෝලික ආගමිකයන් ද කොට්ඨාශය නියෝජනය කරයි.

දේශගුණික වශයෙන් මෙම කොට්ඨාශය තෙත් කලාපීය පහතරට, තෙත් කලාපීය උඩරට හා තෙත් කලාපීය මැදරට වශයෙන් කෘෂි දේශගුණික කලාප 3 කට අයත් දේශගුණික ලක්ෂණ පෙන්නුම් කරයි. මි.මි. 3000 – 4500 අතර වාර්ෂික වර්ෂාපතනයක් මෙම කලාප මට්ටමේ දී වාර්තා වේ. එසේම 24 C ක සාමාන්‍ය උෂ්ණත්වයකින් යුක්තය. උඩරට භූ විෂමතා ලක්ෂණ සහිත කඳුකර භූමි වලින් ගහණ මෙම කොට්ඨාශය මුහුදු මට්ටමේ සිට මීටර් 300 – 500 ක් ඉහළ පිහිටා ඇති ප්‍රදේශයකි.

කෘෂිකාර්මික ප්‍රදේශයක් වන අරනායක කොට්ඨාශයේ කරාබු, ගම්මිරිස් වැනි බෝගයන් බහුලව වගා කරනු ලබයි. ඊට අමතරව රබර් වගාව ද ව්‍යාප්ත වී ඇති ප්‍රධාන බෝගයකි. තේ ද සුලු වශයෙන් පවතී. දේශගුණික කලාපයට උචිත සාදික්කා, ගොරකා වැනි බෝග ද ගෙවතුවල දක්නට ඇත. ගෙවතු මට්ටමේ දී පොල් වගාව ද සාමාන්‍ය වශයෙන් ව්‍යාප්ත වී පවතී. වී ගොවිතැන සුලු වශයෙන් පවතී. කෘෂිකර්මාන්තය ආශ්‍රිත රැකියාවන් මෙහි වෙසෙන බහුතරයකගේ ප්‍රධාන ආදායම් මාර්ගයයි. කොට්ඨාශයේ මුළු පවුල් සංඛ්‍යාවෙන් 50% ක්ම සමෘද්ධි ප්‍රතිලාභ ලබන්නෝ වෙති.

## 2.2 වත්තේගෙදර ගම

### පිහිටීම

ගම නැගුම වැඩසටහන යටතේ සංවර්ධනය කිරීම සඳහා අරනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 16 ජී දරණ වත්තේගෙදර වසම තෝරාගෙන ඇත. මෙම වත්තේගෙදර වසම උතුරින් ඇපලාව ඇලෙන් ද, දකුණින් ඌරාකන්ද කඳුවැටියෙන් ද, බස්නාහිරින් අස්මඩල ග්‍රාම නිලධාරී වසමෙන් ද, නැගෙනහිරින් මිල්ලන්ගොඩ ග්‍රාම නිලධාරී වසමෙන් ද මායිම්ව පිහිටා ඇත. මෙම වසම උස්සාපිටිය ගොවිජන කේන්ද්‍ර බල ප්‍රදේශය තුල පිහිටා ඇති අතර පරිපාලනමය වශයෙන් අරනායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වේ.

වත්තේගෙදර වසම මුලු භූමි ප්‍රමාණයෙන් අක්කර 640 ක විශාලත්වයකින් යුක්ත වන අතර පොරෝ මාරුව, මැරහේන. හිඳගොල්ල, බෝගහවෙල, වලව්වත්ත හා වත්තේගෙදර යන ගම් ගොඩැලි 6 කින් සමන්විතය.

**ගමට ලඟාවෙන මාර්ගය**

මාර්ග පහසුකම් අතින් දුෂ්කර මෙම ගමට ලඟාවීමට ඇති මාර්ග 03 කි.

1. මාවනැල්ල අරනායක මාර්ගයේ කි.මී. 5 ක් ගොස් උස්සාපිටිය හන්දියෙන් දිවෙල පාරේ කි.මී. 1 1/2 ක් ගිය විට හමුවන සුදුගල හන්දියෙන් මිල්ලන්ගොඩ මාර්ගයේ මිල්ලන්ගොඩ ඇරැව්වලට පැමිණ එතැන් සිට කිමී. 2 ක් ඉදිරියට ගිය විට මෙම ගම්මානයට ලඟාවිය හැක. උස්සාපිටිය නගරයේ සිට ගමට කි.මී. 11 ක දුරක් පවතී.

2. උස්සාපිටිය දිවෙල පාරේ ඇපලාව හන්දියෙන් හැරී අස්මඩල හා ගුරුබැවිල පසුකර වත්තේගෙදර පන්සල දක්වා දිවෙන මාර්ගය. මෙම මාර්ගය උස්සාපිටිය හන්දියේ සිට කි.මී. 10 කි.

3. දෙබත්ගම සිට දියබෙත්ම හරහා දෙබත්ගම හන්දියේ සිට වත්තේගෙදර ගමට එන ප්‍රාදේශීය සභා පාර. දෙබත්ගම සිට දුර කි.මී. 2 කි. වාහන ධාවන කළ නොහැකි පාරකි. අරනායක සිට ඇරැව්වල දක්වා ද,, අස්මඩල දක්වා ද බස්රථ ධාවනය වන අතර එම නගර සිට ගමට ලඟාවීමට ඇති මාර්ග තාර දමා නොමැති වාහන ගමනාගමනය අපහසු කුඩා පාරවල් ය.

ගමෙහි කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගෙන ඇති ඉඩම් ප්‍රමාණය අක්කර 382 ක් වන අතර ඉන් කුඹුරු ඉඩම් ලෙස ඇත්තේ අක්කර 51 ක් පමණි. අක්කර 331 ක් වූ ගොඩ ඉඩම් ප්‍රමාණයෙන් 302 ක් පෞද්ගලික ගොඩ ඉඩම් වේ. මෙයින් අක්කර 28 ක් රජයෙන් බෙදා දී ඇති ඉඩම් වන අතර ඉතිරිය පාරම්පරිකව භුක්තිවිඳින ඉඩම් වේ. රජයේ රක්ෂිතයකට අයත් අක්කර 03 ක ඉඩම් ප්‍රමාණයක් ද ගම තුල ඇත. හේන් ලෙස වගා කරන ඉඩම් මෙහි නොමැත. ගොඩ හා මඩඉඩම් සියල්ල පිළිවෙලින් කෘෂි බෝග හා වී වගාවන්ට යොදා ගෙන ඇත. ගොඩ ඉඩම් ප්‍රධාන වශයෙන් කරාබු, ගම්මිරිස්. වැනි අපනයන බෝග

වලින් ද පොල්, රබර්, තේ වැනි වැවිලි බෝග වලින් ද යුක්තය. බොහෝ විට මෙම බෝග මිශ්‍ර භෝග වශයෙන් පවතින අතර ස්වල්ප තැනක පමණක් තනි වගාවක් වශයෙන් එක් බෝගයකට පමණක් ප්‍රමුඛත්වය දී ඇති බව දක්නට ලැබුනි. කරාබු හා ගම්මිරිස් වැනි අපනයන බෝග ගොඩ ඉඩම්වල බහුලව ව්‍යාප්ත වී ඇති වගාවන් වේ.

කඳුබෑවම් වලින් සමන්විත මේ ගම තුල තැනිතලා බිම් දක්නට ඇත්තේ ඉතා සුලු ප්‍රමාණයකි. ගමේ මුළු ඉඩම් ප්‍රමාණයෙන් 75% ක් පමණ උස් බිම් වශයෙන් පවතී. ගම හරහා කුඩා ජල පාරවල් 6 ක් ගලා බසී. මෙම ජල මාර්ග ආශ්‍රිතව පහත් බිම්වල ද කඳුබෑවුම් පාමුල හෙල්මලු ක්‍රමටය ද වී වගාව සිදු කරනු ලබයි. ඌරාකන්ද පාදක කොට ගලා බසින මෙම ජල ප්‍රභවයන් කෘෂිකාර්මික කටයුතුවලට පමණක් නොව ගමේ ගෘහස්ත ජල අවශ්‍යතා ද සපුරාලනු ලබයි. ගම්මානය පුරාම දක්නට ඇති විවිධ ප්‍රමාණයේ පාෂාණ කුට්ටි ගමේ ඇති වටිනා ස්වභාවික සම්පතකි.

2.3 දේශගුණික තත්ත්වය

අරනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දේශගුණික රටාව මේ ප්‍රදේශය තුල ද දක්නට ලැබේ. කාෂි දේශගුණික කලාප වශයෙන් ගත් විට තෙත් කලාපීය මැදරට දේශගුණික කලාපීය දේශගුණික ලක්ෂණ පෙන්නුම් කරයි. මි.මි. 3000 – 3500 අතර වාර්ෂික වර්ෂාපතනයක් මේ ප්‍රදේශයට පතිත වේ.

2.4 ඓතිහාසික තත්ත්වය හා ජනාවාස වීම.

මෙම වත්තේගෙදර වසම ඓතිහාසික වශයෙන් පුරාණ ගම්මානයකි. එසේ වුවත් මෙම වසමට අයත් පොරෝමාරුව ගම්ගොඩැල්ල ජනාවාස කරන ලද කොටසකි. අක්කර 1/2 බැගින් වූ ගොඩඉඩම් බෙදා දී ජනාවාස කර පිහිටුවන ලද ජනපද ප්‍රදේශයකි. මෙම කොටස අක්කර 28 කින් සමන්විත වන අතර 1963 වර්ෂයේ දී ජනාවාස කරන ලද්දකි. මෙම කොටසේ දැනට පවුල් 54 ක් පදිංචි වී සිටී. වත්තේගෙදර වසමේම ඉඩම් අහිමි අය සඳහා මෙම කොටසේ ඉඩම් බෙදා දී ඇත.

2.5 ජනගහණය.

<u>වත්තේගෙදර වසමේ ජනගහණය</u>

කෑගල්ල දිස්ත්‍රික්කය විවිධ ජාතීන්ගෙන් සමන්විත විවිධ ආගම් අදහන ජනගහණයකින් යුක්ත දිස්ත්‍රික්කයක් වුවත් අරනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සම්පූර්ණ වශයෙන් සිංහල බෞද්ධ ජනතාවකගෙන් යුක්ත වන්නකි. එබැවින් වත්තේගෙදර ගම තුල ද එම ලක්ෂණයම පෙන්නුම් කරයි. මෙම වසමේ පවුල් 254 කි. ගමෙහි මුළු ජනගහණය 996 ක් වන අතර එය ස්ත්‍රී පුරුෂ

වශයෙන් පිළිවෙලින් 538 හා 458 කින් සමන්විතය. මේ අනුව වත්තේගෙදර වසමේ පවුලක සාමාන්‍ය ජනගහණය 3.9 ක් වේ.

2.5.1 නියැදි ජනගහණ තොරතුරු

සමීක්ෂණය සඳහා පවුල් 114 කින් සමන්විත නියැදියක් තෝරාගත් අතර නියැදියෙහි ජනගහණය 446 ක් විය. එය ස්ත්‍රී/පුරුෂ වශයෙන් පිළිවෙලින් 219 (49%) හා 227 (50.9%) කි. නියැදි ජනගහණය වයස් කාණ්ඩ අනුව ව්‍යාප්තිය වගුව 2.1 න් දක්වයි.

වගුව 2.1 තෝරාගත් නියැදි ජනගහණයේ ව්‍යාප්තිය.

| වයස් කාණ්ඩය | පුරුෂ | ස්ත්‍රී | එකතුව | % |
|---|---|---|---|---|
| 0 – 04 | 15 | 10 | 25 | 5.6 |
| 5 – 9 | 19 | 18 | 37 | 8.3 |
| 10 – 14 | 15 | 23 | 38 | 8.5 |
| 15 - 24 | 38 | 32 | 70 | 15.7 |
| 25 - 44 | 69 | 67 | 136 | 30.5 |
| 45– 64 | 49 | 50 | 99 | 22.2 |
| 65 + | 22 | 19 | 41 | 9.2 |
| එකතුව | 227 | 219 | 446 | 100.0 |
| ප්‍රතිශතය % | 50.9 | 49.1 | 100 | |

2.6 අධ්‍යාපන තත්ත්වය

ග්‍රාම නිලධාරී වසමේ සමස්ත ජනගහණයේ අධ්‍යාපන මට්ටම ගැන බැලීමේ දී පාසැල් යන වයස් කාණ්ඩයට අයත් සියලු ළමයින් පාසැල් අධ්‍යාපනය ලබන බව වාර්තා විය. විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලත් අය සිටියේ ඉතා සුලු වශයෙනි. එනම් උපාධිධාරීන් 02 ක් පමණි. සාමාන්‍ය පෙල සමත් වූ සංඛ්‍යාව 92 ක් වූ අතර 19 දෙනෙක් උසස් පෙළ සමත් වී තිබූ බව වාර්තා වුනි.

2.6.1 නියැදි ජනගහණයේ අධ්‍යාපන තත්ත්වය

සමීක්ෂණය සඳහා තෝරාගත් නියැදි ජනගහණයේ අධ්‍යාපන තත්ත්වය පිළිබඳවද සමීක්ෂණයේ දී අවධානය යොමු කරනු ලැබූ අතර එය වගු 2.2 න් පෙන්නුම් කරයි.

වගුව 2.2 – නියැදි ජනගහණයේ අධ්‍යාපන මට්ටම ස්ත්‍රී පුරුෂභාවය අනුව බෙදී ඇති අන්දම අධ්‍යාපන තත්ත්වය

| අධ්‍යාපන මට්ටම | ස්ත්‍රී | | පුරුෂ | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. පාසල් නොයන බාල වයස් | 16 | 7.3 | 20 | 8.8 | 36 | 8.1 |
| 2. ප්‍රාථමික ශ්‍රේණි (1-5 ශ්‍රේණිය) | 41 | 18.7 | 58 | 25.6 | 99 | 22.2 |
| 3. ද්විතියික (6 – අ. පො. ස.) | 109 | 49.8 | 107 | 47.1 | 216 | 48.4 |
| 4. අ.පො.ස. (සා.පෙළ සමත්) | 24 | 11.0 | 31 | 13.7 | 55 | 12.3 |
| 5. අ.පො.ස. (උ.පෙළ සමත්) | 15 | 6.8 | 8 | 3.5 | 23 | 5.2 |
| 6. උපාධි අපේක්ෂක | 0 | | 1 | 0.4 | 1 | 0.2 |
| 7. උපාධිධාරී හෝ ඊට ඉහළ | 1 | 0.5 | 0 | | 1 | 0.2 |
| 8. පාසල් නොගිය (ලිවීමට/කියවීමට හැකි) | 4 | 1.8 | 2 | 0.9 | 6 | 1.3 |
| 9. පාසල් නොගිය (ලිවීමට/කියවීමට නොහැකි) | 9 | 4.1 | 0 | | 9 | 2.0 |
| එකතුව | 219 | 100 | 227 | 100 | 446 | 100 |

සාක්ෂරතාවය හා ලබාගත් අධ්‍යාපන මට්ටම ජනතාවගේ තොරතුරු සාධනය කර ගැනීමේ ඇති හැකියාව ගැන සලකා බැලීමට භාවිතා කළ හැකි මිනුම් දෙකකි. ආසියාතික රටවල් හා සැසඳීමේ දී ලංකාව ඉහළ මට්ටමක සාක්ෂරතාවයක් ලබාගෙන ඇත. වත්තේගෙදර ප්‍රදේශය ඉතා දුෂ්කර එමෙන්ම අඩු සංවර්ධිත ප්‍රදේශයක් වුවත් සාක්ෂරතාවය ඉහළ මට්ටමක පැවතුනි. මෙම අගයන් ස්ත්‍රී 95.6% ක් හා පුරුෂ 100 % ක් වශයෙන් පැවතුනි.

දත්ත අනුව පෙන්වන වැදගත් දෙයක් නම් උසස් පෙළ අධ්‍යාපනය ලත් (සමත්) අයගෙන් බහුතරයක් ස්ත්‍රීන් වීමයි. එය සංඛ්‍යාත්මක වශයෙන් 15 දෙනෙකි. උ.පෙ. සමතුන්ගේ ප්‍රතිශතයක් වශයෙන් එය 65.2% කි. එසේම නියැදියට උපාධිධරයෙකු ද අයත් වූ අතර එය ස්ත්‍රී පක්ෂය විසින් නියෝජනය කරයි.

සංනිවේදන මාධ්‍යයන් භාවිතය ගැන ද සමීක්ෂණයේ දී අවධානය යොමු විය. සංනිවේදන මාධ්‍යයන් වන ගුවන්විදුලිය, රූපවාහිනිය, සඟරා, පත්තර යනාදිය භාවිතය පිළිබඳව විමසීමේ දී ගුවන්විදුලිය හා රූපවාහිනිය බහුලව භාවිතා කරන ප්‍රධාන සංනිවේදන මාධ්‍යයන් බව වාර්තා විය. පුවත්පත් කියවීම ඉතා අඩු තත්ත්වයක පැවතුනි. දිනපතා පුවත්පත් කියවීමට හෝ ස්ථානයක් ගම තුල නොමැතිවීමත් පුවත්පත්

මිලට ගැනීමට දුරබැහැර ගෙවා නගරයට යාමට සිදුවීමත් මත පුවත්පත් කියවීමේ පුරුද්ද ඉතා අඩු තත්ත්වයක පවතී. ගෘහ ඒකක 85.1% කම පරිගණක භාවිතය පිළිබඳව දැනුමක් ඇති කිසිදු සාමාජිකයෙකු නොවීය. ගෘහ ඒකක වලින් 3.5% ක් තුල පරිගණක භාවිතා කළ හැකි එක් අයෙකු පමණක් සිටින බවට වාර්තා විය.

## තුන්වන පරිච්ඡේදය

# ආර්ථික කටයුතු, රැකියාවන්හි ස්වභාවය හා ආදායම

මෙම පරිච්ඡේදය තුලින් වත්තේගෙදර ගමේ සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳව විග්‍රහයක් ගෙනහැර දක්වයි. මේ යටතේ තෝරාගත් නියැදිය ආශ්‍රිතව ප්‍රධාන වශයෙන් පහත සඳහන් තොරතුරු විග්‍රහ කර ඇත.

3.1 සේවා නියුක්තිය හා ශ්‍රම බලකාය
3.2 ගෘහස්ත ආදායම්
3.3 ඉතිරිකිරීම් හා ණයගැතිභාවය

3.1.1. සේවා නියුක්තිය

වගුව 3.1 නියැදි ජනගහණය කාර්යය අනුව වර්ග කිරීම

| කාර්යය | සංඛ්‍යාව | | එකතුව | % |
|---|---|---|---|---|
| | පි | ගැ | | |
| 1. රැකියා නියුක්ත | 151 | 93 | 244 | 54.7 |
| 2. රැකියා වියුක්ත (බලාපොරොත්තු වන) | 7 | 5 | 12 | 2.7 |
| 3. රැකියා වියුක්ත (බලාපොරොත්තු නොවන) | 2 | 4 | 6 | 1.3 |
| 4. ශිෂ්‍යයන් | 40 | 54 | 94 | 21.1 |
| 5. විශ්‍රාමික, මහලු, දුබල, ළදරු | 27 | 28 | 55 | 12.3 |
| 6. ගෘහණිය | | 35 | 35 | 7.8 |

$$\text{යැපෙන්නන් සංඛ්‍යාව (එක් අයෙකුට)} = \frac{\text{රැකියා වියුක්ත + ගෘහණියන් + ශිෂ්‍යයන් + මහලු + ළදරු + දුබල}}{\text{රැකියා නියුක්ත}}$$

මේ අනුව මෙම වසමේ රැකියා නියුක්ත එක් අයෙකුට යැපෙන්නන් සංඛ්‍යාව 0.8 කි.

3.1.2 ශ්‍රම බලකාය කාර්යය අනුව වර්ග කිරීම

ඕනෑම සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ දී පවතින ශ්‍රම බලකාය ගැන ද අවධානයට ලක් විය යුතු කාරණාවකි. වයස 10 න් ඉහල ජනගහණය ශ්‍රම බලකායට අයත් ජනගහණයයි. ඒ අනුව නියැදිය 384 ක ශ්‍රම බලකායකින් සමන්විත වූ අතර එහි ස්ත්‍රී හා පුරුෂ සංයුතිය පිළිවෙලින් 191 හා 193 විය. එනම් ශ්‍රම බලකායේ සංයුතිය ස්ත්‍රී 49.7% ක් හා පුරුෂ 50.3 % ක් වශයෙනි. ශ්‍රම බලකායට අයත් ජනගහණය කාර්යයන් අනුව වර්ග කිරීම වගු 3.2 පෙන්වයි.

වගුව 3.2 - ශ්‍රම බලකාය කාර්යය අනුව වර්ග කිරීම

| කාර්යය | පිරිමි | % | ගැහැණු | % | එකතුව | % |
|---|---|---|---|---|---|---|
| රැකියා නියුක්ත * | 151 | 39.3 | 93 | 24.2 | 244 | 63.5 |
| රැකියා වියුක්ත | 42 | 10.9 | 98 | 25.2 | 140 | 36.5 |
| | | | | | 384 | 100.0 |

තෝරාගත් නියැදි ජනගහණයෙන් 86% ක් (384) ක් ශ්‍රම බලකායට අයත් වුනි. ඉන් 63.5% ක්ම කිසියම් රැකියාවක නියුක්ත වී සිටි අතර රැකියා වියුක්ත වීම 36.5% ක් විය. රැකියා නියුක්ත බහුතරයක් පුරුෂ පක්ෂයට අයත් වූ අතර රැකියා වියුක්ත වීම ස්ත්‍රී පක්ෂය අතර ඉහළ අගයක් (25.2%) ක් වාර්තා විය.

3.1.3 ආර්ථික කටයුතු හා ආදායම් මාර්ග

කෘෂිකර්මාන්තය හා ඒ ආශ්‍රිත රැකියාවන්හි නියැලීම, ගමේ බහුතරයකගේ ප්‍රධාන ජීවනෝපාය වේ. ගොඩ ඉඩමවල ඇති අපනයන බෝග, රබර්, තේ, පොල්, වගාවන් බහුතරයකගේ ප්‍රධාන ආදායම් මාර්ග වන අතර වී වගාව වානිජ මට්ටමක නොමැත. සුලු පිරිසක් වී වගාවේ නියැලී ඇති අතර ලබාගන්නා අස්වැන්න පාරිභෝජනයට පමණක් සෑහේ. ග්‍රාමසේවා නිලධාරී වාර්තා අනුව වත්තේගෙදර වසමේ සමස්ත ජනගහණයෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශවල රැකියාවල නියුතු අය 26 දෙනෙකි. එසේම වසමේ 25 දෙනෙකු ස්වයං රැකියාවල නියුක්ත වී සිටී. ස්වයං රැකියා වශයෙන් මොවුන් පෙදරේරු කර්මාන්තය, කෘෂි ද්‍රව්‍ය එකතු කිරීම, දැව ඉරීම, දැව ප්‍රවාහනය හා වඩු කර්මාන්තය වෙළඳාම, කුඩා වී මෝල් පවත්වාගෙන යාම වැනි රැකියා මාර්ගවල නියැලී සිටී.

3.1.4 ශ්‍රම බලකායෙහි රැකියාවන්හි ස්වභාවය

ප්‍රධාන වශයෙන් කෘෂිකර්මය ජීවිකාව කරගත් බහුතරයක් තම ජීවනෝපාය සඳහා ද්විතියික රැකියාවක ද නියැලී සිටීම මෙම ගමේ දක්නට ලැබුන සුවිශේෂී දෙයකි. ප්‍රාථමික ආදායම් මාර්ග ප්‍රමාණවත් නොවීම මත මෙසේ ද්විතියික රැකියා සඳහා යොමුවීමට ප්‍රධාන හේතුවයි. නියැදි ජනගහණයේ ප්‍රාථමික හා ද්විතියික

රැකියා නියුක්තිය වගු 3.3. න් දක්වයි. මෙහිදී ප්‍රධාන රැකියාව ලෙසෙ සලකා ඇත්තේ වැඩි ආදායමක් ලබාගන්නා වෘත්තිය නොව වැඩි කාලයක් ගත කරන වෘත්තියයි.

වගුව 3.3 - ප්‍රාථමික හා ද්විතියික රැකියාවල නියැලීම

| | ප්‍රාථමික රැකියා | | ද්විතියික රැකියා | |
|---|---|---|---|---|
| රැකියාවන් | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| ගොවිකාරක | 50 | 20.5 | 9 | 19.1 |
| ගොවිපල සහායක | 66 | 27.0 | 5 | 10.6 |
| කෘෂි කම්කරු | 15 | 6.1 | 14 | 29.7 |
| කෘෂි නොවන කම්කරු | 28 | 11.4 | 8 | 17.0 |
| ස්වයං රැකියා | 22 | 9.0 | 3 | 6.4 |
| පොලිසිය/හමුදා | 10 | 4.1 | | |
| රාජ්‍ය අංශයේ සේවා | 9 | 3.7 | | |
| පෞද්ගලික අංශය | 19 | 7.8 | | |
| ශිල්පීය | 15 | 6.1 | 8 | 17.0 |
| විදේශ රැකියා | 9 | 3.7 | | |
| ව්‍යාපාරික | 1 | 0.4 | | |
| | 244 | 100 | 47 | 100 |

වත්තේගෙදර වසමේ සමීක්ෂණයට තෝරාගත් නියැදියෙන් යම් රැකියාවක නියුක්ත ජනගහණයෙන් 20.5% ක් කෘෂිකර්මය තම ජීවනෝපාය කරගෙන ජීවත් වෙති. කෘෂි හා කෘෂිකාර්මික නොවන කම්කරු වෘත්තීය ප්‍රාථමික වෘත්තීය වශයෙන් නියැලී ඇති පිරිස 43 (17.6%) කි. එසේම නියැදි ජනගහණයෙන් 9 දෙනෙකු (3.7%) රාජ්‍ය අංශයේ රැකියාවල නියුක්තව සිටි අතර පොලිසිය සහ හමුදා සේවයේ 10 දෙනෙකු (4.1%) සේවයේ නියැලී සිටී. විදේශ රැකියාවන්හි නියැලී සිටින අය ද මෙහි වාර්තා විය. 9 (3.7%) දෙනෙකු විදේශ රැකියාවල නියැලී සිටි අතර ඉන් 7 දෙනෙකුම කාන්තාවන් විය. මේසන් වැඩ, වඩු කර්මාන්තය වැනි ශිල්පීය රැකියාවන් තම ප්‍රාථමික රැකියාව ලෙස තෝරාගත් පිරිස 15 (6.1% ක්) විය.

3.1.5 – ශිල්පීය දක්ෂතා/ලබාගෙන ඇති විශේෂ පුහුණුවීම්

වැඩිහිටි සාමාජිකයන්ගේ විවිධ හැකියාවන් හා දක්ෂතා පිළිබඳව ද සමීක්ෂණයේ දී තොරතුරු විමසන ලදී. ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමේදී ග්‍රාමීය ජනතාව උදෙසා කුමන හෝ ආදායම් උත්පාදන වැඩසටහන් සැලසුම් කිරීම සඳහා වැදගත් වන්නකි. ග්‍රාමීය ජනතාවගේ විවිධ හැකියාවන් පිළිබඳව අවබෝධය ලබා තිබීම. මේ අනුව මෙම සමීක්ෂණයේ දී අනාවරණය වු පරිදි නියැදියෙන් 37 දෙනෙකු පමණක් කුමන



21361

හෝ ශිල්පීය දක්ෂතාවයකින් යුක්ත බවට වාර්තා කර තිබුනි. මෙම වාර්තාකල පිරිසෙන් 24.3% ක් (9) ඇඳුම් මැසීම/මැහුම් පාඨමාලාවල දක්ෂතාවයක් ඇති බව. වාර්තා කර තිබූ අතර වඩු කර්මාන්තය හා පෙදරේරු කර්මාන්තය සඳහා හැකියාව ඇති අය 29.7% ක් (11) විය. පැදුරු හා මලු විවීම වැනි දක්ෂතා ඇති ස්වල්පයක් පමණක් වූ අතර එය ප්‍රතිශතයක් වශයෙන් 10.8% (4) කි.

විශේෂ පුහුණුවීම් ලබාගත් අය ද නියැදියෙහි 28.9% ක් (37ක්) විය. එසේම රියදුරු, පරිගණක, වායු සමීකරණ, ශිල්පී පුහුණුව කාර්මික පුහුණුව, ආහාර නිෂ්පාදනය ඇඳුම් මැසීම, කුඩා ව්‍යාපාර, පෙර පාසල්, පුහුණු වැනි විශේෂ පුහුණු ලබාගත් 28.9% ක් නියැදියෙහි විය. මේ අතරින් ඇඳුම් මැසීමේ වෘත්තිය පුහුණුව ලබාගත් සංඛ්‍යාව 6 ක් (16.2%) විය. සාමාජිකයින් 13 දෙනෙකු වෙල්ඩින් කාර්මික, වායු සමීකරණ පුහුණුව වැනි තාක්ෂණ ශිල්පීය පුහුණු ලබාගෙන තිබූ බවට වාර්තා විය.

පිළිතුරු දුන් බොහෝ අයකු පැවසුවේ මේ හැකියාවන් අවිධිමත් මාර්ගවලින් ලබාගෙන ඇති හැකියාවන් බවයි. මෙහිදී පොල් අතු විවීම, පැදුරු විවීම වැනි හැකියාවන් ගෙන් යුක්ත ස්ත්‍රීන්ගේ එම හැකියාවන් තම ආදායමට විශාල දායකත්වයක් නොදක්වයි. එබැවින් එම හැකියාවන් යම් ආදායම් උත්පාදන වැඩසටහන් ඇරඹීම සඳහා යෙදීමට ද හැකියාව පවතී. එසේ වුවත් එය ඒ සඳහා යම් අලෙවිපලක තිබේ ද යන කාරණය මත රඳා පවතින්නකි.

3.2 ආදායම්

මේ සමීක්ෂණයේ දී ලබාගත් ආදායම් දත්ත 2006 ජුලි මාසයෙන් (2005 අගෝස්තු සිට 2006 ජුලි මස) අවසන් වන මාස 12 පදනම් කරගෙන ලබාගන්නා ලදී. එබැවින් කෘෂිකාර්මික ආදායම් ගණනය කිරීමේ දී 2005 යල කන්නය හා 2005/2006 මහ කන්නයට අදාලව කෘෂිකාර්මික ආදායම් ගණනය කර ඇත. ආදායම් දත්තයන් ලබාගැනීමේ දී බොහෝ විට ආදායම් පිළිබඳව අඩු අගයන් ලබාදීමේ උත්සාහයන් තුල මෙම දත්ත ලබා ගැනීමට සිදුවිය. ගෘහස්ත ඒකකයන් විසින් ලබාගන්නා ආදායම් පහත සඳහන් පරිදි කාණ්ඩ 3 ක් යටතේ විශ්ලේෂණය කර පෙන්වා දී ඇත.

1. ආදායම් මට්ටම
2. ආදායමේ බෙදීයාම
3. ආදායම් සංයුතිය

මෙහිදී ගොවිපල ආදායම් හා ගොවිපල නොවන ආදායම් වශයෙන් ප්‍රධාන කාණ්ඩ දෙකකට ආදායම් බෙදා දැක්විය හැක. පවුලේ සාමාජිකයන්ගේ මුලු ආදායම් ගණනයේ දී විවිධ රැකියාවලින් ලද ආදායම් කෘෂිකාර්මික ආදායම් සත්ව නිෂ්පාදන වලින් ලැබෙන ආදායම් හා වෙනත් සියලු මාර්ගවලින් ලබාගන්නා ඇදායම් වශයෙන් , වශයෙන් විවිධ ආදායම් වර්ග කර ලබා ගන්නා ලදී.

### 3.2.1 ලබාගන්නා ආදායම් මට්ටම අනුව වර්ගීකරණය

සියලු ආදායම් මාර්ගවලින් නියැදියේ ගෘහ ඒකකයන් ලබාගන්නා මුලු ආදායම් සලකා වාර්ෂික සාමාන්‍ය අගය බැලීමේ දී, ගෘහයක සාමාන්‍ය වාර්ෂික ආදායම රු. 133715 ක් විය. ඒ අනුව මාසික සාමාන්‍ය ආදායම රු. 11143 කි. ගෘහස්ත වාර්ෂික ආදායම රු.5640 සිට රු. 742200 දක්වා වන විශාල පරාසයක් තුල පිහිටා තිබූ බව ද ලබාගත් දත්ත අනුව පෙන්නුම් කරයි.

### 3.2.2. ආදායම් බෙදීයාම අනුව වර්ගීකරණය

ලබාගන්නා මුල්‍යමය ආදායම සමාජ ආර්ථික තත්ත්වය හා ධනය බෙදීයාම පෙන්වන නිර්නායකයක්ම නොවේ. ඉඩම් අයිතිය මෙන්ම ගෘහ හා කෘෂි උපකරණ අයිතිය ද නිශ්චල මෙන්ම චංචල දේපල අයිතිය ද යම් සමාජයක සමාජ ආර්ථික තත්ත්වය හා ධනය බෙදී යාම පෙන්නුම් කරන තවත් වැදගත් නිර්නායකයන්ට අයත් වන්නකි. සමීක්ෂණයේ දී නියැදි පවුල්වල සියලු ආදායම් මාර්ගවලින් ලබාගන්නා වාර්ෂික ආදායම් බෙදීයාම වගුව 3.4 න් දක්වයි.

වගුව 3.4 – ආදායම් කාණ්ඩ අනුව ගෘහයන් සහ ආදායම් බෙදීයාම ප්‍රතිශතයක් වශයෙන්

| ගෘහස්ත වාර්ෂික ආදායම රුපියල් | නිවාස % | සමුච්චිත අගය ප්‍රතිශතයක් වශයෙන් % | වාර්ෂික ආදායම % | සමුච්චිත ආදායම % |
|---|---|---|---|---|
| 5000-10000 | 2.6 | 2.6 | 0.1 | 0.1 |
| 10001-15000 | 4.4 | 7.0 | 0.4 | 0.5 |
| 15001-25000 | 5.3 | 12.3 | 0.8 | 1.3 |
| 25001-50000 | 15.8 | 28.0 | 4.3 | 5.6 |
| 50001-75000 | 16.7 | 44.8 | 7.9 | 13.5 |
| 75001-100000 | 8.8 | 53.5 | 5.6 | 19.1 |
| 100000 > | 46.5 | 100.0 | 80.9 | 100.0 |
| එකතුව | 100.0 | | 100.0 | |

ඉහත දත්ත අනුව පෙන්වා දෙන දෙයක් නම් නියැදියෙන් 46.5% ක්ම රු. 100,000 ට වඩා වැඩි වාර්ෂික ආදායමක් ලබන බවය. පවුල් 53 ක් මේ කාණ්ඩයට අයත් විය. එසේම වාර්ෂික ආදායම රු. 25000/- ට වඩා අඩුවෙන් ලබාගන්නා නියැදි ප්‍රතිශතය 12.3% ක් විය.

වාර්ෂික ආදායම් බෙදීයාම තවදුරටත් විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන වැදගත් කරුණක් නම් මුලු ගෘහයන් සංඛ්‍යාවෙන් 46.5% ක් වූ ඉහළ ආදායම් කාණ්ඩය (රු. 1000.00 ට වැඩි) සමස්ත මුලු වාර්ෂික ආදායමින් 80.9% ක් ම ලබා ගන්නා බවය. එසේම අඩුම ආදායම් කාණ්ඩ 2 ට අයත් ගෘහයන් සංඛ්‍යාව සමස්ත නියැදි

සංඛ්‍යාවෙන් 7% ක් වූ අතර ඔවුන් ලබාගන්නේ වාර්ෂික සමස්ත ආදායමෙන් 0.5% % ක් පමණි. රජයේ හා පෞද්ගලික රැකියා, මැදපෙරදිග රැකියා, වැවිලි බෝග සහ මිශ්‍ර බෝග වගාවන් මෙසේ ඉහළ ආදායම් ලබාගන්නා ප්‍රධාන ආදායම් මාර්ග ලෙස වාර්තා වුනි.

රු. 1000,00.00 ඉහළ වාර්ෂික ආදායමක් වාර්තා වූ නිවාස ඒකක 53 හි සාමාන්‍ය වාර්ෂික ආදායම රු. 232703.00 ක් විය. මෙම පවුල් ඒකකවල ආදායම් ලබාගන්නා මාර්ග බහුල වීමත්, රජයේ හා පෞද්ගලික අංශයේ රැකියාවල නියැලි සාමාජිකයන් සිටීමත්, මැද පෙරදිග රැකියාවල යෙදීම තුලිනුත් වැවිලි බෝග හා මිශ්‍ර බෝග මෙන්ම ව්‍යාපාරික කටයුතුවල යෙදී ඇති අය නිසාත් මෙම පවුල් ඒකකවල ඉහළ ආදායමක් පෙන්නුම් කරයි.

රු. 1000,00.00 ට වඩා අඩු ආදායම් ලාභී පවුල් ඒකක 61 ක් ලබන්නේ සමස්ත ආදායමින් 19.1% ක් පමණි. මෙම පවුල්වල සාමාන්‍ය වාර්ෂික ආදායම රු. 47710 ක් විය. මෙම පවුල්වල ප්‍රධාන ආදායම් මාර්ගයන් ලෙස වී වගාව, මිශ්‍ර බෝග වගාව, කෘෂි කම්කරු රැකියා ලෙසට වාර්තා වුනි.

3.2.3. ගෘහස්ත ආදායමේ සංයුතිය

වාර්ෂික ආදායම්වලට විවිධ මාර්ගවලින් ලැබෙන ආදායම් මගින් කෙරෙන දායකත්වය පිළිබඳ විශ්ලේෂණය ක්‍රම දෙකක් ඔස්සේ කළ හැක. එනම් එක් එක් මාර්ගවලින් ආදායම් ලබන ගෘහස්ත ප්‍රතිශතය හා එක් එක් කාර්යයන්ගෙන් ලැබෙන ආදායම් මුලු ආදායමේ ප්‍රතිශතයක් වශයෙනි. මෙහිදී ආදායම් මාර්ග කොටස් කිහිපයකට කඩා විශ්ලේෂණයට භාජනය කර පෙන්වා දී ඇත.

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ආදායම් ප්‍රධාන වශයෙන් කොටස් 4 කට බෙදා විශ්ලේෂණයට භාජනය කරන ලදී, එනම් වී වගාවෙන් ලැබෙන ආදායම්, එළවලු වගාවෙන් ලැබෙන ආදායම් හා වැවිලි බෝගවලින් ලබන ආදායම්, වෙනත් බෝගවලින් ලබන ආදායම් වශයෙනි. මෙහිදී වැවිලි බෝග යටතට තේ, පොල්, රබර් වගාවන් ද වෙනත් බෝග යටතට කරාබු, ගම්මිරිස්, වැනි මිශ්‍ර වගාවන් ද අයත් වේ. රබර් වගා කරුවන්ගේ රබර් වතුවල කිරි කැපීමේ නියුතු අය ඒ සඳහා වැටුප් ලබනුයේ දෛනික වැටුප් නොව රබර් නිෂ්පාදනයේ දෙකෙන් පංගුවක් වශයෙනි. මෙම කණ්ඩායමට අයත් වන අයගේ ආදායම් ද මෙහිදී කෘෂිකාර්මික කම්කරු රැකියා ලෙස සලකා ගණනය කර ඇත. එහිදී එම ගෘහස්ත ආදායම් මාර්ග බෙදී යාම පිළිබඳවත්, එම ආදායම් කාණ්ඩයන්ට හිමි ගෘහයන් සංඛ්‍යාවක් වගුව 3.5 න් පෙන්නුම් කරයි.

වගුව 3.5 - විවිධ මාර්ගවලින් ආදායම් ලබන ගෘහස්තයන් සමස්තයේ ප්‍රතිශතයක් වශයෙන් සහ ගෘහස්ත ආදායම් සංයුතිය බෙදීයාම ප්‍රතිශතයක් වශයෙන්

| ආදායම් මාර්ග | වාර්තාකල ගෘහයන් ගණන ප්‍රතිශතය % | ආදායමේ සංයුතිය ප්‍රතිශතය % |
|---|---|---|
| 1. වී වගාව | 55.0 | 4.0 |
| 2. වැවිලි බෝග වගාව (තේ, රබර්, පොල්) | 65.8 | 5.4 |
| 3. එළවලු බෝග වගාව | 1.7 | 0.0 |
| 4. වෙනත් සියලු බෝග (කරාබු, ගම්මිරිස් වැනි) | 62.3 | 20.6 |
| 5. රජයේ රැකියා | 14.0 | 18.1 |
| 6. පෞද්ගලික රැකියාවන් | 15.8 | 7.4 |
| 7. කෘෂිකාර්මික කම්කරු රැකියා | 23.7 | 5.0 |
| 8. කෘෂි නොවන කම්කරු රැකියා | 31.6 | 8.5 |
| 9. පුහුණු ශ්‍රමික රැකියා | 15.8 | 7.2 |
| 10. ස්වයං රැකියා | 24.5 | 8.8 |
| 11. මැද පෙරදිග රැකියා | 7.0 | 7.3 |
| 12. වෙනත් (උපකරණ කුලියට දීම, විශ්‍රාම වැටුප්, ගස් විකිණීම, කිරි කැපීම වැනි) | 14.0 | 6.5 |

වත්තේගෙදර වසමේ නියැදියේ සියලු ආදායම් මාර්ග වලින් ලබාගන්නා ආදායම් වල සංයුතිය ඉහත වගුව 3.5 න් පෙන්නුම් කරයි. මෙහිදී ආදායම් මාර්ග 12 ක් අනුව ආදායම් සංයුතිය විශ්ලේෂණයට පහසු වන පරිදි වෙන් කර දක්වා ඇත. වගුව අනුව සමස්ත ආදායමින් ඉහළම ප්‍රතිශතයක් (20.6%) ක්ම කරාබු, ගම්මිරිස් වැනි මේ ප්‍රදේශයට ආවේනික බෝගවලින් ලබන ආදායම් නියෝජනය කරයි. එසේම එය නියැදියෙහි 62.3% කගේම ආදායම් මාර්ගයක් විය. රජයේ රැකියා ද ඉහළ ආදායම් ප්‍රතිශතයක් දක්වන ලද අතර (18.1%) වාර්තා කලේ නියැදියෙන් 14.0% ක් පමණි. ස්වයං රැකියා සහ කෘෂි නොවන රැකියා වලින් ලබන ආදායම ද මුලු ආදායම් සංයුතියෙන් පිළිවෙලින් 8.8% හා 2.5% ක ප්‍රතිශතයේ පෙන්නුම් කළ අතර මැදපෙරදිග රැකියාවලින් ලබන ආදායම ද ඉහළ තත්ත්වයක (7.2%) පැවතුනි. එම ආදායම වාර්තා කර තිබුනේ නියැදියෙන් 7% ක් වන සුලු ප්‍රමාණයකින් වීම තුලින් පෙන්නුම් කරන්නේ ඉහළ ආදායමක් ඒ මගින් ලබාගන්නා බවකි. වී වගාව ආදායම් මාර්ගයක් වශයෙන් නියැදියෙන් 55% කගේම මාර්ගයක් වුවත් එය සමස්ත ආදායමට 4.0% ක පමණක් දායකත්වය දක්වයි. මින් පැහැදිලි වන්නේ වී වගාව ව්‍යාපාරික මට්ටමින් සිදු නොවන, ආදායමක් නොලබන පාරිභෝගික මට්ටමක පවතින බවකි. තේ, පොල්, රබර් වැනි වැවිලි බෝගවලින් ආදායම් ලබාගැනීම ගෘහයන්ගෙන් 65.8% කම ආදායම් මාර්ගයන් විය. එසේ වුවත් සමස්ත ආදායමට දායකත්වය 5.4% ක් පමණි. මෙම වගාවන්ගෙන් තේ හා රබර් සුලු පිරිසකට පමණක්

අයත්ව තිබූ කුඩා ඉඩම් විය. පොල් බොහෝ ඉඩම්වල වැවී ඇති බෝගයක් වුවත් ආර්ථිකමය වාසියක් ඉන් නොලැබීම මත මෙසේ වැවිලි බෝගවලින් ලැබෙන ආදායම අඩු මට්ටමක පැවතීමට හේතු විය.

3.2.4 සමෘද්ධි ලාභීන්.

පවුල් 254 ක් වන මෙම ගමෙහි සමෘද්ධි ලාභී පවුල් 106 ක් එනම් මුළු පවුල් සංඛ්‍යාවෙන් 41.1% ක් සමෘද්ධි ප්‍රතිලාභ ලබති. එහෙත් මෙය පවතින්නේ අරනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමෘද්ධි ප්‍රතිලාභී ප්‍රතිශතය වන 50% කට වඩා අඩු මට්ටමකිනි.

මෙම සමෘද්ධි ලාභී පවුල් වලින් බහුතරයක් (47 ක්) රු. 210 ක මාසික සමෘද්ධි දීමනා ලබන්නෝ වෙති. රු. 415 ක දීමනා ලාභීන් 42 ක් වන අතර රු. 900 ක දීමනාවක් ලබන්නේ පවුල් 13 ක් පමණි.

3.3.1 ඉතිරිකිරීම්.

බැංකු වැනි විධිමත් ක්‍රම ඔස්සේ ඉතිරිකිරීම් ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳවත් ඉතිරිකිරීම් පිළිබඳවත් සමීක්ෂණයේ දී තොරතුරු ලබාගන්නා ලදී. සමෘද්ධිලාභී පවුල් සියල්ලම පාහේ සමෘද්ධි බැංකුව සමග අනිවාර්ය ඉතිරිකිරීම් ක්‍රියාත්මක කරනු ලබයි. සමෘද්ධි බැංකු කාර්යාලය උඩුවේවෙල පිහිටා ඇති අතර ඉතිරිකිරීම් කටයුතු මෙන්ම ණය ගනුදෙනු ද එම බැංකු ශාඛාව සමග සිදු කරනු ලබයි. මීට අමතරව විවිධ බැංකු ආයතන සමග ගිණුම් පවත්වාගෙන යාම පිළිබඳව වගු අංක 3.6 න් පෙන්නුම් කරයි.

වගුව 3.6 - ඉතිරිකිරීම්

| බැංකුව | ඉතිරිකිරීමේ ගිණුම් | | ස්ථිර තැන්පතු | | ජංගම ගිණුම් | | ළමා ගිණුම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | පවුල් සංඛ්‍යාව | % | පවුල් සංඛ්‍යාව | % | | | | |
| සමෘද්ධි බැංකුව | 38 | 33.0 | - | | | | 1 | 1.3 |
| මහජන බැංකුව | 36 | 31.0 | - | | 3 | 2.6 | 14 | 12.3 |
| සබරගමු සංවර්ධන | 29 | 25.4 | - | | 1 | 1.3 | 9 | 7.9 |
| ලංකා බැංකුව | 27 | 23.7 | | | | | 3 | 2.6 |
| ජාතික ඉ. බැංකුව | 29 | 25.4 | 2 | 1.7 | | | 1 | 1.3 |
| ග්‍රාමීය බැංකුව | 8 | 7.0 | | | | | | |
| H N B | | 5.3 | | | | | | |

සාමාජිකයින් ගනුදෙනු පවත්වාගෙන යනු ලබන බැංකු අතර සමෘද්ධි බැංකු සංගමය, මහජන බැංකුව, සබරගමු සංවර්ධන බැංකුව, ලංකා බැංකුව හා ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ප්‍රමුඛස්ථානයක් ගනී. මීට

අමතරව සණස, ග්‍රාමීය බැංකුව, ගොවිජන සංවර්ධන බැංකුව යන ආයතන සමග ද ගිනුම් පවත්වාගෙන යන සුලු සංඛ්‍යාවක් සිටින ලද අතර, පෞද්ගලික බැංකු සමග ගිණුම් පවත්වාගෙන යනු ලබන්නේ ඉතා සුලු ගණනක් පමණක් වාර්තා වුනි.

ග්‍රාමීය සමාජවල බහුලව දක්නට ලැබෙන සීට්ටු වැනි අවිධිමත් ඉතිරිකිරීම් ක්‍රම මෙම ගම තුල ද දක්නට ලැබුනි. විශේෂයෙන් කාන්තා පක්ෂය මෙවැනි ඉතිරිකිරීම්වලට පෙළඹී ඇත. සීට්ටුවලට සම්බන්ධ වී ඇති අය වාර්තා වුනේ නිවාස 16 කින් (14.0%) කින් පමණි.

### 3.3.2 ණයගැති භාවය

විවිධ හේතු මත පසුගිය වසර 2 ක කාලය තුල දී ණය ලබාගත් මාර්ග මෙන්ම ණය ප්‍රමාණයන් පිළිබඳව ද මෙහිදී අවධානයට ලක් විය. (වගුව 3.7) මීට අමතරව වසර 2 කට පෙර ලබාගත් එහෙත් තවමත් ගෙවා අවසන් කර නොමැති ණය පිළිබඳව ද විශේෂ අවධානය යොමු කරන ලදී. (වගුව 3.8)

වගුව 3.7 - ණයගැති භාවය

| ණයගැති මට්ටම | ප්‍රකාශිත සංඛ්‍යාව | මුලු ණය මුදල | % |
|---|---|---|---|
| 1000 - 2000 | 1 | 1000.00 | 0.1 |
| 2001 - 5000 | 1 | 4000.00 | 0.3 |
| 5001 - 7500 | 6 | 32000.00 | 2.7 |
| 7501 - 10000 | 0 | – | – |
| 10001- 20000 | 15 | 185000.00 | 15.7 |
| 20001- 50000 | 19 | 595000.00 | 50.3 |
| 50000 > | 5 | 365000.00 | 30.9 |
| එකතුව | 47 | 1182000.00 | 100.0 |

වගුව 3.8 – ණය ලබාගත් මාර්ග

| | සබරගමුව සංවර්ධන බැංකුව | සමෘද්ධි බැංකුව | මහජන බැංකුව | ලංකා බැංකුව | සණස | නිවාස බැංකුව | හිතවතුන් | ජා. ඉ. බැංකුව | වැඩපල | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ණය සංඛ්‍යාව % | 25 | 10 | 2 | 1 | 2 | 2 | 21 | 2 | 1 | 47 |
| ගත් මුදල % | 53.9 | 9.3 | 9.3 | 5.5 | 9.5 | 2.5 | 0.9 | 4.9 | 4.2 | 100.00 |
| සාමාන්‍යය | 25480 | 11000 | 55000 | 65000 | 56000 | 14500 | 5500 | 58000 | 55000 | 25114 |

නියැදියේ සාමාජිකයින් ලබාගත් ණය වශයෙන් වාර්තාවේ තිබුනේ විවිධ මාර්ගවලින් ලබාගත් ණය 47 ක් පමණි. රු. 20000 – 50000 අතර වූ ණය සංඛ්‍යාව 19 ක් විය. එසේම 10001 – 20000 අතර ණය සංඛ්‍යාව 15 ක් විය. ණය ලබාගත් මාර්ග අතර සබරගමු සංවර්ධන බැංකුව ප්‍රධාන ණය සපයන්නා වී තිබුනි. මුලු ණය සංඛ්‍යාවෙන් 25 ක්ම (53.2%) එම බැංකුව විසින් නිකුත් කර තිබුනි. සමෘද්ධි බැංකුව මගින් ද ණය 10 ක් (21.3%) ක් නිකුත් කර තිබුනි. ලබාගෙන තිබූ සියලු ණය මුදල් වලින් 53.9% ක්ම සබරගමුව බැංකුව මගින් ලබා දී තිබූ ණය වූ අතර සමෘද්ධි බැංකුව මගින් මුලු ණය මුදල්වලින් 9.3% ක් සඳහා දායක වී තිබුනි. පොලී අනුපාතය ණය ලබාගන්නා කාරණය සහ බැංකුව අනුව වෙනස් වන සාධකයයි. ලබාගෙන තිබූ ණය සංඛ්‍යාවෙන් 45% ක්ම නිවාස ඉදිකිරීම් සඳහා ලබාගත් ණය බවට වාර්තා වුනි.

සමෘද්ධි බැංකුව හරහා ක්‍රියාත්මක වන ණය.

සමෘද්ධි බැංකුව හරහා විවිධ ණය ක්‍රම ක්‍රියාත්මකව පවතින අතර. ව්‍යාපෘතීන් සඳහා රු. 135000 ක ණය මුදල් නිකුත් කර තිබුනි. (30.06.06 දිනට) තේ පැල වගාව, වඩු කර්මාන්තය, අත්කම් නිෂ්පාදනය, සිල්ලර වෙළඳාම වැනි ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා මෙම ණය මුදල් නිකුත් කර තිබුනි. ලබාගත් ණය මුදල් 5000 – 15000 වශයෙන් පැවති අතර 14% -18% අතර වූ පොලී අනුපාත අනුව ණය නිකුත් කර ඇත.

## 4 පරිච්ඡේදය

# නිවාස තත්ත්වය හා පහසුකම්

මෙම පරිච්ඡේදය තුලින් අධ්‍යයන ප්‍රදේශය තුල ඇති නිවාස ඒකකවල ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් වූ විශ්ලේෂණයක් ගෙන හැර දක්වයි. මෙහිදී ගෘහ ඒකකයක් ලෙස විග්‍රහ කර ඇත්තේ යම් පවුල් ඒකකයක් පදිංචි ගොඩනැගිල්ලක් හෝ ඉන් කොටසක් අයත් වන ඒකකයකි.

### 4.1 නිවාස අයිතිය

ග්‍රාම නිලධාරී වාර්තා අනුව වත්තේගෙදර ග්‍රාම නිලධාරී වසමේ සමස්ත නිවාස ඒකක ප්‍රමාණය 249 කි. පදිංචි පවුල් ඒකක ප්‍රමාණය 254 ක් වන අතර ඉන් 248 කටම ස්ථිර අයිතිය ඇති නිවාසයක් හිමිය. පවුල් 06 ක් පමණක් කුලියට පදිංචි වී ඇති බව වාර්තා වුනි. සමීක්ෂණයේ දී තෝරාගත් නියැදියේ නිවාස තත්ත්වය පිළිබඳවත් පහසුකම් හා නිවාස ඒකකවලට හිමි උපකරණ, යානවාහන, පිළිබඳවත් තොරතුරු විමසා තිබීම මගින් වත්තේගෙදර ගමේ සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳව අදහසක් ලබාගත හැකිය. සමීක්ෂණය සඳහා තෝරාගත් නියැදියෙන් 85.1% (97) ම තමනට අයත් නිවාසයකට හිමිකම් කියනු ලබන අතර හවුල් අයිතිය වාර්තා වුනේ 12.3% (14) ක් පමණි.

### 4.2 නිවාස තත්ත්වය.

ග්‍රාමීය සංවර්ධන වැඩසටහනක දී අවධානයට ලක් කළයුතු කරුණකි, ග්‍රාමීය ජනතාවගේ නිවාසවල තත්ත්වය. නිවාස තත්ත්වය අවශ්‍යයෙන්ම එහි පදිංචි අයවලුන්ගේ ආදායම් තත්ත්වය පෙන්නුම් කරන සාධකයක්ම නොවේ. එසේ වුවත් සංඛ්‍යාත්මක වශයෙන් හා ප්‍රමාණාත්මක වශයෙන් නිවාසවල තත්ත්වය පිළිබඳව සමීක්ෂණයේ දී තොරතුරු රැස් කරගති. නිවාස ගොඩනැගීමේදී බිත්ති, වහළ හා බිම සඳහා භාවිතා කරන ලද අමුද්‍රව්‍ය අනුව මෙහි නිවාස ව්‍යාප්ත වී ඇති අන්දම වගුව 4.1 න් පෙන්නුම් කරයි.

වගුව 4.1 - නිවාස ගොඩනැගීමට භාවිතා කල ද්‍රව්‍ය අනුව නිවාසවල ව්‍යාප්තිය

| | | සංඛ්‍යාව | % |
|---|---|---|---|
| ගෙබිම | 1. සිමෙන්ති | 81 | 71.1 |
| | 2. ටෙරාසෝ/ටයිල් | 2 | 1.8 |
| | 3. ගොම/මැටි | 31 | 27.2 |
| බිත්ති | 1 ගඩොල්/සිමෙන්ති | 84 | 73.7 |
| | 2 වෙනත් ගල් | 12 | 5.4 |
| | 3 මැටි/වරිච්චි | 18 | 15.8 |
| වහළ | 1 උළු | 94 | 82.5 |
| | 2 ටකරන් | 19 | 16.7 |
| | 3 පොල්අතු හෝ වෙනත් | 1 | 0.9 |

නිවාසවලින් 82.5% ක්ම වහළය සඳහා උළු/ඇස්බැස්ටස් වැනි ස්ථිර සෙවිලි වර්ග භාවිතා කර තිබුනි. පොල් අතු/පිදුරු වැනි ද්‍රව්‍ය භාවිතා කර තිබුනේ නියැදියෙන් එක් නිවාසයක පමණි. එසේම බිත්ති බැඳීම සඳහා ගඩොල්/සිමෙන්ති ගඩොල් වැනි ස්ථිර ද්‍රව්‍ය යොදාගෙන තිබීම 73.9 % ක් විය. බිම සඳහා සිමෙන්ති භාවිතා කිරීම නිවාස 81 (71.1%) කින් වාර්තා වූ අතර ටෙරාසෝ/ටයිල් වැනි සුඛෝපභොගී ද්‍රව්‍ය යොදා ගැනීම නිවාස 2 කින් (1.8) වාර්තා විය. නිවාස 31 ක් (27.2%) බිම සඳහා ගොම/මැටි භාවිතා කර තිබුනි.

නිවාස ගොඩනැගීම සඳහා භාවිතා කල ද්‍රව්‍ය අනුව වර්ග කිරීමේ දී මෙම නිවාස වලින් 84.9.% (74) ක්ම ස්ථිර නිවාස ලෙස දැක්විය හැකිය. නිවාස වලින් 11.9% ක් (39) අර්ධ ස්ථිර නිවාස ලෙස ද වාර්තා වූ අතර තාවකාලික නිවාස තිබුනේ 1 ක් (2.0%) පමණි.

නිවසේ කාමර ගණන සහ නිවසේ විශාලත්වය (වර්ගඵලය) යම් ප්‍රජාවක ජීවන තත්ත්වය පිළිබිඹු කරන තවත් සාධකයකි. මේ අනුව කාමර ගණන අනුව නිවාස වර්ගීකරණය වගු 4.2 න් පෙන්නුම් කරයි.

වගු 4.2 - කාමර ගණන අනුව නිවාස වර්ග කිරීම.

| | කාමර ගණන | | | | | | | | එකතුව | සාමාන්‍ය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | සඳහන් කර නැති | | |
| සංඛ්‍යාව | 10 | 29 | 35 | 25 | 10 | 3 | 1 | 1 | 114 | 3.0 |
| ප්‍රතිශතය | 8.8 | 25.4 | 30.7 | 21.4 | 8.8 | 2.6 | 0.8 | 0.8 | 100 | |

නිවාසවලට අයත් කාමර ගණන අනුව විශ්ලේෂණය තුලින් පෙන්නුම් කලේ මෙහි නිවාස වලින් 30.7% ක් (35) කාමර 3 ක් සහිත නිවාස වීමයි. කාමර 4 ට වැඩි සංඛ්‍යාවක් ඇති නිවාස 34.2% ක් (39) විය. සාමාන්‍ය අගයන් ලෙස සැලකීමේදී නිවසක සාමාන්‍ය කාමර ගණන 3 ක් විය.

වගුව 4.3 න් ගෙබිමේ වර්ග ප්‍රමාණය අනුව නිවාස ව්‍යාප්ත වීම පෙන්නුම් කරයි.

වගුව 4.3 විශාලත්වය අනුව වර්ග කිරීම

| ගෙබිම වර්ග අඩි | නිවාස සංඛ්‍යාව | % | සමුච්චිත සංඛ්‍යාව | % |
|---|---|---|---|---|
| < 100 | 2 | 1.8 | 2 | 1.8 |
| 101 - 250 | 22 | 19.3 | 24 | 21.0 |
| 251 – 500 | 33 | 28.9 | 57 | 50.0 |
| 501 - 750 | 23 | 20.2 | 80 | 70.2 |
| 751 - 1000 | 13 | 11.4 | 93 | 81.6 |
| 1001-1500 | 13 | 11.4 | 106 | 93.0 |
| 1501 + | 8 | 7.0 | 114 | 100.00 |
| එකතුව | 114 | 100.0 | | |

මෙම වගුව අනුව පෙනී යන්නේ නියැදියේ නිවාස සංඛ්‍යාවෙන් 50% ක්ම වර්ග අඩි 500 අඩු විශාලත්වයකින් යුක්ත වූ ඒවා බවයි. එසේම නිවාස වලින් 23% ක් වර්ග අඩි 250 ට අඩු කුඩා නිවාස විය. වර්ග අඩි 1000 ට වැඩි නිවාස තිබුනේ 21 ක් (18.4.%) ක් පමණි. අරනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිවාස පිළිබඳ දත්ත සලකා බැලීමේදී විශාල වෙනසක් මෙහි දක්නට නොවීය.

නිවාසවල පදිංචි සංඛ්‍යාව අනුව නිවාස වර්ග කිරීම වගුව 4.4 න් පෙන්නුම් කරයි.

වගුව 4.4 පදිංචි සංඛ්‍යාව අනුව වර්ගීකරණය

| පදිංචි සංඛ්‍යාව | නිවාස % | % |
|---|---|---|
| 1 - 2 | 12 | 10.5 |
| 3 - 6 | 100 | 87.7 |
| 7 - 9 | 2 | 12.5 |
| 9 ට වැඩි | 0 | |

නිවාස සංඛ්‍යාවෙන් බහුතරයක (87.7%) සාමාජික සංඛ්‍යාව 3 – 6 අතර පැවතුන අතර සාමජිකයින් 9 ට වඩා ඉහළ අගයක් ගන්නා නිවාස කිසිවක් නොවීය.

## 4.3 නිවාසවලට ඇති පහසුකම්.

නාගරික ප්‍රදේශවලින් දුරස්ව කඳුකර ප්‍රදේශයක පිහිටා තිබීම හේතුවෙන් මෙම ගම නොයෙක් දුෂ්කරතාවන්ගෙන් යුක්ත ගමකි. මේ ගමේ ඇති දුෂ්කරතාවයන්ගෙන් ප්‍රමුඛස්ථානයක ගන්නේ මාර්ග අපහසුතාවයයි. වසමට අයත් භූමියෙන් 75% ක් ම උස්බිම්වලින් සමන්විතය. නිවාසවලට ලගාවීම ද දුෂ්කරය. එපමණක් නොව ගමේ ප්‍රවිශ්ඨ ස්ථානයේ සිට ගමතුල නිවෙස් කරා යාමට ඇති මාර්ග පද්ධතිය වාහන ගමනාගමනයට අසීරු තත්ත්වයක පවතී. ඉතා පටු එමෙන්ම කඳුකර ප්‍රදේශවල පිහිටා තිබීම නිසා නිතර සෝදායාමට ලක්වන නිසා ද එම මාර්ග ත්‍රිරෝද රථයක් පවා යාමට නොහැකි තත්ත්වයක පවතී. බොහෝ නිවාසවලට මෝටර් රථයකින් ලගාවීමට හැකියාවක් නොමැත. සමීකෂණයට අනුව තම නිවසට ත්‍රිවිලරයකින්වත් ලගාවිය හැකි නිවාස ඒකක තිබුනේ 46 (40.4.%) පමණි. මෙම ගමේ ඇති මාර්ග දුෂ්කරතාවය මේ තුලින් පැහැදිලිව දැකගත හැකිය. එසේම ඉහත කී මාර්ගවල අබලන් තත්ත්වය නිසාත් බොහෝ නිවාස කඳුබිම්වල පිහිටා තිබීම නිසාත් නිවාසවලට වාහනවලින් ලගාවීම අසීරු ය. ත්‍රිරෝද රථයකින්වත් ලගා විය නොහැකි බවට බහුතරයක්ම 58 (59.6% ක්) ප්‍රකාශ කර තිබුනි. මේ අයගෙන් 48 දෙනෙකුම (42.0%) වාහන ගමනාගමනයට සුදුසු මාර්ගයක් නොමැති වීම නිසා මේ තත්ත්වයට මුහුණපාන බව ප්‍රකාශ කර ඇත. දුරකතන පහසුකම් ලබාගෙන තිබුනේ නිවාස 9 ක් (7.9 %) ක් පමණි. ජංගම දුරකතන භාවිතය පිළිබඳව ද සමීක්ෂණයේ දී තොරතුරු විමසන ලද අතර නියදියෙන් 30.7% ක් ජංගම

දුරකතන භාවිතයට යොමු වී ඇත. ඉන් ජංගම දුරකතන එකක් පමණක් අයිති නිවාස ඒකක 29 ක් වූ අතර දුරකතන එකකට වඩා භාවිතා කරන ගෘහ ඒකක 6 ක් වාර්තා වුනි. තරුණ පරපුර අතර ජංගම දුරකතන භාවිතය ප්‍රචලිත වීම මේ ගමේ ද දක්නට ලැබුනි.

ග්‍රාමීය විදුලි බල යෝජනා ක්‍රමයක් මගින් 1994 දී මෙම ගම් ප්‍රදේශයට විදුලිබල පහසුකම් ලබාදී ඇති අතර ගමේ විශාල ප්‍රමාණයක් ඉන් ආවරණය වී ඇත. එබැවින් නියැදියේ බහුතරයක්ම එනම් නිවාසවලින් 78% ක්ම විදුලිබල පහසුකම් ලබාගෙන තිබුනි. මෙම ප්‍රධාන විදුලිබලය ලබාගෙන නොතිබූ ගෘහ ඒකක සංඛ්‍යාව 25 (21.9%) ක් විය. සූර්යබල පද්ධති වැනි විකල්ප විදුලික්‍රම භාවිතයක්වත් එම නිවැස්වලින් වාර්තා නොවුනු අතර ආලෝකය ලබාගැනීම සඳහා එම නිවෙස් භූමිතෙල් භාවිතා කරයි. මෙම නිවාස විදුලිබලය ලබා නොගැනීමට ප්‍රධාන හේතුවක් වී තිබුනේ ආර්ථික අපහසුතාවයයි. වගුව (4.5)

වගුව 4.5- විදුලිබලය ලබා නොගැනීමට හේතු

| | සංඛ්‍යාව | % |
|---|---|---|
| ආර්ථික අපහසුතා | 18 | 72.0 |
| තාවකාලික නිවසක් වීම | 7 | 28.0 |
| ප්‍රදේශය ආවරණය නොවීම | 3 | 12.0 |
| ඉල්ලුම් කල ද ලැබී නැත | 1 | 4.0 |
| වාර්තා නොකල | 1 | 4.0 |

## 4.4 බලශක්ති භාවිතය

මේ ප්‍රදේශය ග්‍රාමීය ප්‍රදේශයක් වීම නිසාවෙන් ඉන්ධනයක් වශයෙන් දර සුලභ ප්‍රදේශයකි. බොහෝ නිවෙස්වල තිබුනේ දර භාවිතා කරන සම්ප්‍රදායික මුලුතැන් ගෙවල් නිසා බහුතරයක් ආහාර පිසීම සඳහා ඉන්ධන වශයෙන් දර භාවිතා කරයි. එසේම බොහෝ නිවාස නවීන මුලුතැන් ගෙවල ඇති උපකරණවලින් සමන්විත නොවීය. නිවාසවල අයිති උපකරණ දෙස බැලීමේදී ද එය පැහැදිලි වේ. (වගුව 4.8 අයිති උපකරණ)

## 4.5 පානීය ජල පහසුකම්.

මූලික අවශ්‍යතාවයන්ගෙන් එකක් වන ජලය ලබාගැනීමේ හැකියාව පිළිබඳව ද සමීක්ෂණයේ දී විමසා බලන ලදී. එහිදී වැසි කාලයේ දී මෙන්ම වියලි කාලයේ දී මෙම ගමේ ජනතාව බීමට හා නෑම සඳහා ජල භාවිතය පිළිබඳව සොයා බලන ලදී.

වගුව 4.6 ජල පහසුකම්

| | වැසි කාලය | | | | වියලි කාලය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | බීමට | | නෑමට | | බීමට | | නෑමට | |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| නල මගින් | 72 | 63.0 | 55 | 48.2 | 69 | 60.5 | 49 | 43.0 |
| තමාගේ ළිඳ | 21 | 18.4 | 15 | 13.2 | 21 | 18.4 | 15 | 13.2 |
| පොදු ළිඳ | 2 | 1.8 | 1 | 0.9 | 4 | 3.5 | 1 | 0.9 |
| අසල්වැසි ළිඳ | 9 | 7.9 | 4 | 3.5 | 9 | 7.9 | 4 | 3.5 |
| ඇළ | 6 | 5.3 | 37 | 32.5 | 6 | 5.3 | 42 | 36.8 |
| වෙනත් | 4 | 3.5 | 2 | 1.7 | 5 | 4.4 | 3 | 2.6 |

වත්තේගෙදර වසම ජල මූලාශ්‍රවලින් පොහොසත් ගමකි. ගම හරහා ගලා බසින ඇළ මාර්ග හරහා නල දමා තම නිවෙස්වලට ජල පහසුකම් සපයා ගැනීමෙන් ගම්මුන් බහුතරයක් තම ජල අවශ්‍යතා සපුරා ගනී. වැසි කාලයේ දී මෙන්ම වියලි කාලයේ දී ද ජලය සපයා ගන්නා ප්‍රධාන මාර්ගය මෙම නල ජලයයි. මීට අමතරව පෞද්ගලික ළිං තවත් ප්‍රධාන ජල මූලාශ්‍රයකි. නෑම සඳහා නල ජලය මෙන්ම ඇළ මාර්ග ද ප්‍රයෝජනයට ගනී. නල මාර්ග හා ළිංවලට අමතර වෙනත් ජල මූලාශ්‍ර භාවිත කරන කිහිපදෙනෙකු ද නියැදියේ දී හමු විය. එනම් ඇළේ ජලය හා උල්පත් ජලය භාවිතයයි.

භාවිතා කරන ජලයේ පිරිසිදුභාවය ගැන දැක්වූ අදහස් අනුව බීමට ගන්නා ජලය පිරිසිදු තත්ත්වයක පවතින බව නියැදි ජනගහණයෙන් 97% ක් ම ප්‍රකාශ කර තිබුනි. මෙහිදී පිරිසිදුකම යනු විද්‍යාත්මකව ජලයේ තත්ත්වය බැලීමක් නොව ඔවුන් සිතන ආකාරය සැලකිල්ලට ගෙන ඇත. උල්පත් වලින් ගන්නා ජලය ද පිරිසිදු තත්ත්වයක පවතින බව බොහෝ දෙනෙකුගෙන් ප්‍රකාශ වුනි.

4.6 වැසිකිළි පහසුකම්.

වැසිකිළි භාවිතය හා වැසිකිළිවල තත්ත්වය ප්‍රදේශයක සෞඛ්‍ය තත්ත්වය මැන බැලිය හැකි නිර්ණායකයක් ලෙස ගත හැක. ජීවත්වන පරිසරයේ අපිරිසිදු බව, රෝග පැතිරීමටත්, වසංගත පැතිරී යාමටත් හේතු වන්නකි. නියැදි පවුල් ඒකකවලින් නිවාස 6 කට (5.3%) වැසිකිළි නොමැති බවට වාර්තා කර තිබුනි. එසේම තාවකාලික වල වැසිකිළි භාවිතා කරන පවුල් 7 ක් විය. (වගුව 4.7) වැසිකිළි ඇති පවුල් අතර ජල මුද්‍රිත වැසිකිළි භාවිතා කරන පවුල් 91 ක් විය. ප්‍රතිශතයක් වශයෙන් එය 79.8% කි.

වගුව 4.7 – වැසිකිලි භාවිතය

| වැසිකිලි වර්ගය | සංඛ්‍යාව | % |
|---|---|---|
| ජල මුද්‍රිත | 91 | 79.8 |
| තාවකාලික වල වැසිකිලිය | 7 | 6.1 |
| වල වැසිකිලිය | 10 | 8.8 |
| වැසිකිලි නැති | 6 | 5.3 |

4.7 නිවස්වල ඇති ගෘහ උපකරණ

නිවාසවල භාවිතා කරන බඩු බාහිරාදිය යම් ප්‍රජාවක ආර්ථික හා සමාජීය තත්ත්වය පිළිබිඹු කරන නිර්ණායකයකි. එසේම මේවායේ අයිතිය නිවසේ සම්පත පෙන්වන නිර්ණායකයකි. මෙවැනි බඩු බාහිරාදිය මිලදී ගන්නේ යම් ස්ථිර ආදායමක් තිබූ විට හෝ හොඳ අස්වැන්නක් ලැබී ආදායම් සරු වුවහොත් පමණි. ඒ අනුව මෙම තෝරාගත් නියැදිය සතු ගෘහස්ත උපකරණ හා ප්‍රවාහන සඳහා වාහන අයිතිය පිළිබඳව ද මෙම සමීක්ෂණයේ දී විමසා බලන ලදී (වගුව 4.8)

වගුව 4.8 තෝරාගත් ගෘහ උපකරණ හා ප්‍රවාහන මාධ්‍ය අයිතිය ප්‍රතිශතයක් වශයෙන්

| ගෘහ උපකරණ/වාහන | වාර්තාකල නිවාස සංඛ්‍යාව | % | අයිති සංඛ්‍යාව |
|---|---|---|---|
| (බිත්ති) ඔරලෝසු | 99 | 86.7 | 145 |
| පෙට්‍රල්මැක්ස් ලාම්පු | 28 | 24.5 | 29 |
| රේඩියෝ | 34 | 29.8 | 35 |
| කැසට් රේඩියෝ | 83 | 72.8 | 84 |
| රූපවාහිනී | 86 | 75.4 | 87 |
| අල්මාරි | 65 | 57.0 | 77 |
| පුටු කට්ටල | 77 | 67.5 | 109 |
| ශීතකරණ | 9 | 7.8 | 9 |
| සංයුක්ත තැටි වාදන යන්ත්‍ර | 23 | 20.2 | 23 |
| මහන මැෂින් | 39 | 34.2 | 42 |
| ගෑස් ලිප් | 5 | 4.3 | 5 |
| රයිස් කුකර් | 8 | 6.9 | 8 |
| විදුලි පංකා | 21 | 18.4 | 22 |
| පරිගණක | 01 | 0.8 | 1 |
| ගෘහස්ත වතුර මෝටර් | 3 | 2.6 | 3 |

පරිහරණය කරන ගෘහස්ත බඩු බාහිරාදිය පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා දැනට බහුලව භාවිතා වන උපකරණ 15 ක් පිළිබඳව විමසීමක් කරන ලදී. මේ අතරත් වත්තේගෙදර වසමේ නිවෙස්වල බහුතරයක් භාවිතා කරන ගෘහ උපකරණ ලෙස වාර්තා වුනේ බිත්ති ඔරලෝසු, කැසට් රේඩියෝ හා රූපවාහිනී යන්ත්‍ර ය. පුටු කට්ටල හා අල්මාරි ද බොහෝ නිවෙස්වල දක්නට ලැබුනි. ශීතකරණ, රයිස්කුකර්, ගෑස් ලිප්, විදුලි පංකා වැනි උපකරණ භාවිතය ඉතා අල්ප විය. ආර්ථික අතින් ඉහළ මට්ටමක සිටි ව්‍යාපාරික හෝ රාජ්‍ය/පෞද්ගලික සේවයේ නියුතු අයගේ නිවෙස්වල මෙවැනි උපකරණ භාවිතය තිබුනත් කාෂිකර්මය තම ජීවනෝපාය කරගත් නිවෙස්වල මෙවැනි උපකරණ භාවිතය දක්නට නොවීය. පරිගණකයක් හිමිව තිබුනේ නියැදියෙන් එක් නිවසකට පමණි.

### 4.8 ගමනාගමනය හා ප්‍රවාහනය සඳහා ඇති වාහන අයිතිය.

ගමනාගමනය හා ප්‍රවාහන උපකරණ අයිතිය තිබුනේ මෙම නිවැසියන්ගෙන් ඉතා අඩු සංඛ්‍යාවකට ය. යතුරුපැදි, සහ බයිසිකල් අයිතිය තිබුනේ පිළිවෙලින් පවුල් 02 ක් හා 10 කට පමණි. කඳුකර ප්‍රදේශයක පිහිටා තිබීමත් මෙම ගමට ඇති ප්‍රධාන ප්‍රවිශ්ට මාර්ග පවා වාහන ගමනා ගමනයට අපහසු තත්ත්වයක පැවතීමත් ප්‍රවාහන උපකරණ අයිතිය ඉතා අඩුව තිබීමට හේතු වේ. නියැදියෙන් 90% කට කිසිදු ප්‍රවාහන උපකරණයක් අයිතිව නොතිබුනි.

### 4.9 කෘෂිකාර්මික උපකරණ හා යන්ත්‍රසූත්‍ර.

යම් ප්‍රදේශයක කෘෂිකාර්මික ක්‍රියාවන් පිළිබඳව වක්‍ර ලෙස පෙන්වන නිර්නායකයකි කෘෂිකාර්මික උපකරණවල අයිතිය පිළිබඳව ඇති දත්තයන්. එමෙන්ම එතුලින් එම පවුල්වල ආදායම් තත්ත්වය පිළිබඳවත් තම කෘෂිකාර්මික කටයුතු පිළිබඳවත් යම් අවබෝධයක් ලබා දේ. සමීක්ෂණයේ දී නිවාසවල ඇති සරල කෘෂිකාර්මික උපකරණ වන උදැල්ලේ සිට ට්‍රැක්ටර් වැනි නව උපකරණවල අයිතිය පිළිබඳව තොරතුරු ලබාගන්නා ලදී. සමීක්ෂණය අනුව පෙන්වූ දෙයක් නම් සියලු නිවෙස්වලට මූලික කෘෂිකාර්මික උපකරණ වන උදලු තිබූ අතර නගුල් (ලී හා යකඩ) වැනි උපකරණ නියැදියෙන් හිමිව තිබුනේ නිවාස 14 කට පමණි. (වගුව 4.9) මේ ප්‍රදේශයේ කුඹුරු ඉඩම් ඉතා සීමිත වීමත්, පවුල් සීමිත සංඛ්‍යාවක් පමණක් වී වගාවේ නියැලී සිටීමත්, ඉඩම් විශාල ප්‍රමාණයක් හේල්මලු ක්‍රමයට වගා කරන ලියැදි වශයෙන් පැවතීමත් නිසා මේ උපකරණ භාවිතයේ නොවීම ප්‍රධාන හේතුවක් වේ.

වගුව 4.9 කෘෂිකාර්මික උපකරණවල අයිති ප්‍රමාණය හා පවුල් 100 කට අයිති උපකරණ සංඛ්‍යාව

| | නිවාස සංඛ්‍යාව | සියලු නිවාස ඒකකවලට අයත් එකතුව | නිවාස 100 කට අයත් සංඛ්‍යාව |
|---|---|---|---|
| උදළු | 105 | 178 | 156 |
| ලී නගුල් | 14 | 18 | 15.8 |
| යකඩ නගුල් | 4 | 4 | 3.5 |
| ට්‍රැක්ටර (රෝද 2) | 2 | 2 | 1.7 |
| දියර ඉසින යන්ත්‍ර | 9 | 9 | 7.9 |
| කොල මඩින යන්ත්‍ර | 5 | 5 | 4.4 |
| ජල පොම්ප | 1 | 1 | 0.8 |

4.10 සෞඛ්‍ය තත්ත්වය.

නාගරික ප්‍රදේශවලින් බැහැරව තිබීම හේතුවෙන් ගම්වැසියන්ගේ සෞඛ්‍ය පහසුකම් ලබාගැනීමේ දුෂ්කරතාවයක් මේ ගමට ඇත. මෙම නියැදි සමීක්ෂණයේ දී බෝවන රෝග වැළඳීම පිළිබඳවත් සෞඛ්‍ය පුරුදු පිළිබඳවත් අදාල තොරතුරු විමසීමක් කරන ලදී. පසුගිය වසර 2 තුල පවුල්වල සාමාජිකයන්ට බෝවන රෝග වැළඳීම පිළිබඳව ද සමීක්ෂණයේ දී අධ්‍යයනයට භාජනය වූ අතර තෝරාගත් නියැදියේ කිසිම සාමාජිකයෙක් එවැනි බෝවන රෝග කිසිවකට භාජනය වී නොතිබුනි.

එසේම පවුල් සංඛ්‍යාවෙන් 63% ක්ම බීම සඳහා ගන්නා ලද ජලය උණුකර භාවිතා කරන බව වාර්තා කර තිබුනි. කුඩා දරුවන් ඉන්නා නිවාසවල වැඩිහිටියන් උණු නොකර ජලය බීමට ගත්තත් එම දරුවන්ට ජලය උණුකර බීමට දීමට වගබලා ගනී.

බුලත්විට කෑම, මත්පැන් පානය, දුම්බීම වැනි අයහපත් පුරුදුවලට ඇබ්බැහි වීම පිළිබඳව ද සමීක්ෂණයට භාජනය විය. මෙහිදී පුරුද්දක් වශයෙන් නොව ඉඳහිට කලාතුරකින් මෙවැනි දේ වලට යොමු වූ අය ඇබ්බැහිවීම් ලෙස නො සලකා ඇත. ඒ අනුව නියැදියට අයත් වැඩිහිටි ජනගහණයෙන් (වයස 15 ට වැඩි) බුලත්විට කෑමට ඇබ්බැහි වීම ප්‍රතිශතයක් වශයෙන් 31.% කි. ගමේ වැඩිහිටි (වයස 15 ට වැඩි) පිරිමි ජනගහණයේ මත්පැන් බීම හා දුම්වැටි භාවිතය පිළිබඳව ඇති ඇබ්බැහි වීම ඉතා අඩු තත්ත්වයක පැවතීම මෙම ගමෙහි හොඳ ලක්ෂණයකි. මත්පැනට ඇබ්බැහි වීම වාර්තා වුනේ 5.0% ක් පමණි. දුම්පානයට එය 7.3% ක් වන අවම මට්ටමක පැවතුනි. මත්පැන්වලට ඇබ්බැහි වුවන්ගෙන් ගමට හෝ සමාජයට හානියක් නොවන බව බහුතරයකගෙන් ප්‍රකාශ විය.

4.11 ගමනාගමන හා සේවා යටිතල පහසුකම්.

ගමතුළ ඇති කුඩා පාරවල් වාහන ගමනාගමනයට අපහසු තත්ත්වයක පවතින මාර්ග වේ. කඳු හෙල් අධික බැවින් මාර්ග අපහසුතාවය දැඩිව බලපාන්නකි. ගම තුල තාර දැමූ මාර්ග කිසිවක් නොමැත. නිවෙස් බහුතරයකට ලගාවීමට ඇත්තේ කුඩා අඩිපාරවල් පමණි. ගමට ප්‍රවිශ්ඨවීමට ඇති මාර්ග 3 ද තාර දමා සකස් කරන ලද මාර්ග නොවන අතර ඒවායෙහි ද වාහන ගමනාගමනය දුෂ්කර වේ. නිසි නඩත්තුවක් නොමැති වීම නිසා ඒවා ද ඉතා අබලන් තත්ත්වයක පවතී. කිට්ටුම බස් පාරකට කි.මී. 3 ක් ගෙවා යා යුතුය. එනම් අස්මඩල හෝ ඇරැව්වල යන කුඩා නගර කරා යා යුතුය. එම නගර සිට මාවනැල්ල අරනායක යන නගරවලට බස් ධාවනය වේ. ගමට ලගාවීමට ඇත්තේ එම ස්ථාන සිට පයින් හෝ ත්‍රිරෝද රථ වලිනි. ගම තුල ඇති කුඩා මාර්ග වාහන ගමනාගමනය අපහසු, කඳුහෙල් හරහා වැටී ඇති මාර්ග වේ. රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සේවා සපයන ආයතන වශයෙන් ගමෙහි ඇත්තේ ග්‍රාම නිලධාරී කාර්යාලය පමණි. ලබුටුව ග්‍රා. නි. වසමේ පිහිටා ඇති අස්මඩල විද්‍යාලය ගමෙහි දරුවන්ගේ ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ඇති පාසලයි. මෙම විදුහලේ ප්‍රාථමික පන්ති පමණක් පවත්වන බැවින් ඊට ඉහළ අධ්‍යාපනයන් ලබා ගැනීම සඳහා උස්සාපිටිය, මාවනැල්ල, අරණායක යන නගරවල පාසල්වලට යෑමට සිසුනට සිදුවේ. මොන්ටිසෝරියක් ගම තුල පවත්වාගෙන යනු ලබයි. ශ්‍රී සුදර්ශනාරාමය වත්තේගෙදර ගමෙහි පිහිටා ඇති ආගමික මධ්‍යස්ථානයයි. මෙම පන්සල මගින් ගමේ දරුවන් සඳහා දහම් පාසලක් පවත්වාගෙන යනු ලබයි. ගමට විවිධ සේවා සපයන ආයතන පිහිටා ඇති නගර හා එයට ඇති දුර වගු 4.10 න් පෙන්නුම් කරයි.

වගුව 4.10 - විවිධ සේවා සපයන ස්ථානවලට ඇති සාමාන්‍ය දුර - නියැදි කුටුම්භවල සිට ඇති දුර

| ආයතනය | පිහිටා ඇති නගර | දුර (කි.මී) |
|---|---|---|
| ආසන්න බස් පාර | ඇරැව්පල/අස්මඩල - නගර | 03 |
| තැපැල්හල | ගලතර | 04 |
| සා.පෙ.දක්වා පංති ඇති පාසල් | අස්මඩල | 04 |
| උ.පෙ. දක්වා කලා පංති ඇති පාසල් | අස්මඩල | 04 |
| උ.පෙ. විද්‍යා පංති ඇති පාසල් | උස්සාපිටිය | 06 |
| ගොවිජන සේවා මධ්‍යස්ථානය | උස්සාපිටිය | 06 |
| පුද්ගලික වෛද්‍යවරු | උස්සාපිටිය | 06 |
| ඩිස්පැන්සරිය | වාකිරිගල | 04 |
| නැවතීමේ පහසුකම් සහිත රෝහල | මාවනැල්ල/අරණායක | 12/10 |
| ආයුර්වේද රෝහල | කෑගල්ල | 18 |
| පශු වෛද්‍ය කාර්යාලය | මාවනැල්ල | 12 |
| සති පොළ | මාවනැල්ල | 12 |
| ලංකා බැංකුව/මහජන බැංකුව | මාවනැල්ල | 12/10 |
| පොලිස් ස්ථානය | අරණායක | 07 |

ගමට වැදගත් වන ඉහත ස්ථාන ගම් මායිමේ සිට කි.මී. 4- 12 දක්වා දුරින් වූ ස්ථානවල පිහිටා ඇත. රෝහල, පශු වෛද්‍ය, බැංකු, සතිපොළ වැනි ප්‍රධාන ආයතන කි.මී. 10 ක් පමණ දුරක් වූ මාවනැල්ල, අරනායක නගරවල පිහිටා ඇත. බස් ගමනාගමනය සහිත පාරකට ගමේ සිට කි.මී. 3 ක් පමණ පයින් යාමට සිදුවීම නිසා ගමනාගමනය දුෂ්කර තත්ත්වයක පවතී. නගරයේ පාසල්වලට යන පාසල් දරුවන් මේ නිසා බලවත් දුෂ්කරතාවයක් විඳී, ගමේ පදිංචි ස්ථානවල සිට දුෂ්කර මාර්ග ඔස්සේ පැමිණීමට සිදුවීම මත මේ තත්ත්වය තවත් උග්‍ර කරයි. මේ නිසා ඉහත ආයතනවලින් සේවා ලබා ගැනීමට යාමේ දී අධික වෙහෙසක් හා කාලයක් ගත කිරීමට සිදුවී ඇත.

4.12 ගමෙහි භෞතික සම්පත්.

කඳුකර ප්‍රදේශයක් බැවින් මෙම ගමතුල වාරිමාර්ග පහසුකම් ලබා දෙන වැව් කිසිවක් නොතිබුනි. එසේ වුවත් ගම හරහා ගලායන ඇළමාර්ග හරස් කර ඉදි කර ඇති කුඩා අමුණු 6 කි. මෙමගින් අක්කර 40 ක ප්‍රමාණයක් වී වගා කරනු ලබයි. මෙම ගමේ ඇති මරණාධාර සමිති 2 සතු පොදු සමිති ශාලා 2 ක් වන අතර ගම්මුන්ගේ රැස්වීම් ආදිය පැවැත්වීම සඳහා මේ ශාලා ප්‍රයෝජනයට ගනී. මෙම ගමේ බහුලව ඇති කලුගල් සම්පතින් නිසි ප්‍රයෝජනයක් ගැනීමට නොහැකි වී ඇත්තේ ප්‍රධාන වශයෙන් ගම තුල ඉල්ලුම අඩුවීමත් - ප්‍රවාහන දුෂ්කරතා නිසා දුර බැහැරව රැගෙන යාමට ඇති අපහසුවත් නිසාවෙනි.

ගමේ ඇති තවත් සම්පතකි දැව සම්පත. ගිනිසපු වැනි ගස් වර්ග මේ ප්‍රදේශයේ බහුලව පවතී. එය ගම්මුන්ගේ තවත් ආදායම් මාර්ගයක් වී ඇත.

# පස්වන පරිච්ඡේදය

## ඉඩම් අයිතිය, භුක්තිය හා සංවර්ධනය කිරීම

5.1 භුක්ති විඳින ඉඩම්වල ස්වභාවය හා ප්‍රමාණය

වත්තේගෙදර වසමේ ඇති ඉඩම් පිළිබඳව සැලකීමේ දී මෙහි පෞද්ගලික ඉඩම් ප්‍රධාන වශයෙන් කොටස් 03 කට හඳුනාගැනීමට හැකිය.

එනම්,

1. කුඹුරු ඉඩම්
2. ගෙවතු
3. ගොඩ ඉඩම්

1. කුඹුරු ඉඩම් - මෙම ප්‍රදේශය කඳු සහිත ප්‍රදේශයක් බැවින් කුඹුරු ඉඩම් ඇත්තේ ප්‍රමාණයෙන් ස්වල්පයකි. එනම් අක්කර 37 ක් පමණි. ගමේ භූවිෂමතාවය අනුව සකස් කර ඇති මේ කුඹුරු ඉඩම් උඩරට ගම්මානවල පරිදි කුඩා ලියැදි වශයෙන් සකස් වී ඇත. ගම හරහා ගලා බසින දිය පහර හරස්කර බැඳ ඇති කුඩා අමුණ මගින් මේ ඉඩම්වලට ජලය සපයයි. අක්කර 40 ක් මෙමගින් පෝෂිත වන අතර ඉතිරි ප්‍රමාණය උල්පත් ජලයෙන් පෝෂිත වේ. ප්‍රමාණවත් ජලය තිබීම හේතුවෙන් යල – මහ දෙකන්නයේම වගා කිරීමට හැකියාවක් ඇත. කුඩා ලියැදි වශයෙන් පිහිටීම නිසා බොහෝවිට බිම් සකස් කිරීම සඳහා ගවයන් හා උදලු භාවිතා කිරීමට සිදුවේ. උස් වූ නියර නිසා නියර බැඳීම වැනි කටයුතු සඳහා වැඩි ශ්‍රමයක් යෙදීමට සිදුවීම ද මෙහි කුඹුරු වගාවේ දී මුහුණ දෙන ගැටලුවකි. අඩු තාක්ෂණ භාවිතයන්, කඳු බෑවුම් සහිත ප්‍රදේශවල පිහිටීමත් නිසා ඇතිවන වදුල තත්ත්වයන් හේතුවෙන් වී ගොවිතැනින් ලබන අස්වනු ප්‍රමාණය අඩු තත්ත්වයක පවතී.

2. ගෙවතු - ගෙවතු ලෙස හැඳින්වෙන නිවාස ආශ්‍රිත උස්බිම් ද මිශ්‍ර වගාවෙන් යුක්තය. උඩරටට ආවේණික ගෙවතු (Kandyan Forest Garden) ලෙස මෙම ගෙවතු පවතී. කරාබු, ගම්මිරිස් වැනි අපනයන බෝග ද පොල්, රබර් වැනි වැවිලි බෝග ද කොස්, දෙල්, පුවක්, පළතුරු වැනි බෝග ද ගෙවතුවල දක්නට ඇත. මීට අමතරව සාදික්කා, ගොරකා වැනි බෝග වර්ග ද ගෙවතු වගා වශයෙන් පවතී. රජයෙන් ඉඩම් බෙදා දී ඇති කොටසක් වන පොරෝමාරුව ජනපද කොටසේ ගෙවතු අක්කර 1/2 කින් සමන්විත වන අතර එම ඉඩම් ද මිශ්‍ර වගාවන් ගෙන් යුක්තය.

4. ගොඩ ඉඩම් - වර්ෂාපෝෂිත වෙනත් ගොඩඉඩම් මේ ගණයට ඇතුලත් වෙති. මේවායේ ද ඉහත කී පරිදි ගෙවතුවල දක්නට ඇති බෝග දක්නට ඇත. බොහෝ ගොඩ ඉඩම් මිශ්‍රවගාවන්ගෙන් යුක්ත වන අතර ඉතා සුලු ප්‍රමාණයක් පමණක් තේ, රබර් වැනි වැවිලි බෝග වලින් සමන්විත වේ. බෑවුම් සහිත ගොඩ ඉඩම් විශාල ප්‍රමාණයක් පවතින අතර සැලසුම් සහගතව වගා නොකරනලද ඉඩම් ද ඒ අතර බහුලව පවතී. ඒ ගොවිතැන ප්‍රධාන ජීවනෝපාය නොවන මේ ප්‍රදේශයේ ආර්ථිකමය වාසි ලබන ප්‍රධාන කෘෂි වගාවන් වන්නේ ගෙවතු හා ගොඩ ඉඩම්වල වගා කර ඇති මිශ්‍ර වගාවන් ය. නියැදි කුටුම්භයන්ට අයත් ඉඩම් බෙදී ඇති අන්දම වගුව 5.1.1 න් පෙන්වයි.

වගුව 5.1.1 - නියැදියට අයත් ඉඩම්

| | අක්කර | % වශයෙන් |
|---|---|---|
| කුඹුරු ඉඩම් | 35.67 | 21.4 |
| ගෙවතු | 76.40 | 45.9 |
| ගොඩ ඉඩම් | 53.03 | 31.8 |
| හේන් | 1.5 | 0.9 |
| | 166.60 | 100.0 |

නියැදියට අයත් කුඹුරු ඉඩම්වලින් 76% ක්ම ග්‍රා.නි. වසම තුල පිහිටා තිබූ අතර 24% ග්‍රා.නි. වසමෙන් පිට පිහිටා තිබුනි. සමීක්ෂණය සඳහා තෝරාගත් නියැදියේ කුඹුරු ඉඩම් ගෙවතු හා වෙනත් ගොඩඉඩම් ඉඩමේ ප්‍රමාණය අනුව බෙදී ඇති අන්දම වගු 5.1.2 හා වගු 5.1.3 න් පෙන්වයි.

වගුව – 5.1.2 ඉඩම්වල ප්‍රමාණය අනුව කුඹුරු ඉඩම් බෙදී ඇති අන්දම.

| ඉඩමේ ප්‍රමාණය | කුඹුරු ඉඩම් | | | |
|---|---|---|---|---|
| අක්කර | සංඛ්‍යාව | % | අක්කර ප්‍රමාණය | % |
| | | | | |
| 0 – 1/4 | 40 | 47.6 | 7.67 | 21.5 |
| 1/4 – 1/2 | 26 | 31.0 | 11.61 | 32.3 |
| 1/2 – 1 | 15 | 17.9 | 12.41 | 34.8 |
| 1 – 2 | 3 | 3.6 | 4.08 | 11.4 |
| එකතුව | 84 | 100.0 | 35.67 | 100.0 |

කුඹුරු ඉඩම්

වසමේ කුඹුරු ඉඩම් කට්ටිවලින් බහුතරයක්ම අක්කර 1/4 ට වඩා අඩු ඉඩම් විය. මෙයට අයත් මුලු ඉඩම් ප්‍රමාණය අක්කර 7.67 ක් වු අතර එය නියැදියට අයත් මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් 21.5 % කි. අක්කර 1 ට වඩා වැඩි කුඹුරු ඉඩම් කට්ටි තිබුනේ 3 ක් පමණක් වු අතර එම මුලු ඉඩම් ප්‍රමාණය අක්කර 4.08 කි.

වගුව 5.1.3 - ඉඩම්වල ප්‍රමාණය අනුව ගොඩ ඉඩම් හා ගෙවතු බෙදී ඇති අන්දම

| ඉඩමේ ප්‍රමාණය අක්කර | ගෙවතු | | | | වෙනත් ගොඩ ඉඩම් | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පවුල් සංඛ්‍යාව | % | අක්කර ප්‍රමාණය | % | පවුල් සංඛ්‍යාව | % | අක්කර ප්‍රමාණය | % |
| ඉඩම් නොමැති | | | | | | | | |
| 0 – 1/4 | 32 | 28.3 | 6.44 | 8.4 | 9 | 19.1 | 1.65 | 3.1 |
| 1/4 - 1/2 | 50 | 43.4 | 24.24 | 31.7 | 9 | 19.1 | 4.38 | 8.3 |
| 1/2 - 1 | 16 | 14.2 | 15.25 | 20.0 | 16 | 34.0 | 15.00 | 28.3 |
| 1 - 2 | 11 | 9.7 | 16.97 | 22.2 | 8 | 17.0 | 11.50 | 21.7 |
| 2 - 5 | 5 | 4.4 | 13.50 | 17.7 | 4 | 8.5 | 13.50 | 25.5 |
| 2 ට වැඩි | 0 | | | | 1 | 2.1 | 7.0 | 13.2 |
| එකතුව | 114 | 100.0 | 76.40 | 100.0 | 47 | 100.0 | 53.03 | 100.0 |

ගෙවතු ඉඩම්

නියැදියෙන් 43% කටම අක්කර 1/4 1/2 ප්‍රමාණයේ ගෙවතු ඉඩම් හිමිකමක් තිබුනි. ජනගහණයට අයත් මුලු ගෙවතු ප්‍රමාණය අක්කර 76.4 ක් වු අතර ඒ අනුව සාමාන්‍ය ප්‍රමාණය අක්කර 0.67 ක් විය.

අක්කර 1 ට වඩා විශාල ගෙවතු ඉඩම් හිමිව තිබුනේ නියැදියෙන් 14.1% කට පමණි. එසේ වුවත් මුළු ගෙවතු ඉඩම් ප්‍රමාණයෙන් 30.47% ක් එම කොටසට හිමිකම්ව පැවතුනි. නියැදියෙන් 72% කටම හිමිව තිබුනේ අක්කර 1/2 කට වඩා අඩු කුඩා ගෙවතු ඉඩම් ය. එය මුළු ගෙවතු ප්‍රමාණයෙන් 40.1% ක් වු අතර මෙයින් පෙන්වන්නේ නියැදියෙන් බහුතරයක් ම කුඩා ගෙවතු ඉඩම්වලින් සමන්විත බවයි.

වෙනත් ගොඩ ඉඩම්

ගෙවතුවලට අමතරව වෙනත් ඉඩම් ගැන ද මෙහිදී ගණනය කර බලන ලදී. නියැදියට අයත්ව තිබූ වෙනත් ගොඩ ඉඩම්වලින් 34% ක්ම අක්කර 1/2 – 1 අතර ප්‍රමාණයේ ඒවා විය. වෙනත් ගොඩ ඉඩම් හිමිව තිබූ කුටුම්භයන්ට අයත් මුලු ගොඩ ඉඩම් ප්‍රමාණය අක්කර 53.03 වූ අතර ඒ අනුව සාමාන්‍ය අගය අක්කර 1.13 විය. අක්කර 5 ට වඩා වැඩි ගොඩ ඉඩම් හිමිව තිබුනේ නියැදියෙන් එක් අයෙකුට පමණක් වූ අතර විශාලත්වයෙන් එය අක්කර 7 ක් විය.

## 5.2 ඉඩම් අයිතිය හා භුක්තිය

වත්තේගෙදර වසමේ තෝරාගත් නියැදිය සතු ඉඩම්වල අයිතිය හා භුක්තිය වගු 5.2.1 න් පෙන්වයි.

වගුව 5.2.1 ඉඩම් භුක්තිය

| භුක්තියේ ස්වභාවය | කුඹුරු ඉඩම් | | ගොඩ ඉඩම් | | ගෙවතු | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. තනි අයිතිය | 49 | 58.3 | 38 | 80.9 | 69 | 61.0 |
| 2. තට්ටුමාරු | 4 | 4.8 | | | | |
| 3. කට්ටිමාරු | 23 | 27.4 | 3 | 6.4 | | |
| 4. වෙනත් හවුල් | 8 | 9.5 | 6 | 12.8 | 41 | 36.4 |
| 5. ස්වර්ණ භූමි | | | | | 3 | 2.7 |

නිවාස වැඩි සංඛ්‍යාවකට හවුල් හෝ වෙනත් භුක්තියකට වඩා ඉඩම්වල තනි අයිතිය ඇති බව පෙනෙන්නට තිබුණි. (වගුව 5.2.1) තෝරාගත් නියැදියේ කුඹුරු ඉඩම්වලින් 58.3% ක්ම තනි අයිතිය වාර්තා වී තිබුනි. එසේම ඉඩම්වලින් 27.4% ක් කට්ටිමාරු ලෙස භුක්ති විඳී..

ගොඩ ඉඩම්වල භුක්තිය හා අයිතිය

ගොඩ ඉඩම් ද විවිධ භුක්තියන් යටතේ තිබුනු අතර ඉන් බහුතරයක් (වගුව 5.3) ගොඩ ඉඩම් තනි අයිතිය වශයෙන් භුක්ති විඳී. ප්‍රතිශතයක් වශයෙන් 80.9.% කි. ගෙවතුවලින් වැඩි ප්‍රමාණයක් ද (61.0%) ක් තනි අයිතිය වශයෙන් වාර්තා වූ අතර, හවුල් අයිතිය ද සැලකිය යුතු තත්ත්වයක (36.4%) තිබුනි. පාරම්පරිකව උරුම වී ඇති ඉඩම් කොටස්වලට වෙන් නොකර භුක්ති විඳීම හේතුවෙන් හවුල් අයිතිය වාර්තා විය.

## 5.3 ඉඩම්වල භෞතික ස්වභාවය

වත්තේගෙදර ග්‍රාමයේ භූමියෙන් 75% ක්ම කඳු බෑවුම් සහිත ඉඩම්වලින් යුක්ත ප්‍රදේශයකි. නියැදි ගොවීන්ගේ නිවාස ද වැඩි ප්‍රමාණයක් කඳුබෑවුම්වල පිහිටා තිබුනි. ප්‍රදේශයේ ඇති ඉඩම්වල තත්ත්වය පිළිබඳ ලබාගත් තොරතුරු අනුව නියැදි ජනගහණයේ 25% කට තම ගොඩ ඉඩම් සෝදාපාලුවට ලක්වන බවට වාර්තා කර තිබුනි. මේ ප්‍රදේශය කඳු බෑවුම් ආශ්‍රිතව ගල් සහිත ඉඩම් බහුලව ඇති ප්‍රදේශයකි. නිසි පාංශු සංරක්ෂණ ක්‍රම අනුගමනය නොකිරීම හේතුවෙන් මෙම ඉඩම් පාංශු ඛාදනයට ලක් වී ඇති බව පෙනෙන්නට තිබුනි. පාංශු ඛාදනය වැළැක්වීමට ගල්වැටි දැමීම, කාණු කැපීම වැනි සංරක්ෂණ කටයුතු සිදු කර තිබුනේ ඉඩම් ස්වල්පයක පමණි. එබැවින් වර්ෂා කාලයේ දී පාංශු ඛාදනයට ලක් වීමේ අවදානම වැඩිය. බොහෝ ගොඩ ඉඩම් විවිධ වගාවන් යටතේ තිබූ නමුත් සම්පූර්ණයෙන්ම වගා නොකල ඉඩම් ද තිබුනි. එසේ සංවර්ධනය නොකිරීමට ඉදිරිපත් කර තිබූ හේතු අනුව ප්‍රමුඛත්වය ගන්නේ ඉඩම් සංවර්ධනය කළමනාකරණ ක්‍රම විධි ගැන විද්‍යාත්මක දැනුමක් මේ ගමේ වැසියන්ට නොතිබීමත්, නිසි උපදෙස් නොලැබීමත් ය. එසේ වුවත් ගමේ ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය සම්පූර්ණයෙන්ම වගාවට යොදාගනු තිබුනි.

6 පරිච්ඡේදය

# කෘෂිකර්මය හා අනෙකුත් නිෂ්පාදන කටයුතු

6.1 වගා කරනු ලබන බෝග හා අක්කර ප්‍රමාණයන්.

මෙම සමීක්ෂණයට භාජනය කරන ලද ගෘහයන් භුක්ති විඳින ඉඩම්වල වගා කටයතු පිළිබඳව හා ලබාගන්නා අස්වැන්න පිළිබඳවත් ඔවුන්ගේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳවත් මේ ජේදය යටතේ ඉදිරිපත් කර ඇත. එසේම වගාවේ දී ඔවුන් අනුගමනය කරන වගා කටයුතු පිළිබඳවත්, ලබාගත් අස්වනු පිළිබඳවත් ලබා ගත් තොරතුරු සම්බන්ධ කර ඉදිරිපත් කිරීම ද මෙහි පරමාර්ථයකි.

ගෙවතු ද ඇතුලත්ව ගොඩ ඉඩම්වල වගාවන් හා කුඹුරු ඉඩම්වල වගාවන් මෙහිදී අධ්‍යයනයට ලක් විය. ගොඩ ඉඩම්වල හා ගෙවතුවල බොහෝ විට මිශ්‍ර වගාවන් පැවතුනි. බොහෝ ඉඩම් විවිධ බෝග වගා කර ඇති මිශ්‍ර වගාවන් වශයෙන් පවතී. මේ අතර කරාබු සහ ගම්මිරිස් බහුලව වගා කර ඇති ප්‍රධාන මිශ්‍ර බෝග වගාවන් වේ.

6.2 බෝග වගාව

- මෙම ගම කෘෂිකාර්මික ඉඩම් අක්කර 382 කින් සමන්විත වූ ගමකි. මෙම ඉඩම් ප්‍රමාණයෙන් අක්කර 331 ක් ගොඩ ඉඩම් වන අතර අක්කර 51 ක් මඩ ඉඩම් වේ. ගොඩ ඉඩම් බහුල වශයෙන් මිශ්‍ර වගාවන්ගෙන් යුක්තය. එම ඉඩම්වල වගා කරනු ලබන වානිජ වටිනාකමක් ඇති වගාවන් අතර කරාබු, ගම්මිරිස්, ප්‍රමුඛත්වය ගනී. මෙහි බහුතරයක්ම ආදායමක් ලබාගන්නේ ප්‍රධාන වශයෙන් කරාබු සහ ගම්මිරිස් වගාවන්ගෙනි. කරාබු හා ගම්මිරිස් වැනි බෝග සඳහා ඉතා සුදුසු දේශගුණයක් මේ ප්‍රදේශයේ පැවතීම මත මෙම බෝගයත් බහුලව ව්‍යාප්ත වී ඇත. අපනයන බෝග වගාව සම්බන්ධයෙන් ඇති ප්‍රධාන ගැටළුව නම්, එම වගාවන් නිසි පරිදි නඩත්තුවට ඇති දැනුම අඩුකමයි. අලෙවි පහසුකම් නොවීම නිසා ලැබෙන අස්වනු සඳහා අඩු මිලක් ලැබීමද මෙහි ගොවීන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවකි.

- ගෙවතු වගාවක් ලෙස පොල් වගාව ද ගමේ ව්‍යාප්ත වී ඇත. එසේ වුවත් මෙම ඉඩම්වල පොල් වලින් ලැබෙන එලදාව අඩු බව නිරීක්ෂණයේ දී දැනගන්නට ලැබුනි. පොල් වගාව සම්බන්ධයෙන් නිසි කළමනාකාරිත්වයක් දක්නට නොවීමත් සංරකෂණ, නැවත වගා වැනි ව්‍යාප්ත සේවාවන්හි අඩු ක්‍රියාත්මක භාවය හේතුවෙන් ලබාගන්නා එලදාව ඉතා අඩු මට්ටමක පවතී.

- තේ වගාව ද සුළු වශයෙන් ගම තුල ව්‍යාප්ත වී ඇත. එය කිහිපදෙනෙකු විසින් සුලු වශයෙන් පවත්වා ගෙන යනු ලබන අතර අක්කර 13 ක පමණ ප්‍රමාණයක් තේ වගාව යටතේ පවතී. එසේ වුවත් තේ වගා කරන ඉඩම් නිසි පරිදි නඩත්තුවක් සිදු නොකරන බව පෙනේ. සමහර තේ වතු නිසි පරිදි සම්පූර්ණයෙන්ම වගා කර නොමැත. තේ දලු අලෙවියට නගරයට රැගෙන යාමට සිදුවේ. දලු මිලදී ගැනීමෙ කාර්යයේ යෙදී සිටින කිහිප දෙනෙකු විසින් නගරයට ප්‍රවාහනය කර අලෙවි කරනු ලබයි.

- ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන අපනයන බෝගයක් වූ රබර් ද සුලු වශයෙන් වගා කර ඇත. රබර් වගාව අක්කර 11 ක පමණ මෙම වසමේ ව්‍යාප්ත වී ඇත. මෙහිදී ද දක්නට ඇති ප්‍රධාන ගැටලුව නම් රබර් වගාව ද නිසි වගා කළමනාකාරිත්වයක් නොවීමයි. රබර් වගාවෙන් ඉහළ ආදායමක් ලබාගත හැකි අතර නිසි නඩත්තු ක්‍රම භාවිතයෙන් මේ වගාව මෙහි දියුණු කිරීමේ අවකාශ ඇත. භූ විෂමතාවය හා පිහිටීම අනුව රබර් වගාවට සුදුසු ප්‍රදේශයකි. රබර් රොටි සකස් කිරීමේ පුද්ගලික මධ්‍යස්ථාන 2 ක් ගම තුල ඇති අතර, සකස් කල රබර් රොටි අලෙවියට ප්‍රධාන නගරය කරා රැගෙන යා යුතුය.

- වී වගාව වානිජ මට්ටමකින් සිදු නොවේ. වී වගාවේ නියුතු ගොවීන්ගේ පරිභෝජන අවශ්‍යතාවයන් සඳහා පමණක් ලබා ගන්නා වී අස්වනු ප්‍රමාණවත් වේ.

## 6.3 තාක්ෂණ භාවිතය

කෘෂිකාර්මික සංවර්ධනය සඳහා විවිධ ආයතන මගින් නොයෙකුත් තාක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. වත්තේගෙදර ප්‍රදේශයේ ගොවීන් අතර කෘෂිකර්මාන්තයේ දී තාක්ෂණ භාවිතය කෙතරම් දුරට ව්‍යාප්ත වී ඇද්දැයි බැලීම මෙහි ප්‍රධාන අරමුණ විය. ඒ අනුව කෘෂිකාර්මික දැනුම හා උපදෙස් ලබාගැනීම පිළිබඳවත් බීජ භාවිතය හා පොහොර භාවිතය පිළිබඳවත් ඒ හා සම්බන්ධව ගොවීන් මුහුණපාන ගැටලු පිළිබඳවත් අධ්‍යයනයට භාජනය විය.

### 6..3.1 කෘෂි කාර්මික දැනුම හා උපදෙස්.

කෘෂිකාර්මික දැනුම හා කෘෂිකාර්මික උපදෙස් ලබාදීමේ සේවාවන් සඳහා විවිධ ආයතන දෙපාර්තමේන්තු නියෝජනය වන නිලධාරීන් සෑම කොට්ඨාශයක් සඳහාම සේවයේ යෙදී සිටී ග්‍රාමීය මට්ටමේ ගොවීන් හා සමීපව සිටින එකම නිලධාරියා කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර වරයා පමණි. බොහෝ විට ඔහුගෙන් අදාල සම්බන්ධීකරණ කටයුතු සිදු කෙරුණත් වෙනත් තාක්ෂණ සේවා ලබාගැනීම් සඳහා එම අදාල නිලධාරීන්ගේ සේවය ලබාගත යුතුය. වත්තේගෙදර වසම නියෝජනය වන වී හා අපනයන බෝග යන ක්ෂේත්‍ර සඳහා වූ ක්ෂේත්‍ර නිලධාරීන් උස්සාපිටිය ගොවිජන කේන්ද්‍රයට අනුයුක්ත වී ඇත.

පොල් හා තේ වගාව සම්බන්ධ අදාල නිලධාරීන් බැම්මිණිවත්ත සහ අරනායක නගරවල තම කාර්යාල පවත්වාගෙන යයි.

තේ ශක්ති වැඩසටහන වත්තේගෙදර ගම තුල ද ක්‍රියාත්මකව පවතී. තේ වගා කරුවන්ට සහාය දීම සඳහා යම් සේවයක් ඒ නිලධාරීන් මගින් ලබා ගැනීමට හැකියාව ලැබී ඇත්තේ තේ ශක්ති වැඩසටහන යටතේ ඒකරාශී වීම හේතුවෙනි. විවිධ රාජ්‍ය නිලධාරීන්ගෙන් කෘෂිකාර්මික උපදෙස් මෙන්ම බීජ, පොහොර හා ජල පාලනය සම්බන්ධ තාක්ෂණ උපදෙස් හා සේවාවන් ලබාගැනීම පිළිබඳව සමීක්ෂණයට භාජනය වූ නියැදි ජනගහණයෙන් විමසා සිටින ලද අතර, පිළිතුරු වගු 6.1 න් දක්වයි.

වගුව 6.1 - වගා කටයුතු සඳහා උපදෙස් ලබාගැනීම

| | කෘෂි උපදේශක ගෙන් | ප්‍රාදේශීය නිලධාරී ගෙන් | කෘ.ප.නි. ස.ගෙන් | ගොවි සංවිධානය මගින් | වෙළෙඳුන් | ගොවීන් | ලබා නොගනී |
|---|---|---|---|---|---|---|---|
| | ප්‍රකාශිත සංඛ්‍යාව | ප්‍රකාශිත සංඛ්‍යාව | ප්‍රකාශිත සංඛ්‍යාව | ප්‍රකාශිත සංඛ්‍යාව | ප්‍රකාශිත සංඛ්‍යාව | ප්‍රකාශිත සංඛ්‍යාව | ප්‍රකාශිත සංඛ්‍යාව |
| 1. වගා ක්‍රම | 5 | 1 | 5 | 1 | | 2 | 36 |
| 2. බීජ හා රෝපන ද්‍රව්‍ය | 1 | 1 | 4 | 1 | | 2 | 36 |
| 3. පොහොර | 3 | | 3 | 1 | 1 | 2 | 36 |
| 4. කෘෂි රසායන | | 1 | 2 | 2 | 2 | 2 | 33 |
| 5. යන්ත්‍ර හා උපකරණ | | | | | | | 38 |
| 6. අලෙවිය | | | 1 | | | | 34 |
| 7. ගොවි ණය | | | 1 | | | | 34 |
| 8. රක්ෂණය | | | 1 | | | | 34 |

මෙහිදී කෘෂි සේවා හා උපදෙස් ලබාගැනීම එක් එක් බෝගයන්ට අදාල වන ලෙස ලබා නොගෙන පොදුවේ සියළු බෝගයන් සඳහා උපදෙස් පැතීම පිළිබඳව තොරතුරු ලබාගෙන ඇත. වගුව 6.1 අනුව පෙනී යන්නේ වගා කටයුතු සඳහා උපදෙස් ලබාගැනීම ඉතා අවම මට්ටමක පවතින බවය. කෘෂි හා තාක්ෂණ උපදෙස් ලබා ගන්නා අය මෙම උපදෙස් ලබා ගැනීම සඳහා කෘ.ප.නි.ස. කෙරෙහි විශ්වාසය තබා ඇත. උපදෙස්

ලබාගැනීම පිළිබඳව විමසීමේ දී ගොවීන් බහුතරයක්ම කිසිම උපදෙසක් ලබා නොගන්නා බව වාර්තා කර ඇත.

කෘෂි ක්‍රියාකාරකම් සඳහා සේවාවන් ලබාගැනීම ද ඉතා අවම මට්ටමකින පැවතුනි. සේවාවන් ලබාගැනීමට යොමු වී ඇති සුලු පිරිස ද එම සේවාවන් ලබාගැනීම ගොවිජන සේවා මධ්‍යස්ථානය මගින් හා කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන්ගෙන් ලබා ගනී. සමීක්ෂණයට භාජනය වූ නියැදියේ කෘෂි සේවාවන් ලබා ගන්නා බවට ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ඒ සේවාවන් ලබාගනී. ලබාගන්නා සේවාවන් අතර ප්‍රධාන තැනක් ගන්නේ සහනාධාර යටතේ පොහොර ලබා ගැනීමත්, බිත්තර වී ලබා ගැනීමත් පමණක් බව වාර්තා විය.

### 6.3.2 බීජ භාවිතය

වී වගාව සඳහා බීජ හා පොහොර භාවිතය පිළිබඳව තොරතුරු 2005/2006 මහ කන්නයට අදාලව ලබා ගන්නා ලදී. ලබාගත් දත්ත අනුව ගොවීන් වැඩි පිරිසක් වී වගාවට අවශ්‍ය බිත්තර වී සඳහා තමන්ගේම පෙර අස්වනු වලින් ලබාගත් වී භාවිතා කරයි. උසස් වර්ගයේ බීජ ගොවීන් අතර ජනප්‍රිය වී ඇත. ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් බිත්තර වී ලබාගත් බවට ගොවීන්ගෙන් 11% ක් වාර්තා කල අතර බීජ ලබා ගැනීම පිළිබඳව ගැටලු ඇති බවත් මෙහිදී අනාවරණය නොවුනි. වී වගා කල ගොවීන්ගෙන් 93% ක්ම බිත්තර වී ලබාගැනීම අපහසු නොවන බව පවසා සිටී. එසේ වන්නේ ඔවුන් නිතරම තමන්ගේම වී බිත්තර වී සඳහා භාවිතා කරන බැවිනි.

### 6.3.3 පොහොර භාවිතය

2005/2006 මහ කන්නයේ වී වගාව සඳහා භාවිතා කල පොහොර පිළිබඳව සලකා බැලීමේ දී වී ගොවිතැන සඳහා යෙදීමට අනුමත කල පොහොර ප්‍රමාණයන් වගාව සඳහා යොදා ඇති බව පෙනෙන්නට තිබුනි. පොහොර සහනාධාරය යටතේ අනුමත පොහොර ප්‍රමාණය ලැබීම් මත ඒවා භාවිතා කිරීමට හැකිවී ඇත. මෙම කන්නයේ දී ගොවීන් වැඩි පිරිසක් පොහොර ලබාගෙන තිබුනේ ගොවිජන සේවා මධ්‍යස්ථානය මගිනි. මීට අමතරව සමුපකාරය මගින් ද පොහොර සපයාගෙන ඇත. පොහොර සහනාධාරය ක්‍රියාත්මක වීම මත මේ ආයතන හරහා පොහොර ලබාගැනීමට ගොවීන්ට හැකියාවක් මෙම කන්නයේ දී ලැබී ඇත. සහනාධාර යටතේ ලබාදෙන පොහොර ලබාගැනීමට නොහැකි වූ ගොවීන් කිහිපදෙනෙකු පමණක් වෙනත් මාර්ගවලින් පොහොර ලබාගෙන තිබුනි. ඒ සඳහා වෙළඳපොලේ පවතින මිල ගෙවීමට සිදුවී ඇත. කුඹුරුවලට කාබනික පොහොර ලෙස සකස් කල පොහොර භාවිතයක් ගොවීන් අතර සිදු නොවේ. එසේ නමුත් කුඹුරු සකස් කරන අවදියේ දී කොළ අතු, පිදුරු වැනි දේ දැමීමට ගොවීන් පුරුදු වී සිටී.

ගොඩ ඉඩම්වල බහුලව වගා කරනු ලබන කරාබු, පොල්, රබර්, ගම්මිරිස් වැනි වගාවන් සඳහා පොහොර යෙදීම ක්‍රමානුකූලව සිදු කරන්නේ නැත. විශේෂයෙන් පොල් හා රබර් වගාව සඳහා නිර්දේශිත පොහොර

යෙදීමට ගොවීන් උනන්දුවක් නොදක්වයි. එයට ප්‍රධාන හේතුවක් වන්නේ මෙම පොහොර ලබා ගැනීමට ඇති දුෂ්කරතාවයයි. පොහොර මිලදී ගැනීමට හැක්කේ අරනායක, මාවනැල්ල වැනි නගර වලිනි. එබැවින් ප්‍රවාහනයට ද අධික මිලක් ගෙවීමට සිදුවන නිසා මෙම පොහොර යෙදීමට උනන්දුවක් නොමැත. තේ වගාකරුවන් තේ ශක්ති සමිතියට සම්බන්ධ වී තිබීම හේතුවෙන් එම සමිතිය හරහා තේ පොහොර ලබා ගැනීමට හැකියාවක් ලැබී ඇත.

6.4 ජල පාලනය

වී වගාවට අවශ්‍ය ජලය ගම හරහා ගලා බසින ඇල මාර්ගයන්හි ජලය හරස් කිරීමෙන් ලබා ගනී. යල – මහ දෙකන්නයම වගා කිරීමට ප්‍රමාණවත් ජලය මෙහි ඇත. මෙම ඇල මාර්ග සහ අමුණනිසි පරිදි නඩත්තුවක් කර නොමැත. එබැවින් ජලය අපතේ යන බවක් වාර්තා වුනි. ක්‍රමවත් අමුණු පද්ධතියක් ඉදි කර ක්‍රමානුකූලව ජලය සැපයීමක් සිදු කිරීමට හැකියාව ඇත.

.6.5 නිෂ්පාදනය

වී නිෂ්පාදනය හා නිෂ්පාදන වියදම් ගණනය කිරීම සඳහා 2005/2006 මහ කන්නයට අදාලව තෝරාගත් නියැදියේ වී වගා කරුවන්ගේ ආශ්‍රයෙන් නිෂ්පාදන වියදම් පිළිබඳව දත්ත ලබා ගන්නා ලදී, මේ දත්තයන් අනුව 2005/2006 මහ කන්නයේදී ගොවීන් ලැබූ සාමාන්‍ය වී අස්වැන්න අක්කරයට බුසල් 53 ක් විය. අදාල කන්නය සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයේ සාමාන්‍ය අස්වැන්න බුසල් 73 ලෙස වාර්තා වී ඇත. ඒ අනුව වත්තේගෙදර ගොවීන්ගේ වී අස්වැන්නේ ප්‍රමාණය පවතින්නේ 38% ප්‍රමාණයකින් අඩුවෙනි. මෙසේ අඩු අස්වැන්නක් ලැබීමට හේතු කිහිපයක් බලපා ඇත. නව තාක්ෂණ විධි අනුගමනය නොකිරීම හා ප්‍රදේශයේ පවතින දේශගුණික තත්ත්වය මෙයට බලපාන ප්‍රධාන හේතුන් ලෙස සඳහන් කල හැක. හෙල්මලු ක්‍රමයට සකස් වී ඇති කුඹුරු ඉඩම් වීමත් ඒ අවට වෙනත් ස්ථිර වගාවන් නිසා ප්‍රමාණවත් ආලෝකය නොලැබීමත් දක්නට ඇත. එය ද අඩු අස්වැන්නක් ලැබීමට හේතුවක් වේ.

6.6 නිෂ්පාදන වියදම හා ලාභය.

වත්තේගෙදර ප්‍රදේශයේ වී වගාව කෙතරම් දුරට ආර්ථිකමය වශයෙන් වැදගත් වගාවක් වන්නේ දැයි බැලීම සඳහා වී වගාවේ නියුතු ගොවීන් 10 දෙනෙකු ආශ්‍රයෙන් නියැදි සමීක්ෂණයක් මගින් දත්ත ලබා ගන්නා ලදී, මෙහිදී වී වගාව සඳහා වැය වන ද්‍රව්‍යමය වියදම් පමණක් නොව භාවිතා කළ පවුල් හා කළ ශ්‍රමය ද ඇතුළු සියළු සම්පත් පිළිබඳව සලකා බලා නිෂ්පාදන වියදම ගණනය කෙරුනි.

ලබාගත් දත්ත අනුව මෙහි 2005/2006 මහ කන්නයේ නිෂ්පාදන වියදම (පවුල් ශ්‍රමය හැර) අක්කරයකට රු. 16904/- ක් විය. පවුල් ශ්‍රමය ද සමග ගණනය කිරීමේදී එය රු. 41047/- ක් වන ඉහළ අගයක් ගනී.

නිෂ්පාදන වියදමේ දායකත්වය, පවුල් ශ්‍රමය, කුලී ශ්‍රමය හා වෙනත් යෙදවුම් අනුව වර්ගීකරණය කර බැලීමේ දී වියදමින් 55% ක් වන වැඩි දායකත්වයක් පවුල් ශ්‍රමය තුලින් ලබා දේ. එසේම කුලී ශ්‍රම දායකත්වය නිෂ්පාදන වියදමින් 22% කි. වෙනත් යෙදවුම් සඳහා 28% ක දායකත්වයේ යෙදේ. මේ දත්ත අනුව පෙන්වන්නේ වී ගොවිතැන වැඩි පවුල් දායකත්වයක් තුල සිදු කරන යැපුම් මට්ටමේ ගොවිතැනක් බවයි.

අදාල කන්නයේ දී අක්කරයට කි.ග්‍රෑ. 1227/- ක අස්වැන්නක් වාර්තා විය. පවතින සම්මත වී මිල අනුව ගණනය කිරීමේ දී පවුල් ශ්‍රම වටිනාකම නො සලකා වී වගාවෙන් අක්කරයට රු. 4568/- ක ලාභයක් වී වගාවෙන් වාර්තා වේ. වී වගාවේ දී වැය වී ඇති අධික පවුල් ශ්‍රම වටිනාකම සැලකීමේ දී වී වගාවෙන් ලාභයක් වාර්තා නොවේ.

## 6.7 අලෙවිය

වත්තේගෙදර වසමේ වී වගාව ඉතා සුලු වශයෙන් කරන වගාවක් බැවින් අලෙවිය සඳහා නොව පාරිභෝජන අවශ්‍යතා සපුරාලීමට පමණක් ප්‍රමාණවත් වේ. කෘෂි බෝගවලින් අලෙවිය සඳහා යොදාගත්තේ කරාබු, ගම්මිරිස්, රබර්, තේ වැනි බෝගයන් ය. ගෙවතුවල ඇති පොල් වගාව වැඩි වශයෙන් කරන අය හට සුලු අතිරික්තයක් අලෙවි කිරීමට හැකියාව ඇත. අපනයන බෝග අලෙවිකිරීමේ මධ්‍යස්ථාන ගම තුල නොමැත. එබැවින් එම නිෂ්පාදන අලෙවි කිරීම සඳහා නගරයට රැගෙන යා යුතුය. අපනයන බෝග අලෙවිකරන මාර්ග පිළිබඳව වගු 6.3 න් පෙන්වයි.

වගුව 6.2 – අලෙවි මාර්ග

| අලෙවි මාර්ග | සංඛ්‍යාව | % |
|---|---|---|
| 1. පාරිභෝගිකයන්ට | 2 | 1.7 |
| 2. සිල්ලර වෙළෙන්දන්ට | 20 | 17.0 |
| 3. අතරමැදියන්ට | 26 | 22.8 |
| 4. තොග වෙළෙන්දන්ට | 82 | 71.8 |
| 5. වෙනත් | 6 | 5.1 |

වත්තේගෙදර ගමේ බහුතරයක් ගොවීන් තම අස්වනු අලෙවි කිරීම සඳහා තොග වෙළඳුන් කරා රැගෙන යන බව මෙම දත්ත අනුව පෙනී යයි. කරාබු, ගම්මිරිස්, රබර් වැනි බෝගයන් අලෙවිය සඳහා මෙසේ නගරයේ තොග වෙළඳුන් කරා රැගෙන යනු ලබයි. බොහෝ විට මෙම අස්වනු රැගෙන යන්නේ අරනායක, මාවනැල්ල,අස්මඩල හා උස්සාපිටිය යන දුරින් පිහිටි නගර වෙත ය. මේ සඳහා සැතපුම් 5 කට වඩා දුරක් රැගෙන යාමට සිදු වේ. මෙවැනි බෝග අස්වනු මිලට ගන්නා ස්ථාන ගම තුල නොමැත. ගමේ සුළු තේ වතුවලින් නෙලා ගන්නා තේ දළු එකතු කිරීමේ කාර්යයේ ගමේ කිහිප දෙනෙකු නියැලී සිටින අතර, ඔවුන් එකතු කරන තේ දළු අලෙවිය සඳහා නගරයට රැගෙන යනු ලබයි.

6.8 සත්ව පාලනය

වත්තේගෙදර ගමේ සත්වපාලන කටයුතු සිදුවන්නේ ඉතා අවම මට්ටමකිනි. පවුල් කිහිපයක් පමණක් සත්ව පාලනයේ යෙදී ඇති අතර ඔවුන් එලගවයන්, මීගවයන් හා කුකුලන් ඇති කිරීම සිදු කරනු ලබයි. ග්‍රා.නි. වරයාගෙන් ලබාගත් දත්ත අනුව සමස්ත ග්‍රා.නි. වසමේම සිටින එල ගවයන්, මීගවයන් සංඛ්‍යාව පිළිවෙලින් 7 ක් හා 10 ක් පමණි. කුකුලන් සංඛ්‍යා 15ක් පමණි. සත්වපාලනය සඳහා ප්‍රමාණවත් සම්පත් මේ ගමෙහි ඇත. තණකොළ හා ජලය පහසුවෙන් ලබාගත හැකියාව පවතී. එසේ වුවත් මේ කාර්යයෙහි යෙදී ඇත්තේ ඉතා සුලු සංඛ්‍යාවක් පමණි. සත්ව පාලන කටයුතු සම්බන්ධයෙන් එහි නියැලිමේදී මුහුණ දෙන ගැටලු හා සතුන් පාලනය නොකිරීමට හේතු සමීක්ෂණයේදී තෝරාගත් නියැදියෙන් විමසා සිටින ලදී. සත්වපාලන කටයුතුවල නියැලී සිටින බවට වාර්තා කලේ පවුල් 14 ක් පමණි. සත්ව පාලන කටයුතු නොකිරීමට ඇති හේතු පිළිබඳව අන් අයගෙන් ඔවුන්ගේ මතය විමසන ලදුව පිළිතුරු පහත සඳහන පරිදි විය. (වගුව ..)

වගුව 6.3 – සත්ව පාලනයේ නොයෙදීමට හේතු

| හේතුව | ප්‍රකාශිත සංඛ්‍යාව | % |
|---|---|---|
| 1. සතුන් ඇති කිරීමට ඇති අකමැත්ත | 46 | 46.0 |
| 2. ඇතිකිරීමට සතුන් නොමැතිකම | 1 | 1.0 |
| 3.දැනුමක් නොමැතිකම | 7 | 7.0 |
| 4. ඉඩම් නොමැතිකම | 25 | 25.0 |
| 5. ශ්‍රම හිඟය | 24 | 24.0 |
| 6. අලෙවි ගැටලු | 1 | 1.0 |
| 7. වෙනත් | 3 | 3.0 |

ප්‍රකාශිත පිළිතුරු දෙස බැලීමේ දී බහුතරයක් ගොවීන් 46 (46%) සතුන් ඇති කිරීමට ඇති අකමැත්ත මත සත්ව පාලන කටයුතුවල නොයෙදේ. ඉඩම් නොමැතිකමත් ශ්‍රම හිඟයත් සත්ව පාලන කටයුතුවල නොයෙදීමට බලපා ඇති තවත් ප්‍රධාන හේතු දෙකකි. සත්ව පාලනයේදී උසස් සත්වපාලන විධි ක්‍රම හෝ විධි පිළිවෙත් කිසිවක් භාවිතා නොකරයි. ඇතිකරන සතුන් ද උසස් වර්ගයේ ඒවා නොව දේශීය සතුන් වේ. මී ගවයන් ගොවිතැන් වලට යොදාගනී. මීගවයන් හිමිඅය හරකුන් කුලියට දීමෙන් ආදායම් ලබාගනී. සත්ව නිෂ්පාදන හා අලෙවිය පිළිබඳ දත්ත ලබාගැනීමට තරම් සත්ව නිෂ්පාදනයක් මෙහි නොවීය. සත්ව නිෂ්පාදනයේ නියැලී ඉන්නා අය මුහුණ දෙන ගැටලු ප්‍රශ්න ගැන විමසීමේ දී පශු වෛද්‍ය සේවාවේ දුර්වලතා, ව්‍යාප්ති සේවාවක් නොමැතිකම, දැනුම අඩුකම, මුදල් හිඟකම ප්‍රධාන ගැටලු ලෙස පෙන්වා දෙන ලදී.



LIBRARY

7 වන පරිච්ඡේදය

# ප්‍රජා සංවිධාන හා ජනතා සහභාගිත්වය.

## 7.1 ගමේ ඇති ප්‍රජා සංවිධාන හා ක්‍රියාකාරී බව

වත්තේගෙදර ගමේ ප්‍රජා සංවිධාන කිහිපයකම ක්‍රියාත්මක වේ. මරණාධාර සමිති 2 ක්, ග්‍රාම සංවර්ධන සමිතිය, තරුණ සමිතිය, තේ ශක්ති සමිතිය, ගොවි සංවිධානය යන ප්‍රජා සංවිධාන මෙම ගම තුල ක්‍රියාත්මක වන සමිති වේ. මීට අමතරව සමෘද්ධි සමිතිය ද මෙම ගමේ ක්‍රියාත්මක සමිතියකි. ග්‍රාම සංවර්ධන සමිතිය වැඩිම සාමාජික සංඛ්‍යාවක් (200) දරණ නමුත් එය ක්‍රියාත්මක භාවයෙන් පවතින්නේ සාමාන්‍ය තත්ත්වයකිනි. වෙනත් ගම්වල මෙන්ම මෙම ගමේ ද මරණාධාර සමිතිය වඩාත් ක්‍රියාත්මකව පවතී. තේ වගා කරුවන්ගෙන් සමන්විත (සාමාජිකයන් 37) තේ ශක්ති සමිතිය ද ක්‍රියාශීලී සමිතියකි. ගොවි සංවිධානය සාමාජිකයින් 68 කින් සමන්විතව ඇති අතර සාමාන්‍ය මට්ටමෙන් ක්‍රියාශීලී තත්ත්වයක පවතී.

### මරණාධාර සමිතිය

වඩාත්ම ක්‍රියාශීලී තත්ත්වයෙන් පවතින මරණාධාර සමිතිය මාස් පතා රැස්වීම් පවත්වයි. මරණයක දී මූල්‍යමය ආධාර සැපයීමත්, අවසන් කටයුතු සිදු කරන දිනයේ දී එම නිවසට අවශ්‍ය ආහාරපාන සපයා දීමත් මරණාධාර සමිතිය තුලින් සිදුවන ප්‍රධාන කාර්යභාරයකි. ඊට අමතරව අවමංගල්‍ය නිවසට අවශ්‍ය පුටු, මඩු ආදිය සපයා දීමද සිදු කරනු ලබයි. ගමේ කවුරුත් පාහේ රැස්වීම් සඳහා ක්‍රියාශීලීව සහභාගි වන සමිතිය මරණාධාර සමිතියයි. සාමාන්‍ය සහභාගිත්වය 98% පමණ වන ඉහළ මට්ටමක පවතී. අවමංගල්‍යය අවස්ථාවකදී අවශ්‍ය කටයුතු පහසුවෙන් කර ගැනීම සඳහා අවමංගල්‍යාධාර සමිතිය තුලින් මෙම ගමෙහි ද විශාල සේවයක් ඉටු වේ.

### ග්‍රාම සංවර්ධන සමිතිය

මෙය ගමේ පිහිටුවා ඇති පැරණි සමිතියකි. පාරවල් සකස් කිරීම වැනි ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවල නියැලී සිටින අතර අරමුදල් හිඟවීම ජනතා සහභාගිත්වය අඩු වීම වැනි බාධක මත සාමාන්‍ය ක්‍රියාශීලී තත්ත්වයක පවතින්නකි. රැස්වීම් සඳහා සහභාගිත්වය ඉතා අවම මට්ටමකින් පවතින බව වාර්තා විය.

### තේ ශක්ති සමිතිය

තේ වගා කරුවන්ගෙන් පමණක් සමන්විත ඔවුන්ගේ අභිවෘද්ධිය සඳහාම පිහිටුවා ඇති සමිතියකි. මෙම සමිතියේ සාමාජිකයන්ට සහනාධාර මිලකට පොහොර ලබාගැනීමට හැකියාව ඇත. තේ අලුතින් වගා

කරන්නන් සඳහා පොහොර, පැල ආදිය ලබාගැනීම මෙම සමිතිය තුලින් ලබාගත හැකි තවත් සහනයකි. ශක්ති සමිතියේ රැස්වීම් මාස 2 කට වරක් රැස්වන අතර ඒ සඳහා හොඳ සහභාගිත්වයක් ද දක්නට ඇත.

**සමෘද්ධි සමිතිය**

ගමේ සමෘද්ධිලාභී පවුල්වල සාමාජිකයන්ගෙන් සමන්විත සමෘද්ධි සමිතිය ද ගමේ සංවර්ධන වැඩකටයුතු වලදී යම් දායකත්වයක් දරයි. සමෘද්ධි අධිකාරිය මගින් සමිතියට ලැබෙන වාර්ෂික අරමුදල් වලින් ග්‍රාමීය පාරවල් කොන්ක්‍රීට් දැමීම වැනි වැඩකටයුතු හා පාරවල් ආශ්‍රිත ශ්‍රමදාන වැඩ සංවිධානය කිරීම් මේ සමිතිය මගින් ඉටු වන ප්‍රධාන සේවාවන් ය. සමෘද්ධි සමිති රැස්වීම් සඳහා සහභාගිත්වය 97% වැනි ඉහළ තත්ත්වයක පැවතුනි.

සමෘද්ධි සමිතියේ රැස්වීම් සමෘද්ධි සංවර්ධන නිලධාරී වරයාගේ මූලිකත්වයෙන් පවත්වනු ලබයි. ග්‍රාමීය සංවර්ධන කටයුතු සඳහා සමිතියට ලැබෙන අරමුදල් වැය කර ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩකටයුතු (කොන්ක්‍රීට් දැමීමට) කිහිපයක් මෙහි සිදුකර ඇත. මෙම ව්‍යාපෘතිවලදී සමෘද්ධි ලාභීන්ගේ ශ්‍රම දායකත්වය ලබා ගනී.

7.2 සමෘද්ධි සංවර්ධන බැංකු සංගමය

සමෘද්ධි සංවර්ධන බැංකු සංගම් කාර්යාලය උඩුවේවෙල ගමේ පිහිටා ඇත. වත්තේගෙදර වසමේ සමෘද්ධිලාභී පවුල් 106 ක් සිටින අතර එම පවුල් පහත සඳහන් පරිදි සමෘද්ධි ප්‍රතිලාභවලට හිමිකම් කියනු ලබයි.

| මාසික දීමනාව | පවුල් සංඛ්‍යාව |
|---|---|
| රු. 900.00 | 13 |
| රු. 525.00 | 03 |
| රු. 415.00 | 42 |
| රු. 375.00 | 01 |
| රු. 210.00 | 47 |

සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා සමෘද්ධි බැංකුව මගින් විවිධ ණය ක්‍රම ක්‍රියාත්මක කරනු ලබයි. වත්තේගෙදර වසමේ සමෘද්ධි ලාභීන් ද නිවාස සෑදීම, වගා කටයුතු, සුලු කර්මාන්ත සඳහා එම ප්‍රතිලාභ ලබාගෙන ඇත. 30.06.06 දිනට වත්තේගෙදර වසම තුල ක්‍රියාත්මක ණය සංඛ්‍යාව 16 ක් (ණය ලාභීන් 16) බවට වාර්තා විය. ඔවුන් ලබාගෙන තිබූ මුළු ණය මුදල රු. 135000/- කි. විවිධ සුලු කර්මාන්ත සඳහා මේ ණය ලබාගෙන තිබූ අතර රු. 5000/- සිට රු. 15000/- වූ ණය ප්‍රමාණයන් ලබාගෙන තිබුනි. තේ පැල වගාව, වඩු කර්මාන්තය, අත්කම් (වට්ටි, පෙට්ටි විවීම) සිල්ලර වෙළඳාම සඳහා මෙම ණය ලබාගෙන තිබුණි. ණය පොලී අනුපාතය 14% සිට 18% අතර දක්වා පැවති අතර ආපසු ගෙවීමේකාල සීමාව මාස 12 සිට 24

දක්වා වේ. ලබා ගන්නා ණය මුදලේ ප්‍රමාණය අනුව ගෙවිය යුතු පොලිය හා ණය ආපසු ගෙවීමේ කාලය බැංකුව විසින් තීරණය කරනු ලබයි.

ගමේ පවතින සමිති සමාගම් පිළිබඳව ප්‍රජාව ලබාදුන් තොරතුරු අනුව ගමේ බහුතරයක් (66% ක්ම) මරණාධාර සමිතිය වඩා ප්‍රයෝජනවත් සමිතිය බව ප්‍රකාශ කරයි. එසේම එය වඩාත්ම ක්‍රියාශීලී සමිතිය ලෙස ද වාර්තා කරයි. එසේ ක්‍රියාශීලී වීමට හේතු ලෙස පෙන්නුම් කරන්නේ ඉන් මරණයකදී ලබා දෙන මුල්‍ය හා වෙනත් ප්‍රතිලාභ හේතුවෙනි. සමෘද්ධි සමිතිය ප්‍රයෝජනවත් බවින් දෙවැනි තැන ගනී. එසේම එය ක්‍රියාශීලී බවින් ද දෙවැනි තැනට වාර්තා කර ඇත.

8 පරිච්ඡේදය

# හඳුනාගත් ගැටලු හා සංවර්ධන අවශ්‍යතාවයන්

## 8.1 හඳුනාගත් ගැටලු

වත්තේගෙදර ගම්වාසීන් මුහුණදෙන ප්‍රධාන ගැටලු ද සමීක්ෂණයේ දී හඳුනාගන්නා ලදී. නියැදි ජනගහණයෙන් ලබාගත් තොරතුරු අනුව ඔවුන් මුහුණ දෙන ගැටලු ප්‍රමුඛත්වය අනුව පෙළ ගැස්සීමේ දී පහත සඳහන් පරිදි පෙන්වා දිය හැක.

1) මාර්ග අපහසුතා
2) ප්‍රවාහන පහසුකම් නොමැතිකම
3) සෞඛ්‍ය මධ්‍යස්ථානයක් නොමැති වීම
4) තැපැල් පහසුකම්/සංනිවේදන පහසුකම් නොමැතිකම
5) සමුපකාර වෙළඳසැලක් නොමැතිවීම
6) කෘෂි උපදෙස් හා ව්‍යාප්ත සේවා ලබාගැනීමේ අපහසුතා
7) නීත්‍යානුකූල ඉඩම් හිමිකම් නොමැතිවීම (පොරෝමාරුව ජනපද ඉඩම් හිමි අය)
8) ක්‍රීඩා පහසුකම් සඳහා ස්ථානයක් නොමැතිවීම
9) සත්ව පාලනය සඳහා උපදෙස් ලබාගැනීමේ අපහසුතා.
10) ක්‍රමවත් පානීය ජල සැපයුම් ක්‍රමයක් නොමැතිකම
11) කෘෂි බෝග අලෙවිකිරීමේ/මිලදී ගැනීමේ මධ්‍යස්ථාන නොමැතිවීම.

## 8.2 සංවර්ධන අවශ්‍යතාවයන්.

- වත්තේගෙදර ගමේ පිහිටීම අනුව ගමට ලගා වීම සඳහා හොඳ මාර්ග පද්ධතියක් නොමැතිවීම තුල මෙම ගම්වැසියන්ට දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දීමට ඇත. ගමට ප්‍රවිශ්ඨ වීමට ඇති ප්‍රධාන මාර්ග පද්ධති 3 සංවර්ධනය කර වාහන ගමනයට සුදුසු තත්ත්වයකට පත් කිරීම තුලින් ගමේ ප්‍රධාන ප්‍රශ්න රාශියක් විසඳා ගැනීමට හැකි වේ. ඒ සමගම ගමතුල පවතින මාර්ග පද්ධතිය ද ගමනාගමනය පහසු වන පරිදි සංවර්ධනය කළ යුත්තකි.

- මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම තුලින් ගම්මුන්ගේ ප්‍රවාහන ප්‍රශ්නය විසඳෙන අතර ම ඒ තුලින් ඔවුන්ගේ කෘෂි නිෂ්පාදන සඳහා හොඳ අලෙවිපලක් ද ඇතිවීමට හැකියාව ඇත. දැනට අස්මඩල හා ඇරැව්වල නගර දක්වා පමණක් ධාවනය වන බස් රථ සේවාව වත්තේගෙදර ගම දක්වා දීර්ඝ කිරීම තුලින් ගම්මුන්ටත්, පාසැල් දරුවන්ටත් ඉතාමත් පහසුවක් ඉටු වේ.

- ගමේ සෞඛ්‍ය පහසුකම් ලබාගැනීම සඳහා මධ්‍යස්ථානයක් ඇති කිරීම කාලීන අවශ්‍යතාවයකි. විශේෂයෙන් මහලු අයට, දරුවන්ට, ගර්භනී මාතාවන්ට ප්‍රාථමික සෞඛ්‍ය පහසුකම් වත් ලබාගැනීමට ස්ථානයක් ඉදිකිරීමේ අවශ්‍යතාවය පවතී.

- ප්‍රාථමික අධ්‍යාපනය ලබාගැනීම සඳහා ඇති අස්මඩල විද්‍යාලයට අවශ්‍ය පහසුකම් ලබාදීම. මෙමගින් ගමේ දරුවන්ගේ ප්‍රාථමික පාසල් අධ්‍යාපන මට්ටම ඉහළ නැංවීමට හැකියාව ඇති අතරම වැඩිදුරක් ගෙවා නගරයට යාම ද වලක්වා ගත හැකි වේ.

- කෘෂිකාර්මික ගමක් වන වත්තේගෙදර අධික බෑවුම් සහගත තත්ත්වය නිසාවෙන් වැසි අධික කාලයේ දී සෝදා පාලුවට ලක් වේ. මේ නිසා පාංශු රක්ෂණ ක්‍රම පිළිබඳව ගොවි ජනතාව දැනුවත් කිරීම, ආදර්ශන පැවැත්වීම ආදිය සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කිරීම තුලින් පසේ සාරවත් භාවය ආරක්ෂා කර ගැනීම සඳහා දායක විය හැකිය.

- පොරෝමාරුව කොටසේ නීත්‍යානුකූල ඉඩම් ඔප්පු නොමැති ජනතාවට ඉඩම් හිමිකම ලබාදීම තුලින් ඔවුනට රාජ්‍ය නිලධාරීන්ගේ ද සහාය ලබාගෙන එම ඉඩම් සංවර්ධනය කරගැනීමට හැකියාව ලැබේ.

- තැපැල් හා සංනිවේදන පහසුකම් සඳහා තැපැල් කාර්යාලයක් ගම මධ්‍යයේ ඉදි කිරීම වැදගත් අවශ්‍යතාවයකි. සාධාරණ මිලට පාරිභෝගික ද්‍රව්‍ය ලබාගැනීම සඳහා සමුපකාර අලෙවිසැලක් ද තවත් අත්‍යාවශ්‍ය සේවාවකි.

- කෘෂි ව්‍යාප්ත සේවාවන් ලබාදීම වැඩි දියුණු කල යුතු තවත් අවශ්‍යතාවයකි. තාක්ෂණය හා උපදෙස් ලබාදීම තුලින් කෘෂි නිෂ්පාදන වල උසස් ඵලදායිතාවයක් අපේක්ෂා කළ හැක.

- ගමේ පවතින කෘෂි සම්පත් උපයෝගීකරගෙන ස්වයං රැකියා අවස්ථා ඇති කිරීම තුල රැකියා විරහිත අය සඳහා රැකියා උත්පාදනය කිරීමේ අවස්ථා ද පවතී.

- ක්‍රමවත් සත්වපාලන කටයුතු කිරීම සඳහා ජලය ඇතුලු පහසුකම් ප්‍රමාණවත් පරිදි ඇති මෙහි සත්ව පාලනය දියුණු කිරීමේ හැකියාව පවතී. ඒ සඳහා උනන්දුවක් දක්වන්නන්ට අවශ්‍ය රාජ්‍ය අනුග්‍රහය ලබාදීමෙන් සත්ව පාලන අංශය සංවර්ධනය කිරීමට හැකියාව පවතී.

- ගමේ පවතින වටිනා දැව සම්පත විනාශවීම වැළැක්වීම සඳහා පියවරයන් ගැනීම ද කාලීන අවශ්‍යතාවයකි. හොඳ පියවරයන් ගැනීම ද කාලීන අවශ්‍යතාවයකි. හොඳ මාර්ග පද්ධතියක් ඉදි වුවහොත් වන විනාශය තව තවත් උග්‍ර අතට හැරී වත්තේගෙදර වසමේජල සම්පතට අයහපත් බලපෑමක් එල්ල වේ.

සාරාංශය

**1.** ගම නැගුම වැඩසටහන යටතේ සංවර්ධනය කිරීම සඳහා තෝරාගත් වත්තේගෙදර ගමෙහි පූර්ව ව්‍යාපෘති අවධියේ ජනතාවගේ සමාජ, ආර්ථික තත්ත්වය පිළිබඳවත් ගමේ කෘෂිකාර්මික තත්ත්වයන් ගැන හා ගමෙහි යටිතල පහසුකම් පිළිබඳවත් විශ්ලේෂණයක් මෙම වාර්තාව මගින් ඉදිරිපත් කරයි. නියැදි සමීක්ෂණයක් මගින් හඳුනාගත් එම තොරතුරුවල සංක්ෂිප්තයක් පහත දැක්වෙයි.

2. ව්‍යාපෘති ප්‍රතිලාභීන් පිළිබඳව සාමාන්‍ය තොරතුරු

2.1 සම්පූර්ණයෙන් සිංහල – බෞද්ධ ජනතාවකින් සමන්විත වත්තේගෙදර වසමේ මුළු ජනගහණය 996 ක් විය. එහි ස්ත්‍රී හා පුරුෂ ජනගහණය පිළිවෙලින් 538 ක් හා 458 ක් විය. ගෘහයක සාමාන්‍ය ජනගහණය 3.9 ක් වූ අතර ගමේ යැපුම් මට්ටමෙ ජනගහණය 125 ක් විය. මෙම අධ්‍යයනය සඳහා නිවාස ඒකක 114 ක් තෝරාගත් අතර එම නියැදි ජනගහණය 446 ක් වූ අතර ස්ත්‍රී පුරුෂ සංයුතිය පිළිවෙලින් 219 හා 227 ක් විය.

2.2 වසමේ පාසල් යන වයසේ දරුවන් සියල්ලම පාසල් අධ්‍යාපනය ලබති. සාක්ෂරතාවය ද ඉහළ මට්ටමක පැවතුනි. නියැදි ජනගහණයේ අධ්‍යාපන තත්ත්වය සලකා බැලීමේදී ගමෙහි වැඩිහිටි අය ලබාගෙන ඇත්තෙ අඩු අධ්‍යාපන තත්ත්වයකි. ප්‍රදේශය ගමනාගමනය අතින් දුෂ්කර වීමත්, උසස් අධ්‍යාපන පාසල් දුරින් පිහිටා තිබීමත් මත වැඩිදුර අධ්‍යාපනය කෙරෙහි යොමු නොවී ඇති බව පෙනේ.

2.3 ගමේ නිවාස වලින් (50%) ව.අ. 500 ට අඩු නිවාස විය. ව.අ.1000 ට වැඩි නිවාස තිබුනේ **18.4.%** ක් පමණි. නිවාස ගොඩනැගීමට භාවිතා කළ ද්‍රව්‍ය අනුව වර්ග කිරීමේ දී 84.9% ක් ස්ථිර නිවාස ලෙස ද 2.0% ක් තාවකාලික නිවාස ලෙස ද 11.9.% ක් අර්ධ නිවාස ලෙස ද වර්ග කළ හැක. නිවාස 94.7% කටම වැසිකිලි පහසුකම තිබුනි. ඉන් 79.8% කටම ස්ථිර ජල මුද්‍රිත වැසිකිලි අයිතිය තිබුනි. 6.1% ක් තාවකාලික වැසිකිලි ඉදි කර ඇත. නිවෙස්වලට වාහනයකින් ලගාවීමට හැකි බව වාර්තා වී තිබුනේ 40.4.% ක් පමණි. ගමට විදුලිබල පහසුකම් ඇත. නිවාස 94% ක් පමණ විදුලිය ලබාගෙන තිබුනි.

2.4 ජල මාර්ග 6ක් මෙම ගම හරහා ගලා බසින බැවින් ජනතාවගේ බීම සඳහා මෙන්ම නෑම සඳහා ද ජලය සපයා ගැනීම එමගින් ඉටු කරනු ලබයි. මේ ජල මාර්ගවලින් නල යොදා ගම්මුන් බොහොමයක් බීම සඳහා ජලය ලබා ගනී. එසේ වුවත් මෙය ක්‍රමානුකූලව ඉදිකර ඇත්තක් නොව තම තමන් විසින් පෞද්ගලිකව ගොඩනගා ගත් ඒවාය. සර්වෝදය ව්‍යාපාරය මගින් ජලනල පද්ධතියක් ඉදි කර තිබුණත් එය දැන් අභාවයට පත් වී ඇත.

ගම්මුන් සතු ප්‍රවාහන උපකරණ ඉතා ස්වල්පයක් විය. එසමේ සමස්ත ගෘහයන්ගෙන් නිවාස 2 කට පමණක් ලොරි රථ අයත්ව තිබුණු අතර යතුරුපැදි සහ බයිසිකල් අයිතිය තිබුනේ පවුල් 2 ක් සහ 10 කට පමණි.

2.5 ප්‍රධාන නගරවලින් දුරස්ව කඳු බෑවුම් ප්‍රදේශයක පිහිටා ඇති වත්තේගෙදර ගම මාර්ග දුෂ්කරතා වලින් යුක්තය. යටිතල පහසුකම් ද ඉතා අඩු තත්ත්වයක පවතී. සේවා සපයන ආයතන අතරින් ගම තුල ඇත්තේ ග්‍රාම නිලධාරී කාර්යාලය හා සමෘද්ධි නිලධාරී වරයාගේ කාර්යාලය පමණි. ගොවිජන සේවා, හා වෙනත් කෘෂිකාර්මික සේවාවන් ලබා ගැනීම් සඳහා වූ ගොවිජන සේවා නිලධාරී කාර්යාලය පිහිටා තිබුනේ ගමේ සිට කි. මී. 6. ක් පමණ දුරින් වන්නට ය. මාර්ග දුෂ්කරතාවයන් මත නිලධාරී - ගොවී අතර පවතින්නේ දුරස්ථභාවයකි. ගමේ කුඩා දරුවන් අධ්‍යාපනය ලබන පාසල ද අභාවයට යමින් පවතී. දැනට එහි ඉගෙනුම ලබනුයේ සිසුන් 45 ක් පමණි. උසස් අධ්‍යාපන සහිත පාසල් කි.මී. 6-8 ක් දුරින් වූ උස්සාපිටිය අරණායක වැනි නගරවල පිහිටා ඇත. ගමේ විහාරස්ථානය වන ශ්‍රී සුදර්ශනාරාමය මගින් දහම් අධ්‍යාපනය සඳහා දහම් පාසලක් පවත්වා ගෙන යනු ලබයි. ප්‍රාථමික සෞඛ්‍ය පහසුකමක් හෝ ලබා ගැනීමට ස්ථානයක් නොමැත. වෛද්‍යවරයෙකු වෙත යාමට උස්සාපිටිය නගරයට යාමට සිදුවේ. ගමට අයත් තැපැල් කාර්යාලය ගලතර නගරයේ පිහිටා ඇත. එදිනෙදා පාරිභෝගික භාණ්ඩ ලබා ගැනීමට කුඩා සිල්ලර වෙළඳසැල් 07 ක් ගම තුල තිබුණත් සියලු අවශ්‍යතා ඒවායින් සපුරාගත නොහැක. වෙළඳපලේ සාමාන්‍ය මිලට වඩා වැඩි මිලක් ගෙවීමට ද සිදුවේ. සමුපකාර ප්‍රාදේශිකයක් ගම තුල නොමැත. ගම්මුන්ගේ නිෂ්පාදන අලෙවි කිරීමට ඇති ආසන්නම නගරය උස්සාපිටිය නගරයයි. එය කි.මී. 6 ක පමණ දුරින් පිහිටා ඇත.

2.6 ගමට ලඟාවීමට ප්‍රවිෂ්ඨ මාර්ග 3 ක් තිබුණත් වාහන ගමනය අසීරු ය. ආසන්නම බස් මාර්ගය වෙත කි.මී. 3 – 4 ක් දුර පයින් යා යුතුය. එනම් අස්මඩල හෝ ඇරැව්වල දක්වා ගොස් බස් රථයක් ලබාගත යුතුය. අරනායක සහ මාවනැල්ල සිට බස්රථ ධාවනය වන්නේ එම කුඩා නගරවලට පමණි. ගම්මුන්ගේ වෙළඳපල අවශ්‍යතා හෝ වෙනත් සියලු සේවාවන් ලබා ගැනීමට නගරවලට යාම මේ නිසා දුෂ්කර මෙන්ම අමතර වියදමක් ද දැරීමට සිදු වන්නකි. ගම තුල මාර්ග පද්ධතිය ඉතාමත් දුර්වල තත්ත්වයක පවතී.

3. ශ්‍රම බලකාය, රැකියා නියුක්තිය සහ ආදායම්.

3.1 වයස අවුරුදු 10 ට ඉහළ ජනකොටස් අයත් වන අතර ශ්‍රම බලකාය 384 ක් වූ අතර ප්‍රතිශතයක් වශයෙන් එය 86.1% කි. ශ්‍රම බලකායේ ස්ත්‍රී පුරුෂ නියෝජනය පිළිවෙලින් 49.7% හා 50.3% ක් විය. එමෙන්ම ශ්‍රම බලකායෙන් 93.1 ක් ම සේවා නියුක්ත වූ අතර 6.9% ක් සේවා වියුක්ත තත්ත්වයේ විය.

3.2 කෘෂිකර්මාන්තය බහුතරයකගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගයයි. ඒ යටතේ තම ගෙවතු සහ වෙනත් ගොඩ ඉඩම්වල වගා කර ඇති කරාබු, ගම්මිරිස්, රබර්, තේ, පොල් වැනි වගාවන්වල නියැලීම හා ඒ ආශ්‍රිත රැකියාවල නියැලි සිටිති. වත්තේගෙදර ජනගහණයෙන් රාජ්‍ය හෝ පෞද්ගලික අංශවල 26 දෙනෙකු රැකියාවල යෙදී සිටින අතර, විදේශ රැකියාවල 7 දෙනෙකු නියුක්ත වී සිටී. ගමේ 25 දෙනෙකු වෙළඳාම, දැව ඉරීම, පෙදරේරු වැනි ස්වයං රැකියාවල නියැලී සිටී. බහුතරයකගේ ප්‍රධාන රැකියාව ගොවිතැන වුවත් ඔවුන් අමතර ආදායම් සඳහා කෘෂි කම්කරු කෘෂි නොවන කම්කරු වැනි ද්විතියික රැකියාවල ද නියැලේ. ගමේ රැකියා නියුක්තිය 82% කි. මෙයට ගෘහණියන් ද වැටුප් නොලබන පවුල් ශ්‍රමිකයන් ද අයත් වේ. රැකියා විරහිත සංඛ්‍යාව 18.ක් (6.9.%) පමණක් විය. රැකියා විරහිත භාවය තරුණ කණ්ඩායමින් වාර්තා වූ අතර ඒ අය අධ්‍යාපන තත්ත්වයෙන් ද ලබා තිබුනේ අඩු මට්ටමකිනි. ගම තුල කෘෂි ක්ෂේත්‍රයේ රැකියා අවස්ථාවන්ට අමතරව වෙනත් රැකියා අවස්ථා ඉතා අඩු තත්ත්වයක පවතී. පෙදරේරු, වඩුවැඩ වැනි ක්ෂේත්‍රවල පුහුණු වී ඇති අය ගම තුල රැකියා අවස්ථා අඩුවීම හේතුවෙන් එවැනි රැකියා බහුල වෙනත් නගර කරා යාම දක්නට ඇත. කෘෂිකර්ම ක්ෂේත්‍රය රැකියා සැපයීම අතින් ප්‍රමුඛස්ථානය ගනී.

3.3 නියැදි ජනගහණයේ සමස්ත වාර්ෂික ආදායමින් ඉහළම ප්‍රතිශතයක් 20.6% ක් මෙම ප්‍රදේශයේ වවන කරාබු, ගම්මිරිස් වැනි අපනයන බෝගවලින් ලැබේ. රජයේ රැකියාවලින් ලැබෙන ආදායම මුලු ආදායමින් 18.1% ක් විය. වී සහ රබර්, තේ, පොල් වැනි වැවිලි බෝගවලින් ලබන ආදායම පිළිවෙලින් 4.0% ක් හා 5.4% ක අවම මට්ටමක පැවතුනි.

ආදායම් කාණ්ඩ අනුව පවුල් ඒකක වර්ග කිරීමේ දී සමස්ත ආදායමින් වැඩි ප්‍රමාණයක් ඉහළ ආදායම් කාණ්ඩය ලබා ගන්නා බවට විශ්ලේෂණය පෙන්වා දෙයි. එනම් නිවාස ඒකක 114 න් 53 ක්ම (46.5%) රු. 100000 කට වඩා ඉහළ වාර්ෂික ආදායමක් ලබන අතර එය රු. 102320 හා රු. 742200 පරාසයක පිහිටා තිබුනි. ඉතිරි නිවාස ඒකක 61 හි (53.5%) ආදායම් රු. 100000 ට වඩා අඩුව පැවති අතර ආදායම් පරාසය රු. 5640 හා 98070 ක පැවතුනි.

පවුල් ඒකකයක සාමාන්‍ය වාර්ෂික ආදායම රු. 133715 ක් විය. ඒ අනුව වාර්ෂික ඒකපු ද්ගල ආදායම රු. 341787 කි. ඉහළ ආදායම් ලාභී (100000 ට වැඩි) පවුල් ඒකකවල සාමාන්‍ය වාර්ෂික ආදායම රු. 232703 ක්ව පැවති අතර ඉතිරි නිවාස ඒකකවල සාමාන්‍ය වාර්ෂික ආදායම රු. 47710 ක මට්ටමක පැවතුනි.

ආදායම් පිළිබඳ සමස්ත විශ්ලේෂණය මගින් පෙන්නුම් කරන්නේ ගමේ සමස්ත වාර්ෂික ආදායමෙන් වැඩි කොටසක් ඉහළ ආදායම් ලබන කාණ්ඩ අතර ඒකරාශි වී ඇති බවයි. ඉහළ ආදායම් කාණ්ඩ දෙක මුලු නිවාස සංඛ්‍යාවෙන් 55.3% ක් නියෝජනය කරයි. නමුත් ඒ අතරම ඔවුන් වාර්ෂික ආදායමින් 86.5% ක් ම ලබා ගනී. අඩු ආදායම් කාණ්ඩ දෙක නිවාසවලින් 7.0% ක් නියෝජනය කරන අතර ඔවුන් ලබන්නේ මුලු වාර්ෂික ආදායමින් 0.6% ක් පමණි.

4. ඉඩම් අයිතිය හා භාවිතය.

4.1 වත්තේගෙදර භූමිය අධික බෑවුම් සහිතය. අධික බෑවුම් හේතුවෙන් ගොඩ ඉඩම් නිතර සෝදායෑමට ලක්
වේ. පස සංරක්ෂණ කටයුතු කර තිබුනේ ස්වල්ප ඉඩම් ප්‍රමාණයක පමණක් බැවින් සෝදා පාලුවට ලක්වීම දැඩිව පවතී. වත්තේගෙදර වසමට අයත් පොරෝමාරුව ජනපද කොටස අක්කර 1/2 බැගින් බෙදා දී තිබූ පැරණි ජනපද කොටසකි. එහි සමහර ජනපදිකයන්ට තවමත් තම ඉඩම්වලට නීත්‍යානුකූල ඔප්පු ද නොමැත.

4.2 වසම තුල කුඹුරු ඉඩම් ස්වල්පයක් (අක්කර 51) පමණක් පවතී. මෙම කුඹුරු බහුතරයක්ම අක්කර 1/4 ට වඩා කුඩා ඒවා විය. ගෙවත්ත හැර වෙනත් ගොඩ ඉඩම් අයිතිය තිබුනේ පවුල් 47 කට පමණි. ඉන් බහුතරයක්ම (34%) අක්කර 1/2 – 1 ප්‍රමාණයේ ඉඩම් විය. අක්කර 5 ට වඩා විශාල ඉඩම් තිබුනේ එක් අයෙකුට පමණි. නියැදියේ ගෙවත්තක සාමාන්‍ය ප්‍රමාණය අක්කර 0.67 ක් වූ අතර නියැදියට අයත වෙනත් ගොඩ ඉඩම්වල සාමාන්‍ය ප්‍රමාණය අක්කර 1.1 ක් විය.

4.3 කෘෂිකර්මාන්තය ගමේ බොහෝ දෙනෙකුගේ ජීවනෝපායයි. වී වගාව ඉතා සුලු වශයෙන් සිදු කරන පාරිභෝගික මට්ටමේ පවතින්නකි. ප්‍රධාන කෘෂිකාර්මික බෝගයන් වන්නේ ගෙවතු සහ ගොඩ ඉඩම්වල වගා කරනු ලබන කරාබු, ගම්මිරිස් වැනි අපනයන බෝගයන් ය. මීට අමතරව රබර් වගාව ද ව්‍යාප්ත වී ඇත. සුලු ඉඩම් ප්‍රමාණයක් තේ වගාව යටතේ ද පවතී. සෑම ගෙවත්තකම පොල් ද ස්වල්ප වශයෙන් වගා කර ඇති අතර ප්‍රධාන වශයෙන් ආදායම් ලබාගනු ලබන්නේ කරාබු, ගම්මිරිස් වැනි අපනයන බෝගයන්ගෙනි.

4.4 කෘෂිකර්මයේ දී නවීන තාක්ෂණ ක්‍රම උපදෙස් හා තාක්ෂණ සේවාවන් ලබාගැනීම සිදුවන්නේ ඉතා අවම මට්ටමෙනි.අදාල නිලධාරීගේ සේවය ලබාගනීමට බැහැර යාමට සිදු වීමත්, මාර්ග දුෂ්කරතා නිසාගම හුදකලා වී තිබීමත් මත එම සේවාවන් ගමට ලගා නොවීමත් මේ තත්ත්වයට හේතු විය හැක. ක්‍රමානුකූල සංවර්ධන ක්‍රියාදාමයක් තුලින් ගොඩඉඩම්වල සශ්‍රීක භාවය වැඩි කිරීමෙන් එම ඉඩම්වල වවන කරාබු, ගම්මිරිස්, පොල්. කෙසෙල් වැනි බෝගවලින් වැඩි ආදායමක් ලබාගැනීමේ හැකියාව පවතී.


සේවා පහසුකම් ලබාගැනීමේ දුෂ්කරතා නැතිකම අඩු තාක්ෂණය වැනි හේතු මත ලැබෙන කෘෂි බෝගවලින් ලබා ගන්නා අස්වනු ප්‍රමාණය අඩු තත්ත්වයක පවතී.


4.5 කෘෂි නිෂ්පාදන සඳහා අලෙවි පහසුකම් ගම තුල නොමැත. එබැවින් නිෂ්පාදන අලෙවියට නගරයට යාමට සිදුවන අතර නගරයට රැගෙන යාම සඳහා කාලය මෙන්ම මුදලක් වැය වෙන දෙයකි. ප්‍රවාහන අපහසුතාවයන් නිසාවෙන් මෙය තවත් දුෂ්කර කටයුත්තක් වේ.

5. ප්‍රජා සංවිධාන හා වෙනත්


5.1 ගමේ ක්‍රියාත්මක වන ප්‍රජා සංවිධාන කිහිපයකි. ග්‍රාම සංවර්ධන, මරණාධාර, සමෘද්ධි, තේ ශක්ති ඉන් ප්‍රධාන තැනක් ගනී. මරණාධාර සමිති 2 ක් ම ක්‍රියාත්මක වේ. සියලු සමිති අතරින් වඩාත් ක්‍රියාශීලී තත්වයක පවතින්නේ මරණාධාර සමිතිය පමණි. සමෘද්ධි සමිතිය සමෘද්ධි ප්‍රතිලාභීන්ගෙන් සමන්විත වූවකි. තේ ශක්ති සමිතිය තේ වගාවේ නියැලෙන්නන්ගෙන් පමණක් සමන්විත වූවකි.

5.2 හොඳ දේශගුණයක්, ජලය ඇතුලු ස්වභාවික සම්පත් ද අතින් සාරවත් ගමක් වූ වත්තේගෙදර පවතින්නේ සංවර්ධනය අතින් අඩු තත්ත්වයකිනි. විශේෂයෙන්ම මාර්ග පද්ධතියේ දුර්වලතා මත ගමත් - නගරයත් අතර වූ දුරස්ථ භාවය නිසා මේ තත්ත්වය උදා වී ඇත. රාජ්‍ය හෝ වෙනත් ආයතනවල සේවාවන් නිසි පරිදි ගමට නොලැබීම තුල ගම සංවර්ධනය අතින් පසුගාමී තත්ත්වයක පවතී.


කෑගල්ල දිස්ත්‍රික්කයේ පිහිටීම සහ
උප දිසාපති කොට්ඨාශ
උ
රඹුක්කන
කුරුණෑගල
දිස්ත්‍රික්කය
මහනුවර
දිස්ත්‍රික්කය
වරකාපොල
කෑගල්ල
අරණායක
ගම්පහ
දිස්ත්‍රික්කය
ගලිගමුව
කොළඹ
දිස්ත්‍රික්කය
බුලත්කොහු
පිටිය
රුවන්වැල්ල
යටියන්තොට
නුවරඑළිය දිස්ත්‍රික්කය
දෙහිඕවිට
දැරණියගල
රත්නපුර දිස්ත්‍රික්කය
පරිමාණය අඟල් 1 - කි.මී. 5


160
G.S. DIVISIONS IN ARANAYAKA
15 D
15 A
16
16 A
45 C
15 F
17 D
17
17 C
33 C
33 A
33 B
17 B
17 A
33
16 E
16 D
16 F
16G
46 A
46
45 D
45 C
47
47 E
45 B
45 A
45
220
47 B
47 C
44 A
44 C
48
45 E
42 C
42 A
47 A
47 D
47 F
43 B
42 B
42 E
48 B
42
43 A
43
41 A
41 B
58 B
43 F
43 D
41
41 E
58 F
58 G
58 C
210
MILE 1 1/2 0 1 2 3 MILES
S C A L E
160
PREPARED BY LAND USE PLANNING OFFICE, KEGALLE

අංක 16 ශ



21361